# රණවිරුවා

2025 ජූලි • 278 කලාපය







CLEAN SRI LANKA
SOCIALLY . ENVIRONMENTALLY . ETHICALLY

සූරු විරු අත් එක මිටක් වී

## සාර රටකට පාර පෙන්වයි



ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල.

# පාකිස්ථානු යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන යුද්ධ හමුදා මූලස්ථානයේ සංචාරයක










පාකිස්ථානු යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන ලුතිනන් ජෙනරාල් සයිඩ් ආමර් රාසා ප්‍රමුඛ දූත පිරිසක් ඉකුත් ජූලි මස 22 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ නිල සංචාරයක නිරත වූහ.

එහිදී, එතුමන් වෙත යුද්ධ හමුදා සම්ප්‍රදායානුකූලව භටපිරිස් වෙතින් හිමිවූයේ ගෞරවනීය පිළිගැනීමකි. ඉන් අනතුරුව, ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් එන්ඩීයූ පීඑස්සී අයිජී විසින් සංචාරයේ නිරත පාකිස්ථානු යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන ඇතුළු පිරිස පිළිගනිමින් ඔවුන් සමඟ සමූහ ඡායාරූපයකට පෙනීසිටියහ.

එසේම, දෙරටට බලපාන හමුදාමය කරුණු පිළිබඳ දෙදෙනා අතර සුහද සාකච්ඡාවක් ද පැවති අතර, මෙම සංචාරය සමාප්තියේ, දෙරටෙහි හමුදාවන් අතර පවතින අන්‍යෝන්‍ය සුහදත්වය සනිටුහන් කරමින් සමරු තිළිණ හුවමාරුවක් ද සිදුකෙරිණි.



# යුද්ධ හමුදාධිපති ගුවන් හමුදා මූලස්ථානයේ නිල සංචාරයක



යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් එන්ඩීයූ පීඑස්සී ඉකුත් ජූලි මස 04 වන දින ගුවන් හමුදා මූලස්ථානයේ නිල සංචාරයක නිරත වෙමින් ගුවන් හමුදාධිපති එයාර් මාර්ෂල් වීබී එදිරිසිංහ ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී (තෙවරක්), යූඑස්පී, එෆ්එන්ඩීයූ (චීනය), පීඑස්පී, කිව්එච්අයි හමුවිය.

මෙම හමුවේදී දෙපළ අතර, අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් වන කරුණු රැසක් පිළිබඳව සාකච්ඡා කෙරුණු අතර, මෙම අවස්ථාව සනිටුහන් කරමින් හමුදාධිපතිවරු දෙදෙනා අතර සමරු ඵලක හුවමාරුවක් ද සිදුවිය. මෙම අවස්ථාවට ගුවන් හමුදා මාණ්ඩලික ප්‍රධාන, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන සහ ගුවන් හමුදා කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් ද සහභාගි වූහ.



# යුද්ධ හමුදාධිපති නාවික හමුදා මූලස්ථානයේ නිල සංචාරයක



යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් එන්ඩීයූ පීඑස්සී ඉකුත් ජූලි මස 08 වන දින නාවික හමුදා මූලස්ථානයේ නිල සංචාරයක නිරත වෙමින්, නාවික හමුදාධිපති වයිස් අද්මිරාල් කාන්චන බානගොඩ ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවිය.

නාවික හමුදා මූලස්ථානයේදී එම හටපිරිස් විසින් යුද්ධ හමුදාධිපතිතුමන් ඉමහත් ගෞරවයෙන් පිළිගන්නා ලදී. අනතුරුව හමුදාධිපතිවරු දෙදෙනා අතර පැවති සුහද හමුවේදී, මෙහෙයුම් සහයෝගීතාව සහ ද්විපාර්ශ්වීය වශයෙන් වැදගත් කරුණු රැසක් පිළිබඳව සාකච්ඡා කෙරුණු අතර, ජාතික ආරක්ෂාව තහවුරු කිරීමේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සහ නාවික හමුදාවේ තීරණාත්මක දායකත්වය සම්බන්ධයෙන් ද අවධානය යොමුකෙරිණි.







# යුද්ධ හමුදාධිපති, නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථානයෙහි සංචාරයක











යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් එන්ඩීයූ පීඑස්සී ඉකුත් ජූලි මස 19 සහ 20 දෙදින තුළ නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථානයෙහි සංචාරයක නිරත විය. එහි ආඥාපති මේජර් ජෙනරාල් පීකේඩබ්ලිව්ඩබ්ලිව්එම්ජේඑස්බීඩබ්ලිව් පල්ලෙකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ ගෞරවනීය ඇරයුමෙන් එහි සපැමිණි යුද්ධ හමුදාධිපති 22, 23 සහ 24 වන පාබල සේනාංකයන්හි සේනාංකාධිපතිවරු සේම 7 සන්නද්ධ බුද්ධි බලකාය සහ 3 (ස්වේච්ඡා) සන්නද්ධ බුද්ධි බලකායේ අණදෙන නිලධාරීන් ද හමුවී ප්‍රදේශයේ රාජකාරී ස්වභාවය පිළිබඳ සොයාබැලූහ.

ඉන් අනතුරුව, 232 වන පාබල බලසේනාවේ ද තොප්පිගල ප්‍රදේශයේ ද සංචාරයක නිරත වූ යුද්ධ හමුදාධිපති එහි රණවිරු ස්මාරකය අභියසදී දිවංගත රණවිරුවන් වෙනුවෙන් පුෂ්පෝපහාර පුදකරන්නට ද කටයුතු කළේය.

මෙම සංචාරයේදී, 7 බළඇණිය ගැමුණු හේවා බලකායේ මූලිකත්වයෙන් අවශ්‍යතා සහිත පවුලක් වෙනුවෙන් ඉදිකර පවරාදුන් නව නිවසක් ද යුද්ධ හමුදාධිපති විසින් නිරීක්ෂණය කරන ලදී. එසේම, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පිහිටි ඓතිහාසික ආගමික ස්ථානයක් වන දිඹුලාගල ආරණ්‍ය සේනාසනයේ ද සංචාරයක නිරත වූ හෙතෙම දිඹුලාගල ආරණ්‍ය සේනාසනයේ විහාරාධිපති අතිපූජ්‍ය දිඹුලාගල රාහුලාලංකාර නායක හිමිපාණන් ද නැගෙනහිර පළාත් ආණ්ඩුකාර මහාචාර්ය ජයන්ත ලාල් රත්නසේකර සහ ත්‍රිකුණාමලය රදගුරු පදවියේ රදගුරු අතිඋතුම් ක්‍රිස්ටියන් නොයෙල් එමානුවෙල් හිමිපාණන් ද හමුවූහ. සංචාරයේ සමාප්තිය සනිටුහන් කරමින්, යුද්ධ හමුදාධිපති ත්‍රිකුණාමලය, 22 වන පාබල සේනාංක මූලස්ථානය සහ 2 (ස්වේච්ඡා) බළඇණිය ගජබා රෙජිමේන්තුවේ ද සංචාරය කළේය.



# ‘Finger Swift 2025’

## නව පරිගණක මෘදුකාංග එළිදැක්වේ

තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සංවිධානය කරනු ලැබූ ‘Finger Swift 2025’ නව පරිගණක මෘදුකාංග යෙදවුම් එළිදැක්වීම ඉකුත් ජූලි මස 16 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව් ආර්එස්පී සීටීඑෆ් එන්ඩීයූ පීඑස්සී අයිජී ගේ ප්‍රධානත්වයෙන් යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයේදී පැවැත්විණි.





නවීකරණය වන තාක්ෂණික ලෝකය තුළ යුද්ධ හමුදාවේ දෛනික කාර්යන් පහසු කිරීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම පරිගණක යෙදවුම නවතමයෙන් නිර්මාණය කරන ලදී. මෙහිදී, සලාක ඉල්ලුම් කිරීමේ කළමනාකරණ පරිගණක යෙදවුම, වාර්ෂික රහස්‍ය වාර්තා කළමනාකරණ පරිගණක යෙදවුම සහ පදක්කම් ප්‍රදාන තොරතුරු කළමනාකරණ පරිගණක යෙදවුම ප්‍රථමයෙන් යුද්ධ හමුදාධිපති විසින් එළිදැක්වීමෙන් පසු එම යෙදවුම් පිළිබඳ හැඳින්වීමේ වීඩියෝපටයක් ද ප්‍රදර්ශනය කෙරිණ. අනතුරුව, 12 රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය වෙතින් සයිබර් ක්ෂේත්‍රය තුළ ඇති විය හැකි තර්ජන පිළිබඳ හැඳින්වෙන සයිබර් ආරක්ෂණ නිරූපණයක් ද සිදුකරන ලදී.





යුද සේවා ලේකම් ශාඛාවේ මෙන්ම පිරිස් පරිපාලන හා ආධුනිකයන් බඳවාගැනීමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ සැපයුම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු පහසු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් නිර්මාණය කරන ලද මෙම නව පරිගණක යෙදවුම් යුද්ධ හමුදාධිපතිතුමන් විසින් එම අධ්‍යක්ෂ මණ්ඩලවල අධ්‍යක්ෂවරුන් වෙත ඉදිරියේදී භාවිතයට ගැනීම සඳහා නිල වශයෙන් පවරාදීම ද සිදුකරන ලදී. අනතුරුව, නව යෙදවුම නිර්මාණය කිරීම සඳහා කැපවූ තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් වෙත සහතිකපත් ප්‍රදානය කිරීමට ද යුද්ධ හමුදාධිපති කටයුතු කළේය. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් ඩීකේඑස්කේ දොලගේ යූඑස්පී එන්ඩීඑස් පීඑස්සී, ප්‍රධාන සංඥා නිලධාරි සහ ශ්‍රී ලංකා සංඥා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ජීඑල්එස්ඩබ්ලිව් ලියනගේ යූඑස්පී එන්ඩීඑස් පීඑස්සී, තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් එස්ජේකේඩී ජයවර්ධන යූඑස්පී එන්ඩීඑස් පීඑස්සී ඇතුළු පිරිසක් ද සහභාගි වූහ.



# දළඳා පෙරහැර වෙනුවෙන් යුද්ධ හමුදාවේ "කොප්පරා" පූජාව මෙවරත්

ඉපැරණි සම්ප්‍රදායන් අනුව මහනුවර ශ්‍රී දළඳා මාලිගාව මඟින් වාර්ෂිකව පවත්වන ඓතිහාසික ඇසළ මහ පෙරහැර මංගල්‍යය ආලෝකමත් කිරීම සඳහා යුද්ධ හමුදාව වෙතින් කොප්පරා පූජා කිරීම ඉකුත් ජූලි මස 17 වන දින සිදුකෙරිණ.

විජයබාහු පාබල රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එන්එච් බණ්ඩාරනායක යූඑස්පී ගේ ඇරයුමෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් එන්ඩීයූ පීඑස්සී, මෙම අවස්ථාවට ප්‍රධානත්වය දැරීය. විජයබාහු පාබල රෙජිමේන්තුවේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක කරන ලද මෙම "කොප්පරා පූජාව" මඟින් ශ්‍රී ලංකාවේ ආගමික හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා යුද්ධ හමුදාවේ කැපවීම ඉස්මතු කරනු ලබයි.




යුද්ධ හමුදාව විසින් අඛණ්ඩව 12 වන වරටත් පවත්වන ලද මෙම කොප්පරා පූජාව මඟින් කොප්පරා ටොන් 06ක ප්‍රමාණයක් දළඳා මාලිගාව වෙත පූජාකරනු ලැබීය. බෞද්ධ කොඩි සහ නෙළුම් මල් වට්ටි රැගත් යුද්ධ හමුදා භටපිරිස්හි සහභාගීත්වයෙන් අලංකාරවත් වූ පෙරහැරකින් එම "කොප්පරා" තොගය මාලිගාවේ අභ්‍යන්තර කුටියේදී චාරිත්‍රානුකූලව භාරදීම සිදුකෙරිණ. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා නිලධාරිහු සහ සෙසු නිලයන් රැසක් සහභාගි වූහ.





44 වසරක ඉතිහාසය වර්තමානයට ගෙනා "අවසන් සෙබළා" කෘතිය එළිදකී

# "අවසන් සටනේ අවසන් සෙබළා" එළිදකී




යුද්ධ හමුදා ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ "රණවිරුවා" සඟරාවෙහි සංස්කාරක වන ලුතිනන් කර්නල් සුජිත් චමින්ද විසින් රචිත "අවසන් සටනේ මියගිය අවසන් සෙබළා" ග්‍රන්ථය එළිදැක්වීමේ උත්සවය ඉකුත් ජූලි මස 08 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. මෙම අවස්ථාවට මාණ්ඩලික ප්‍රධාන, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන, ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක ඇතුළු ජ්‍යෙෂ්ඨ කණිෂ්ඨ නිලධාරීන්, සෙසුනිලයින් ඇතුළු 300 කට වැඩි පිරිසක් සහභාගී වූහ. මෙහි විශේෂත්වය වූයේ ග්‍රන්ථයේ කතාවට අදාළ දැනට සේවයේ නිරත, විශ්‍රාමික හමුදා සාමාජිකයින් ද සිවිල් පුද්ගලයින් රැසක් ද ඊට එක්ව සිටීමය.

නව ග්‍රන්ථයේ මංගල පිටපත යුද්ධ හමුදාධිපතිතුමන් වෙත හා තෝරාගත් සෙසු ආරාධිතයින් වෙත පිළිගන්වන ලදී. "අවසන් සටනේ මියගිය අවසන් සෙබළා" ග්‍රන්ථය කතුවරයාගේ අටවන සාහිත්‍යය කෘතියයි.











# ශ්‍රී ලංකාවේ ප්‍රංශ තානාපති යුද්ධ හමුදාධිපති හමුවෙයි

ශ්‍රී ලංකාවේ ප්‍රංශ තානාපති Mr. Rémi Lambert සහ නවදිල්ලියේ ආරක්ෂක උපදේශක Colonel Emmanuel PELTRIAUX යන නිලධාරිහු ඉකුත් ජූලි මස 30 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් එන්ඩීයූ පීඑස්සී අයිජී හමුවූහ.

# උසස්වීම් ලද නිලධාරී වෙත යුද්ධ හමුදාධිපතිගෙන් පැසසුම්

මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලද ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකායේ මේජර් ජෙනරාල් ඒඑම්ආර් අබේසිංහ එන්ඩීසී ඉකුත් ජූලි මස 08 වන දින යුද්ධ හමුදාධිපති කාර්යාලයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් එන්ඩීයූ පීඑස්සී අයිජී හමුවිය. එහිදී, යුද්ධ හමුදාධිපති විසින් එම ජ්‍යෙෂ්ඨ නිලධාරි වෙත සංකේතාත්මකව මේජර් ජෙනරාල් නිලයට හිමි අසිපත පිරිනමමින් සිය සුබපැතුම් එක්කළේය.





# යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන සුහද හමුවක

ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ සහකාර ආරක්ෂක උපදේශක ලුතිනන් කර්නල් මන්දීප් සිං නේගි එස්එම් ඉකුත් ජූලි මස 17 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් ඩීකේඑස්කේ දොලගේ යූඑස්පී එන්පීඑස් පීඑස්සී හමුවිය. මාණ්ඩලික ප්‍රධාන කාර්යාලයේදී සිදුවූ මෙම හමුවේදී දෙරට අතර හමුදාමය වශයෙන් වැදගත් කරුණු රැසක් පිළිබඳව සාකච්ඡා කෙරිණ.

# නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන නිල සංචාරයක

යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් වයිඑච්බීඑම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ඉකුත් ජූලි මස 28 වන දින කොළඹ 07 පිහිටි ග්‍රෑන්ඩ් මේට්ලන්ඩ් බහුකාර්ය පහසුකම් සංකීර්ණයේ සංචාරයක නිරතවිය. එහිදී, බහුකාර්ය පහසුකම් සංකීර්ණයේ කළමණාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡාවක් පවත්වමින් එම පරිශ්‍රයේ පවතින පහසුකම්, සේවා සැපයීම සහ පරිපාලන කාර්යයන් පිළිබඳව සොයාබැලීය.

පසුව, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන එම පරිශ්‍රයේ පිහිටි මුළුතැන්ගෙය, ගබඩා ඒකක, කාර්ය මණ්ඩල නවාතැන් පහසුකම් සහ අනෙකුත් පහසුකම් ලබාදෙන සියලුම ස්ථාන නිරීක්ෂණය කරන ලදී. සනීපාරක්ෂක ප්‍රමිතීන් පවත්වාගැනීම, සියලුම අමුත්තන් වෙනුවෙන් උපරිම ආරක්ෂාව සහ සුවපහසුව සහතික කිරීමේ වැදගත්කම පිළිබඳව ද හෙතෙම එහිදී අවධාරණය කළේය.



# මිත්‍ර ශක්ති XI අවසන් සැලසුම් නිරීක්ෂණය






මිත්‍ර ශක්ති xi අභ්‍යාසයේ අවසන් සැලසුම් සමුළුව 2025 ජූලි මස 30 වන දින සිට අගෝස්තු මස 02 දින දක්වා ඉන්දියාවේ, කර්ණාටක ප්‍රාන්තයේ, බෙලගාවි ප්‍රදේශයේදී පැවැත්විණි. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ පාබල අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ඩීඑස් ජයවර්ධන ආර්එස්පී එන්ඩීසී සමඟින් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් තිදෙනකු මෙම සමුළුව සඳහා සහභාගි වෙමින් පුහුණු ප්‍රදේශවල ක්ෂේත්‍ර සංචාරයක් සිදුකළ අතර ඉදිරි අභ්‍යාසයන් සිදුකරනු ලබන ආකාරය පිළිබඳව ඉන්දීය හමුදා නිලධාරීන් සමඟ සැලසුම් සිදුකරනු ලැබූහ. මෙම අභ්‍යාසය ඉන්දියානු - ශ්‍රී ලංකා ආරක්ෂක සහයෝගීතාවයේ ප්‍රධාන අංගයක් ලෙස සැලකෙන අතර, ත්‍රස්ත විරෝධී ක්‍රියාන්විත සහ සාමසාධක මෙහෙයුම්වලදී ඒකාබද්ධ හමුදා ක්‍රියාන්විතයන් තවදුරටත් වැඩිදියුණු කිරීම මෙම අභ්‍යාසයන් පැවැත්වීමේ අපේක්ෂාව වේ. බාධාවකින් තොරව සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම සහ සාර්ථකව මෙම අභ්‍යාසය සිදුකිරීම සහතික කිරීම වෙනුවෙන් මෙහිදී පුළුල් සාකච්ඡාවන් පැවැත්විණ.

## දෙදින වැඩමුළුවක්





"අභ්‍යන්තර ආරක්ෂක මෙහෙයුම්වලදී යුද්ධ හමුදාවේ කාර්යභාරය" යන තේමාව ඔස්සේ මධ්‍යම ආරක්ෂක සේනා මූලස්ථානය වෙතින් සංවිධානය කළ දෙදින වැඩමුළුවක් ඉකුත් ජූලි මස 02 වන දින එම මූලස්ථාන පරිශ්‍රයේදී පැවැත්විණ. නීති සේවා මානව හිමිකම් සහ මානුෂීය නීති අධ්‍යක්ෂ මණ්ඩලයේ මඟපෙන්වීම මත ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සමඟ සහයෝගයෙන් යුතුව සංවිධානය කරනු ලැබූ මෙම වැඩසටහන තුළින් නීතිය ක්‍රියාත්මක කිරීමේදී නිලධාරීන් සතු තීරණ ගැනීමේ හැකියාවන් වැඩිදියුණු කිරීම, නීතිය බලාත්මක කිරීමේදී යුද්ධ හමුදාවේ කාර්යභාරය, ගිනි අවි, අත්අඩංගුවට ගැනීම සහ රඳවා තබාගැනීම වැනි කරුණු පිළිබඳව මෙහිදී දැනුවත් කෙරිණි. දකුණු ආසියානු සන්නද්ධ හමුදාවන්හි කලාපීය නියෝජිත බ්‍රිගේඩියර් ජෙනරාල් (විශ්‍රාමික) ලොයිඩ් ගිලට් OBE සහ දකුණු ආසියානු සන්නද්ධ හමුදාවන්හි ශ්‍රී ලංකා සන්නද්ධ හා ආරක්ෂක වැඩසටහන් උපදේශක චන්න ජයවර්ධන යන මහත්වරු එම දේශන මෙහෙයවූහ.

## විශේෂ පාබල ක්‍රියාන්විත පුහුණු පාඨමාලාව අංක - 77



"විශේෂ පාබල ක්‍රියාන්විත පුහුණු පාඨමාලාව - 77" විසිරයාමේ පෙළපාලිය ඉකුත් ජූනි මස 28 වන දින මාදුරුඔය, යුද්ධ හමුදා පුහුණු පාසලේදී පැවැත්විණි. එම දුෂ්කර පාඨමාලාව ඉකුත් මැයි මස 02 වන දින සිට ජූනි මස 28 වන දින දක්වා දින 57ක් පුරාවට පවත්වන ලද අතර, ඒ සඳහා නිලධාරීහු 23 දෙනෙක් සහ සෙසුනිලයන් 164 දෙනෙක් සහභාගී වූහ. විසිරයාමේ පෙළපාලියේ ප්‍රධාන ආරාධිතයා ලෙස ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික නිලධාරී බ්‍රිගේඩියර් එස්ජ්යූජ් සෝලංගආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී සහභාගි විය.







# 'Arrow Head Challenge 2025 - Combat Readiness'



53 වන පාබල සේනාංකය (අතිරේක ප්‍රහාරක සේනාංකය) යටතේ ස්ථාපිත සියලුම ඒකකයන්හි විශේෂ පුහුණුව ලත් කණ්ඩායම්වල සහභාගිවත්වයෙන් සංවිධානය කෙරුණු 'Arrow Head Challenge 2025 - Combat Readiness' තරඟය 2025 ජූලි මස 14 වන දින සිට 2025 ජූලි මස 18 වන දින දක්වා හබරණ ප්‍රදේශයේදී පැවැත්විණ. 1 බලකාය සහ 53 වන පාබල සේනාංකයේ මඟපෙන්වීම මත එම භටපිරිස්හි ක්‍රියාන්විත කාර්යක්ෂමතාව සහ නායකත්ව ගුණාංග වැඩිදියුණු කිරීමේ අරමුණින් මෙම තරඟය පැවැත්විණ.

ක්‍රියාන්විත සැලසුම් කිරීම, නායකත්ව ගුණාංග වැඩිදියුණු කිරීම සහ සංග්‍රාමික පුහුණු පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු සැසියකින් අනතුරුව, බළඇණි මට්ටමින් පවත්වන ලද ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ, වාර්ෂික වෙඩි තැබීමේ වාර්තා සහ සංග්‍රාමික සූදානම් වාර්තා පරීක්ෂා කිරීමෙන් මේ සඳහා පුද්ගලයින් තෝරාගැනිණ. මෙම 'Arrow Head Challenge 2025' තරඟය හබරණ ප්‍රදේශයේ පිහිටි ඝන වනාන්තර භූමිය හරහා කිලෝමීටර් 12කට අධික දුරක් ආවරණය කරමින් පැවති අතර, එහිදී පාබල හමුදා භටපිරිස්හි දරාගැනීමේ හැකියාව, උපායශීලී බව සහ කණ්ඩායම් ක්‍රියාකාරිත්වය පරීක්ෂා කෙරිණි. තරඟයේ දෙවන දිනයේදී භටපිරිස් විසින් මුර සංචාර, රැකසිට පහරදීම, ලුහුබැඳීම, ක්ෂණික ක්‍රියා සරඹ සහ හෙලිකොප්ටර් ගොඩබෑමේ ස්ථාන නිර්මාණය කිරීම සහ එම ස්ථාන සුරක්ෂිත කිරීම වැනි ක්‍රියාකාරකම්වල නිරත වෙමින් තම දක්ෂතාවන් ඉදිරිපත් කළහ. තවද, මේ සඳහා සහභාගි වූ 8 දෙනකුගෙන් යුත් කණ්ඩායම් අධික උෂ්ණත්වයක් සහිත රළු භූමියක කිලෝමීටර් 20 ක දුර ප්‍රමාණයක් තුවාලකරුවන් ඉවත්කිරීමේ කටයුතුවල නිරතවූහ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුහුණු ඉතිහාසය තුළ තනි කණ්ඩායමක් විසින් සිදුකරන ලද දීර්ඝතම තුවාලකරුවන් ඉවත් කිරීමේ අවස්ථාව ලෙස මෙය ඉතිහාසගත වනු ඇත. ඉන් අනතුරුව, එම කණ්ඩායම් පාබල පුහුණු මධ්‍යස්ථාන ක්ෂේත්‍ර වෙඩිපිටියේදී FSMO සජීවී සටන් වෙඩිතැබීමේ අභ්‍යාසයක ද නිරත වූහ. 'Arrow Head Challenge 2025 - Combat Readiness' තරඟයේ සම්මාන ප්‍රදානෝත්සවය 2025 ජූලි මස 17 වන දින පැවැති අතර, මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස 1 බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්පීඑම් විජේසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහභාගි විය.

# මානසික සෞඛ්‍යය සහ තෘප්තිමත් ජීවිතයක් පිළිබඳ දේශනයක්





ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව විසින් සංවිධානය කළ සංවිධානය කළ මානසික සෞඛ්‍යය සහ තෘප්තිමත් ජීවිතයක් පිළිබඳ දැනුම්වත් කිරීමේ දේශනයක් ඉකුත් ජූලි මස 03 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේදී පැවැත්විණ. මෙම දේශනය යුද්ධ හමුදා නිවාරණ වෛද්‍ය හා මානසික සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ සහ උපදේශක මනෝචිකිත්සක බ්‍රිගේඩියර් (වෛද්‍ය) ආර්එම්එම් මොනරාගල යූඑස්පී සහ යුද්ධ හමුදා මානසික සෞඛ්‍ය ඒකකයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගෙන් යුතු කණ්ඩායමක් විසින් මෙහෙයවන ලදී. එහිදී, මානසික සෞඛ්‍යය සහ හමුදා සෙබළෙකු ලෙස තෘප්තිමත් සහ සාර්ථක ජීවිතයක් ගොඩනගා ගන්නේ කෙසේද යන්න පිළිබඳව දැනුම්වත් කෙරිණ.

# නීති විරෝධී පිරමිඩ ආයෝජන ක්‍රම පිළිබඳ යුද්ධ හමුදා සාමාජිකයන් දැනුවත් කෙරේ





යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා විනයාරක්ෂාධිපතිගේ අධීක්ෂණය මත නීති විරෝධී පිරමිඩ ආයෝජන ක්‍රම පිළිබඳ දැනුවත් කිරීමේ දේශනයක් 2025 ජූලි මස 24 දින යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයේදී පැවැත්විණි. මෙම වැඩසටහන පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය මත විනයාරක්ෂක අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සංවිධානය කරනු ලැබීය.

මෙම දේශනය, ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජිත පිරිසක් වන මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂිකා අජානි ලියනපටබැඳි මහත්මිය, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ චතුර ආරියදාස මහතා, මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ යමිත්‍ර රණවීර මහතා සහ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ ගිම්හාන් මොහොට්ටි මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මෙම අවස්ථාව සඳහා 1 බලකාය, ආරක්ෂක සේනා මූලස්ථාන, සේනාංක සහ බලසේනා, සියලුම රෙජිමේන්තු මූලස්ථාන සහ යුද්ධ හමුදා, රෙජිමේන්තු පුහුණු පාසල් ඇතුළුව සියලුම ශ්‍රී ලංකා යුද්ධ හමුදා ආයතන නියෝජනය කරමින් නිලධාරින් 382 ක් සහභාගි වූහ.

# 16 වන ශ්‍රී ලංකා හමුදා ආරක්ෂක භට කණ්ඩායමෙ ඒකාබද්ධ පුහුණු අභ්‍යාසයක







16 වන ශ්‍රී ලංකා හමුදා ආරක්ෂක භට කණ්ඩායම විසින් ඉකුත් ජූලි මස 04 වන දින ලෙබනනයේ එක්සත් ජාතීන්ගේ අතුරු බලකාය යටතේ සාම සාධක රාජකාරී නිල වශයෙන් භාරගන්නා ලදී. 16 ශ්‍රී ලංකා හමුදා ආරක්ෂක භට කණ්ඩායම ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරීන් 11 දෙනකු සහ සෙසුනිලයන් 114 දෙනකු ඇතුළුව යුද්ධ හමුදා සාමාජිකයන් 125 දෙනකුගෙන් සමන්විත වූ අතර, එම කණ්ඩායමේ අණදෙන නිලධාරි ලෙස ලුතිනන් කර්නල් වයිඑස්එච්එන්පී සිල්වා යූඑස්පී පීඑස්සී සහ දෙවන අණදෙන නිලධාරි ලෙස ලුතිනන් කර්නල් බීඑම්ජ්අයියූ ඔබයසේන යූඑස්පී පීඑස්සී කටයුතු කරනු ලබති.

මෙම කණ්ඩායමට මත්ද්‍රව්‍ය, පුපුරණ ද්‍රව්‍ය සහ බිම්බෝම්බ හඳුනාගැනීම සඳහා විශේෂ පුහුණුව ලත් සුනඛයින් සිව්දෙනකු ද ඇතුළත් වන අතර, එම සුනඛයින් ඉදිරි මෙහෙයුම් සඳහා යොදාගැනීමට නියමිතය. ඒ අනුව ප්‍රධාන වශයෙන් 16 ශ්‍රී ලංකා හමුදා ආරක්ෂක භට කණ්ඩායම විසින් නකෞරා හි එක්සත් ජාතීන්ගේ අතුරු බලකා මූලස්ථානයට ආරක්ෂාව සැපයීම සහ අවශ්‍ය පරිදි ප්‍රභූවරුන්ගේ ආරක්ෂාව සහතික කිරීම සිදුකරනු ලබයි.










16 වන ශ්‍රී ලංකා හමුදා ආරක්ෂක භට කණ්ඩායම ලෙබනනයේ එක්සත් ජාතීන්ගේ අතුරු බලකාය යටතේ සාමසාධක රාජකාරි භාරගැනීමෙන් අනතුරුව ඉකුත් ජූලි මස 16 සහ 17 දෙදින තුළ මුර සංචාර, තුවාලකරුවන් ඉවත් කිරීමේ අභ්‍යාස සහ සංචරණ අභ්‍යාසයන්හි නිරතවිය. ඒ අනුව, ඉන්දුනීසියානු හමුදා ආරක්ෂක භට කණ්ඩායම සහ මැලේසියානු බළඇණිය සමඟ ඒකාබද්ධව වැඩිදියුණු කළ පුපුරණ ද්‍රව්‍ය භාවිතය, සැඟවීම සහ තුවාලකරුවන් ඉවත් කිරීමේ කටයුතු ඔවුන් විසින් සිදුකරන ලදී. නිලධාරින් දෙදෙනෙක් සහ සෙසුනිලයන් 16 දෙනකුගෙන් සමන්විත ශ්‍රී ලංකා සාමසාධක කණ්ඩායම සන්නද්ධ පිරිස් ප්‍රවාහන රථ දෙකක් ද සමඟින් මෙම අභ්‍යාසයට සහභාගි වූහ.

# ගිනි නිවීම සඳහා සහය දක්වමින්





ඉකුත් ජූලි මස 03 වන දින කුරුණෑගල, වෙහෙර සම්පත් ස්ටිකර් වාහන අලංකරණය කිරීමේ පෞද්ගලික සමාගමේ ගබඩාවේ විදුලි කාන්දුවක් හේතුවෙන් ඇතිවූ ගින්නක් මැඩපැවැත්වීමට ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සහ 9 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ භටපිරිසක් දායකත්වය ලබාදුන්හ. එහිදී, ගින්න ඇති වූ වහාම, සිද්ධිය නැරඹීම සඳහා විශාල පිරිසක් එම ස්ථානය වටා රැස් වූ අතර, තත්වය පාලනය කිරීමට සහ මහජනතාවට සිදුවිය හැකි අනතුරක් වළක්වා ගැනීම සඳහා ඔවුහු කටයුතු කරනු ලැබූහ.

---

# ලැව්ගිනි මැඩ පැවැත්වීමට යුද්ධ හමුදා සහය





බලංගොඩ, කෝන්ගහවෙල ප්‍රදේශයේ ඇති වූ ලැව්ගින්නක් පිළිබඳ දැනුවත් වීමෙන් අනතුරුව කඩිනමින් ක්‍රියාත්මක වූ 18 බළඇණිය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ භටපිරිස් වහා එම ස්ථානය වෙත ගොස් අදාළ ගින්න මැඩපැවැත්වීමට කටයුතු කරනු ලැබූහ. ඔවුන්ගේ මැදිහත්වීම නිසාම අවට පිහිටි වනාන්තර ප්‍රදේශ, ගොවිබිම් සහ නේවාසික ප්‍රදේශවලට ගින්න පැතිරීම වළක්වාගැනීමට හැකියාව ලැබිණි.

---



# ගින්නක් මැඩ පවත්වමින්

ඉකුත් ජූලි 19 වන දින කුරුණෑගල, පොතුහැර ප්‍රදේශයේ වඩකඩ මුස්ලිම් පල්ලිය අසල කුඩා ප්ලාස්ටික් කර්මාන්ත ශාලාවක ගින්නක් ඇති විය. එහිදී, 9 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ භටපිරිස් වහා ක්‍රියාත්මකව කුරුණෑගල මහ නගර සභා ගිනි නිවන හමුදාව සමඟ එක්ව එම ගින්න මැඩපැවැත්වීමට කටයුතු කළහ.

# 74 වන උපසම්පදා උත්සවයේ සංවිධාන කටයුතු සොයා බැලේ

ගල්නෑව, විදෙයා්දාරා විහාරස්ථානයේ දී ඉකුත් ජුනි මස 30 වන දින සිට ජූලි මස 06 වන දින දක්වා පැවති ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ 74 වන උපසම්පදා උත්සවය සඳහා වූ සූදානම පරීක්ෂා කිරීම සඳහා වන්නි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් කේඑම්පීඑස්බී කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් ජුනි මස මස 24 වන දින නිරීක්ෂණ සංචාරයක නිරතවිය.

වාලුකාරාම විහාරස්ථානය, විජිතපුර ශ්‍රී පුණ්‍යවර්ධනාරාම විහාරස්ථානය සහ විදෙයා්දාර පිරිවෙන ඇතුළු ප්‍රධාන ආගමික ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සිය සහයෝගය ලබා දෙනු ලබන අතර, භික්ෂූන් වහන්සේලා සහ බැතිමතුන් වෙනුවෙන් ආහාර සැපයීම සඳහා අවශ්‍ය පැරබෝලික් කුටි, මූලික සැපයුම්, මුළුතැන්ගෙයි උපකරණ සහ මූලික පහසුකම් ද සපයනු ලබයි. මෙම සංචාරය අතරතුර වන්නි ආඥාපති විසින් ගල්නෑව මහවැලි ක්‍රීඩාංගණය වැනි ප්‍රධාන ස්ථානවල ඉදිකිරීම්වල ප්‍රගතිය ද සොයාබැලීය.




# දු දරුවන්ගේ ඉගෙනුමට අත්වැලක්




213 වන පාබල බලසේනා මුලස්ථානයේ බලසේනාධිපති බ්‍රිගේඩියර් පීඑම් ද සිල්වා ආර්එස්පී යූඑස්පී ගේ මඟපෙන්වීම මත ඉකුත් ජූනි මස 30 වන දින, "සහෝදරත්වයේ මනුදම" සංවිධානයේ සමාජිකයින්ගේ දායකත්වයෙන් චෙඩ්ඩිකුලම් ක්‍රිස්තුවකුලම් රජයේ මිශ්‍ර දෙමළ විද්‍යාලයේදී පාසල් උපකරණ හා පුස්තකාල පොත් බෙදාදීමේ වැඩසටහනක් පැවැත්විණ.

# 16 වන සංවත්සරයට සමගාමීව දරු දැරියන්ට සත්කාරයක්




"කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක 72"හි 16 වන සංවත්සරයට සමගාමීව කඩවත ශ්‍රී විමලවංශ ළමා නිවාසයේ නේවාසික දරු දැරියන් සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය පිරිනැමීමේ සහ ළමා නිවාසය අවට පිරිසිදු කරමින් එම නිවාසයෙහි තීන්ත ආලේප කිරිමේ වැඩසටහනක් ඉකුත් ජූලි මස 05 වන දින සිදුකෙරිණ. මෙම අවස්ථාව සඳහා එම කෙඩෙට් නිලධාරී පාඨමාලාවට අයත් නිලධාරීහු විශාල පිරිසක් සහභාගී වූහ.

# සේවයේ නිරත යුද්ධ හමුදා සාමාජිකයින්ගේ අවශ්‍යතා සොයාබැලේ

සේවයේ නිරත යුද්ධ හමුදා සාමාජිකයන්ගේ අවශ්‍යතාවන් සහ ඔවුන්ගේ ගැටලු සඳහා විසඳුම් ලබාදීමේ අරමුණින් ඉකුත් ජූලි මස 09 වන දින ගජබා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සුභසාධන වැඩසටහනක් දියත් කෙරිණ.

ගජබා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් යූකේඩීඩීපී උඩුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ආරාධනයෙන් මෙම අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් එන්ඩීයූ පීඑස්සී අයිජී සහභාගි විය.





රණවිරු සේවා හා පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්බන්ධීකරණය මත ක්‍රියාත්මක කෙරුණු මෙම වැඩසටහනේදී යුද්ධ හමුදා මූලස්ථානයේ අධ්‍යක්ෂ මණ්ඩල සහ ශාඛා නියෝජනය කරමින් සහභාගි වූවන් විසින් මෙම අවස්ථාවේදී ඉදිරිපත් කළ ගැටලු සඳහා අවශ්‍ය විසඳුම් ලබාදෙනු ලැබූහ. එහිදී, හටපිරිස් ආමන්ත්‍රණය කළ යුද්ධ හමුදාධිපති සේවයේ නියුතු සහ විශ්‍රාමික යුද්ධ හමුදා සාමාජිකයන් මෙන්ම දිවංගත රණවිරුවන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ සුභසාධන කටයුතු වෙනුවෙන් යුද්ධ හමුදාවේ අඛණ්ඩ කැපවීම පිළිබඳව අවධාරණය කළේය.





## වන්නි හටපිරිස් සඳහා වෛද්‍ය කඳවුරක්





යුද්ධ හමුදා සුවසහන අරමුදලේ සම්බන්ධීකරණයෙන් ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) යටතේ සේවයේ නියුතු සෙබළුන් සඳහා අබිෂා පුද්ගලික රෝහල වෙතින් සංවිධානය කළ වෛද්‍ය කඳවුරක් එම ආරක්ෂක සේනා මූලස්ථාන ශ්‍රවණාගාරයේදී ඉකුත් ජූලි මස 16 වන දින පැවැත්විණ. එහිදී, අක්ෂි ආබාධ සහිත සෙබළුන් සඳහා අක්ෂි පරීක්ෂණ සිදු කරමින් ඇස් කණ්ණාඩි අවශ්‍යතා සහිත සෙබළුන් 50 දෙනෙකු සඳහා ඇස් කණ්ණාඩි පරිත්‍යාග කිරීමට ද කටයුතු කෙරිණ. අබිෂා රෝහලේ දෘෂ්ටි විශේෂඥයින් 06 දෙනකු මෙම වෛද්‍ය කඳවුර සඳහා සහභාගි වූ අතර, එහිදී ඉදිරි වෛද්‍ය ප්‍රතිකාර සඳහා සෙබළුන් 150 දෙනකු ලියාපදිංචි කිරීමට ද කටයුතු කරනු ලැබීය.



# “හමුදා දිවියෙන් සිවිල් දිවියට” වැඩසටහන යුද්ධ හමුදාධිපතිගේ ප්‍රධානත්වයෙන්





රණවිරු සේවා හා පුනරුත්ථාපන අධ්‍යක්ෂක මණ්ඩලයේ සම්බන්ධීකරණයෙන් සංවිධානය කෙරුණු “හමුදා දිවියෙන් සිවිල් දිවියට” වැඩසටහන ඉකුත් ජූලි මස 14 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් එන්ඩියූ පීඑස්සී අයිජී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විශ්‍රාම ලැබීමට පෙර ඔවුන්ව සාර්ථක විශ්‍රාම දිවියකට සූදානම් කිරීමේ අරමුණින් පවත්වන ලද මෙම වැඩසටහනේදී විශ්‍රාම ගැනීමෙන් අනතුරුව සාර්ථක විශ්‍රාම දිවියක් සඳහා යුද්ධ හමුදා නිලධාරීන්ගේ හැකියාවන් ප්‍රවර්ධනය කිරීම සිදුකෙරේ. සාර්ථක විශ්‍රාම දිවියක් ගතකරන යුද්ධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ මේ පිළිබඳ හසළ දැනුමකින් යුත් සිවිල් උපදේශකවරුන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් විසින් මෙහි දැනුම්වත් කිරීම් සිදුකරන ලද අතර, එහිදී විශ්‍රාම යාමට ප්‍රථම තම විශ්‍රාම දිවිය සැලසුම් කිරීම, මූල්‍ය කලමනාකරණය, සිවිල් සමාජයේ පවතින වෙනස්කම් දරාගැනීමේ හැකියාව ගොඩනැගීම සහ සමාජයේ පවතින වෘත්තීය අවස්ථාවන්වලට යොමුවීමට මඟපෙන්වීම ලබාදේ. මෙම වැඩසටහන 2025 ජූලි මස සිට 2026 ජූලි මස අතර කාලය තුළ විශ්‍රාම යාමට හෝ සේවයෙන් ඉවත්වීමට නියමිත කර්නල් සහ ඊට ඉහළ නිලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙනුවෙන් නිර්මාණය කරනු ලැබූවකි.

ඉහත අරමුණු පෙරදැරිව සංවිධානය කරන ලද ප්‍රථම වැඩමුළුව ඉකුත් ජූලි මස 14 සහ 15 යන දෙදින තුළ යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ. මෙම අවස්ථාවට ද රණවිරු සේවා හා පුනරුත්ථාපන අධ්‍යක්ෂක මණ්ඩලයේ අධ්‍යක්ෂක බ්‍රිගේඩියර් ඩබ්ලිව්ජේඑස්ආර් විජේදාස ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ගෞරවනීය ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ප්‍රධාන ආරාධිතයා ලෙස එක්වීය.

# විරු හිසට නව සෙවණක්



5 (ස්වෙච්ඡා) බළඇණිය ගජබා රෙජිමේන්තුවේ මාණ්ඩලික සැරයන් මංගල ඩබ්ලිව්එම්ජීඑම් යන ජ්‍යෙෂ්ඨ කොනොනි වෙනුවෙන් යුද්ධ හමුදාවේ මූලිකත්වයෙන් රාජාංගණය ප්‍රදේශයේ ඉදිකළ නව නිවසක් ඉකුත් ජූලි මස 09 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් එම ජ්‍යෙකොනොනි වෙත භාරදෙනු ලැබීය.



මෙම නව නිවස සඳහා ඕස්ට්‍රේලියාවේ පදිංචි වෛද්‍ය ගයාත්‍රි සල්ගාදු සහ වෛද්‍ය ආචාර්ය ප්‍රසාද් ගුණරුවන් යන අය විසින් මූල්‍ය අනුග්‍රාහකත්වය ලබාදුන් අතර ගජබා රෙජිමේන්තු හටපිරිස් එහි ඉදිකිරීම් කටයුතු සිදුකළහ.

12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්ටීඩබ්ලිව් විද්‍යානන්ද ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී සහ එම භාර්යාව වන සමන්තා නිලන්ති ද සිල්වා මහත්මිය විසින් එම පරිත්‍යාගශීලීන් සම්බන්ධීකරණය කරනු ලැබූහ. මෙම අවස්ථාවට බටහිර ආරක්ෂක සේනා ආඥාපති සහ ගජබා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් යූකේඩීඩීපී උඩුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහ එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි උදාරි අනුපමා ගමගේ මහත්මිය ඇතුළු එම ශාඛා සාමාජිකාවෝ, නිලධාරින්, සෙසුනිලයන්, රාජ්‍ය නිලධාරින් සහ ප්‍රදේශවාසීන් රැසක් සහභාගි වූහ.





අලදෙණිය ප්‍රදේශයේ වෙසෙන විශේෂ බලකායට අයත් ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරියකු වන බලලත් නිලධාරී I ටීඑම්එස් බණ්ඩාර වෙනුවෙන් ඉදිකරනු ලැබූ නව නිවසක් ඉකුත් ජූලි මස 18 වන දින එම පවුලේ සාමාජිකයන් වෙත පවරාදෙනු ලැබීය. මහජන බැංකුවේ අලෙවිකරණ ප්‍රධානී නාලක විජයවර්ධන මහතා ඇතුළු පවුලේ සාමාජිකයන් මෙම නව නිවස ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 1.4ක මූල්‍ය පරිත්‍යාගයක් ලබාදෙනු ලැබූහ. මේජර් ජෙනරාල් විපුල ඉහළගේ (විශ්‍රාමික) ගේ සම්බන්ධීකරණය මත ක්‍රියාත්මක කෙරුණු මෙම වැඩසටහන සඳහා අවශ්‍ය ශ්‍රම දායකත්වය විශේෂ බලකායේ හටපිරිස් ලබාදුන්හ.





## රෙජිමේන්තු මධ්‍යස්ථානයන්හි යටිතල පහසුකම් වැඩිදියුණුවට මූල්‍යාධාර





යුද්ධ හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයන්හි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා යුද්ධ හමුදා සුභසාධක අරමුදලෙන් මූල්‍යාධාර ප්‍රදානය කිරීමේ උත්සවයක් ඉකුත් ජූලි මස 02 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් එන්ඩීයූ පීඑස්සී අයිජී ගේ ප්‍රධානත්වයෙන් යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ. එහිදී, යුද්ධ හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙත රුපියල් මිලියනයක වටිනාකමකින් යුත් චෙක්පත් ප්‍රදානය කෙරිණ.

## ගරු ජනාධිපතිතුමන්ගෙන් රණවිරු සුභසාධනයට මෝටර් රථ පරිත්‍යාගයක්

රණක්ෂිතයට පත් රණවිරුවන්ගේ ප්‍රයෝජනය වෙනුවෙන් ගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි යුද්ධ හමුදා මූලස්ථානය වෙත ලබාදෙනු ලැබූ මෝටර් රථවලින් තවත් රථයක් ඉකුත් ජූලි මස 03 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් එන්ඩීයූ පීඑස්සී අයිජී විසින් මිහිඳු සෙත්මැදුර සුවතා නිකේතනය වෙත නිල වශයෙන් භාරදෙන ලදී. මෙම අවස්ථාව සඳහා රණවිරු සේවා හා පුනරුත්ථාපන අධ්‍යක්ෂ, මිහිඳු සෙත්මැදුර සුවතා නිකේතනයේ සේනාවිධායක ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරිහු සහ නේවාසික රණවිරුවන් පිරිසක් සහභාගි වූහ.



# 1 වන CISM මුයිතායි ශූරතාවලිය






ඉකුත් ජූලි මස 08 වන දින සිට 14 වන දින දක්වා තායිලන්තයේ බැංකොක්හිදී පැවති 1 වන CISM මුයිතායි ශූරතාවලියේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා මුයිතායි ක්‍රීඩක ක්‍රීඩිකාවෝ ලෝකඩ පදක්කම් 09ක් දිනාගැනීමට සමත්වූහ. රටවල් 20ක් නියෝජනය කරමින් තරඟකරුවන් 100කට අධික පිරිසකගේ සහභාගීත්වයෙන් යුතුව ජාත්‍යන්තර හමුදා ක්‍රීඩා කවුන්සිලය විසින් ඉතිහාසයේ ප්‍රථම වරට මෙම ඉසව්ව සංවිධානය කිරීම මෙහි විශේෂත්වයකි.



## 9 වන දකුණු ආසියානු කරාතේ ශූරතාවලිය - 2025





ශ්‍රී ලංකා කරාතේ සම්මේලනය වෙතින් සංවිධානය කරන ලද "9 වන දකුණු ආසියානු කරාතේ ශූරතාවලිය - 2025" ඉකුත් ජූලි මස 05 සහ 06 දෙදින තුළ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවැත්විණි. මෙම තරඟාවලිය සඳහා ජාතික කරාතේ කණ්ඩායම නියෝජනය කරමින් යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් 09 දෙනෙක් සහභාගි වූ අතර, ඔවුහු විශිෂ්ට දක්ෂතා දක්වමින් රන් පදක්කම් 02ක්, රිදී පදක්කම් 02ක් සහ ලෝකඩ පදක්කමක් දිනාගත්හ. යුද්ධ හමුදා කරාතේ කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් ආර්ඩී සලේ එන්ඩීසී ගේ අධීක්ෂණය මත යුද්ධ හමුදා ක්‍රීඩා කණ්ඩායම මෙම තරඟාවලිය සඳහා සහභාගි විය.





# 40 වන ජාතික ඔරු පැදීමේ ශූරතාවලිය



ජාතික ඔරු පැදීමේ සංගමය විසින් සංවිධානය කරන ලද 40 වන ජාතික ඔරු පැදීමේ ශූරතාවලිය, ඉකුත් ජූලි මස 23, 24, 25 සහ 26 යන දිනවල දියවන්නා ඔරු පැදීමේ මධ්‍යස්ථානයේදී පැවැත්විණ. එහිදී, ජාතික ඔරු පැදීමේ ඉතිහාසයේ ඓතිහාසික සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විවෘත කාණ්ඩයේ රන් පදක්කම් 10ක් දිනාගනිමින් පිරිමි සහ කාන්තා යන අංශ දෙකෙහිම සමස්ත ශූරතාවට හිමිකම් කීය. තරඟාවලියේදී යුද්ධ හමුදා පිරිමි කණ්ඩායම රන් පදක්කම් 05ක් සහ රිදී පදක්කමක් දිනා ගත් අතර, කාන්තා කණ්ඩායම රන් පදක්කම් 05ක් දිනාගනු ලැබූහ.

යුද්ධ හමුදා ඔරු පැදීමේ කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්එන්ඩීකේ බණ්ඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ගේ මඟපෙන්වීම යටතේ කණ්ඩායමේ සාර්ථකත්වය වෙනුවෙන් එහි පුහුණුකරු වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ මේජර් ඒඑම්එම්එම් අලගියවන්න සහ ඔහුගේ උපදේශක කණ්ඩාය මෙම තරග ජයග්‍රහණය සඳහා ලබාදුන්නේ සුවිශේෂී දායකත්වයකි.

# ලේටන් කුසලාන මුෂ්ඨි ප්‍රහාර තරඟාවලිය







ශ්‍රී ලංකා මුෂ්ඨි ප්‍රහාර සංගමය විසින් සංවිධානය කරනු ලැබූ "ලේටන් කුසලාන මුෂ්ඨි ප්‍රහාර තරඟාවලිය" ඉකුත් ජූලි මස 20, 21, 22 සහ 23 යන දිනයන්හි කොළඹ රාජකීය විද්‍යාලීය ගෘහස්ථ ක්‍රීඩාගාරයේදී පැවැත්විණ. මේ සඳහා ක්‍රීඩා සමාජ 25ක් නියෝජනය කරමින් ක්‍රීඩකයෝ 92ක් සහ ක්‍රීඩිකාවෝ 42ක් සහභාගී වූහ. එහිදී, යුද්ධ හමුදා පිරිමි කණ්ඩායම බර පන්ති 10ක් අතුරින් 07ක් සඳහා රන් පදක්කම් ද බර පන්ති 01ක් සඳහා රිදී පදක්කම් ද ලෝකඩ පදක්කම් 02ක් ද හිමිකරගනිමින් සමස්ත පදක්කම් සටහනේ ප්‍රථම ස්ථානය දිනාගැනීමට සමත්වූ අතර, යුද්ධ හමුදා රතු කණ්ඩායම බර පන්ති 01ක් සඳහා රන් පදක්කම් ද බර පන්ති 03ක් සඳහා ලෝකඩ පදක්කම් 03ක් ද හිමිකර ගනිමින් සමස්ත පදක්කම් සටහනේ දෙවන ස්ථානය හිමිකර ගැනීමට සමත්විය. ඒ අනුව පිරිමි කණ්ඩායම සමස්ත රන් පදක්කම් 08ක්, රිදී පදක්කම් 02ක් සහ ලෝකඩ පදක්කම් 05ක් හිමිකර ගනිමින් කැපී පෙනෙන දස්කම් දක්වා යුද්ධ හමුදාවට මහත් කීර්තියක් අත්කරදීමට සමත්විය.

තවද, ක්‍රීඩිකාවන් නව දෙනකුගෙන් සමන්විත යුද්ධ හමුදා කාන්තා කණ්ඩායම රන් පදක්කම් 02ක් ද, රිදී පදක්කම් 04ක් සහ ලෝකඩ පදක්කම් 03ක් ද හිමිකරගෙන සමස්ත තරඟාවලියේ කැපීපෙනෙන දස්කම් දක්වන්නට වූහ. යුද්ධ හමුදා මුෂ්ඨි ප්‍රහාර කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් පීකේඩබ්ලිව්ඩබ්ලිව්එම්ජේඑස්බීඩබ්ලිව් පල්ලෙකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ පූර්ණ අධීක්ෂණය යටතේ යුද්ධ හමුදා මුෂ්ඨි ප්‍රහාර සංචිතය ක්‍රියාත්මක වේ.

# 10 වන අන්තර් රෙජිමේන්තු අත්පන්දු තරඟාවලිය



ශ්‍රී ලංකා යුද්ධ හමුදා අත්පන්දු කමිටුව විසින් සංවිධානය කරන ලද 10 වන යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු අත්පන්දු තරඟාවලිය පනාගොඩ, යුද්ධ හමුදා ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පසුගිය ජූලි මස 24 සිට 27 වන දින දක්වා පැවැත්විණ. රෙජිමේන්තු 12ක් නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 1952කගේ සහභාගීත්වයෙන් පැවති තරඟාවලියේ අවසන් තරඟය 2025 ජූලි මස 27 වන දින පවත්වන ලදී. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගි වූ 56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, කෘෂිකර්ම හා පශුසම්පත් බලකායේ බලකාධිපති සහ යුද්ධ හමුදා අත්පන්දු කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් කේඑන්ඩි කරුණාපාල ආර්එස්පී එන්ඩීයූ සමඟින් ශ්‍රී ලංකා අත්පන්දු සංගමයේ සභාපති උපාලි රාජපක්ෂ මහතා ද සහභාගි වූහ.




කාන්තා අවසන් තරඟයේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකා කණ්ඩායම ලකුණු 26ක් ලබාගනිමින් ශූරතාව දිනාගත් අතර, ලකුණු 14ක් ලබාගනිමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා කණ්ඩායම එහි අනුශූරතාවය හිමිකරගත්තේය. පිරිමි අවසන් මහා තරඟයේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා සිංහ රෙජිමේන්තු කණ්ඩායම ලකුණු 34ක් ලබාගනිමින් ශූරතාව දිනාගත්තේ ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු කණ්ඩායම අනුශූරයින් කරමිනි.

---

# තායිලන්ත විවෘත මලල ක්‍රීඩා ශූරතාවලිය - 2025

තායිලන්ත මලල ක්‍රීඩා සංගමය වෙතින් සංවිධානය කරනු ලැබූ "තායිලන්ත විවෘත මලල ක්‍රීඩා ශූරතාවලිය - 2025" ඉකුත් ජූනි මස 22 වන දින තායිලන්තයේ පාතුම්තානි හිදී පැවැත්විණි. එහිදී, 6 බළඇණිය ගැමුණු හේවා බලකායේ කෝප්‍රල් චතුරංග ජීආර් රන් පදක්කම් දෙකක් ද, 2 වන (ස්වේච්ඡා) ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ කෝප්‍රල් අහමඩ් එම්එන්එස් ලෝකඩ පදක්කමක් ද 2 (ස්වේච්ඡා) බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ ලාන්ස් කෝප්‍රල් වක්සන් වී රන් හා රිදී පදක්කම් ද, 2 වන (ස්වේච්ඡා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ කාන්තා සෙබළ හපුආරච්චි එච්ඩබ්ලිව්කේ රිදී පදක්කමක් ද දිනාගැනීමට සමත්වූහ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා මලල ක්‍රීඩා කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් බීජීඑස් ප්‍රනාන්දු යූඑස්පී ගේ මඟපෙන්වීම මත යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවෝ මෙම තරඟාවලිය සඳහා සහභාගි වූහ.



# යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන වෙත මව් රෙජිමේන්තුවෙන් බුහුමන්



ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 67 වන මාණ්ඩලික ප්‍රධාන ලෙස අභිනවයෙන් ධූරයේ රාජකාරී භාරගනු ලැබූ මේජර් ජෙනරාල් ඩීකේඑස්කේ දොලගේ යූඑස්පී එන්පීඑස් පීඑස්සී වෙත ඉකුත් ජූලි මස 04 වන දින සිය මව් රෙජිමේන්තුවෙන් උපහාර පුදනු ලැබීය. ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායට ඉමහත් අභිමානයක් ගෙනදුන් එම අවස්ථාව වෙනුවෙන් එම බලකායේ නිලධාරීහු හා සෙසුනිලයෝ රැසක් සහභාගී වූහ.



එහිදී, මව්බිම වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන් සිහිකරමින් එම රෙජිමේන්තුවේ රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දැක්වීමෙන් අනතුරුව බලකාය තුළ එකතුමුතුභාවය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම මෙන්ම බලකායේ මෙහෙයුම් හැකියාව සහ අනාගතය තව තවත් ශක්තිමත් කිරීම සඳහා තම අනාගත සැලසුම් සහ ඉලක්ක පැහැදිලි කරමින් මාණ්ඩලික ප්‍රධාන හටපිරිස් ඇමතීමට ද කටයුතු කළේය.

# නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන වෙත මව් රෙජිමේන්තුවෙන් බුහුමන්



මේජර් ජෙනරාල් වයිඒබීඑම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 47 වන නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන ලෙස ධූරයේ රාජකාරි භාරගැනීමෙන් පසු උපහාර දැක්වීමේ උත්සවයක් ඉකුත් ජූලි මස 04 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ.



එහිදී, නව නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන හටපිරිස් ආමන්ත්‍රණය කරමින් සිය අරමුණු සහ දැක්ම පැහැදිලි කළ අතර, මව්බිම තුළ තිරසාර සාමය ඇතිකිරීමේ සටනේදී රණක්ෂිතයට පත් මෙන්ම සේවයේ නියුතු නිලධාරින් සහ සෙසුනිලයන් වෙත සිය ගෞරවය පුද කළේය. උත්සවය අවසානයේදී, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන සෙසුනිල භෝජනාගාරයේ පැවති සියලු නිල තේ පැන් සංග්‍රහයකට ද එක්වූ අතර, මෙම අවස්ථාවට එම රෙජිමේන්තුවේ නිලධාරිහු සහ සෙසුනිලයෝ රැසක් සහභාගි වූහ.

# නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන සංචාර රැසක






යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් වයිඒබීඑම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ඉකුත් ජූලි මස 09 වන දින කොළඹ, යුද්ධ හමුදා රෝහලේ සංචාරයක නිරත විය. එහිදී, රෝහලේ පවතින ගැටලු සම්බන්ධයෙන් සියලුම අධ්‍යක්ෂවරුන් සමඟ සාකච්ඡාවක් ද පැවැත්වූ හෙතෙම රෝහල් කාර්ය මණ්ඩලයේ නවාතැන් පහසුකම් ද පරීක්ෂා කරනු ලැබීය. එසේම, තවදුරටත් සිදුකළයුතු නිවැරදි කිරීම් පිළිබඳව නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන අදාළ බලධාරීන් වෙත උපදෙස් ලබාදුන් අතර, මේ වනවිට ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතින මහල් 15කින් යුත් ගොඩනැගිල්ල ද ඔහුගේ නිරීක්ෂණයට භාජනය විය.

තවද, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන ඉකුත් ජූලි මස 18 වන දින යක්කල රණවිරු ඇපරල් ආයතනයේ ද සංචාරයක නිරත විය. හෙතෙම එම ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සභාපති ද වේ. එහිදී, සේනාවිධායක බ්‍රිගේඩියර් එම්ඒඩීජේඩී ගුණතිලක ආර්එස්පී යූඑස්පී විසින් එම ආයතනයේ ඉතිහාසය, කාර්යභාරය, නිෂ්පාදන ක්‍රියාවලීන් සහ කළමනාකරණ පද්ධති පිළිබඳව එහිදී නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානව සවිස්තරාත්මකව දැනුම්වත් කිරීමට ද කටයුතු කරන ලදී. සිය සංචාරයේදී එම කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන ක්‍රියාවලිය නිරීක්ෂණය කරමින් එහි ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීමට ද කටයුතු කරන ලදී.

# ලෝක කඩොලාන දිනය සමරමින්



541 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් අයිපී ජයසිංහ ආර්ඩබ්ලිව්පී ගේ මඟපෙන්වීම මත 10 (ස්වේච්ඡා) ගැමුණු හේවා බළඇණියේ අණදෙන නිලධාරීගේ පූර්ණ අධීක්ෂණය යටතේ ලෝක කඩොලාන දිනයට සමගාමීව මන්නාරම නරුවිලකුලම් ප්‍රදේශයේ කඩොලාන ශාක 1500ක ප්‍රමාණයක් රෝපණය කිරීමේ වැඩසටහනක් ඉකුත් ජූලි මස 28 වන දින පැවැත්විණ.

මෙම වැඩසටහන ශ්‍රී ලංකා පොලීසිය, නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වන සංරක්ෂන දෙපාර්තමේන්තුව, මන්නාරම රතු කුරුස සංවිධානය, බාලදක්ෂ සංගමය, යාපනය විශ්ව විද්‍යාලය, නරුවිලකුලම් රජයේ දමිළ විදුහලේ සිසු සිසුවියන් සහ 10 (ස්වේච්ඡා) ගැමුණු හේවා බළඇණියේ භටපිරිස්හි සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කෙරිණ.



# 55 වන පාබල සේනාංකයෙන් ප්‍රජා සත්කාරක වැඩසටහනක්





ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහනට සමගාමීව 55 වන පාල සේනාංකය යටතේ ස්ථාපිත ඒකකයන්හි සහභාගීත්වයෙන් සංවිධානය කෙරුණු ප්‍රජා මූලික වැඩසටහන් මාලාවක් ඉකුත් ජූලි මස 04 වන දින පැවැත්විණ. 7 බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව, 22 බළඇණිය විජයබාහු පාබල රෙජිමේන්තුව සහ 14 බළඇණිය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ භටපිරිස් ඊට ශ්‍රම දායකත්වය දැක්වූහ. ඒ අනුව ශ්‍රම මෙහෙයුම තේමාව ඔස්සේ දියත් කෙරුණු එම දැනුවත් කිරීම් දේශන, පැළ සිටුවීමේ වැඩසටහන් සහ පිරිසිදු කිරීමේ වැඩසටහන් ඇතුළත් විය. කිලිනොච්චි දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, කිලිනොච්චි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, කිලිනොච්චි ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය, කිලිනොච්චි ශ්‍රී ලංකා ජර්මාන් කාර්මික අභ්‍යාස ආයතනය, පූනරීන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සහ ධර්මපුරම් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඇතුළු ස්ථාන කිහිපයකදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරිණි. මේ සඳහා යුද්ධ හමුදා සාමාජිකයන් 885 දෙනෙක්, ගුරු භවතුන්, සිසු සිසුවියන් සහ ප්‍රදේශවාසීන් ඇතුළු දහසකට වැඩි පිරිසක් සහභාගී වූහ.

# රණවිරුවන්ට සෙත්පතා ආගමික වැඩසටහන් රැසක්





තිස් වසරක් පුරා පැවති එල්ටීටීඊ ත්‍රස්තවාදයෙන් මව්බිම බේරාගැනීම වෙනුවෙන් සටන්වැද දිවිපිදූ රණවිරුවන් හට පිං පැමිණවීමේ අරමුණින් සහ රණක්ෂිතයට පත් රණවිරුවන් මෙන්ම දැනට සේවයේ නියුතු සියලුම රණවිරුවන් හට සෙත් පැතීමේ අරමුණින් සංවිධානය කෙරුණු සර්ව රාත්‍රිය පිරිත් සජ්ඣායනාවක් ඉකුත් ජුනි මස 23 වන දින 56 වන පාබල සේනාංකයේදි පැවැත්විණ. එහි සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඑන්ඩී කරුණාපාල ආර්එස්පී එන්ඩීයූ ගේ මගපෙන්වීම යටතේ පැවති මෙම ආගමික කටයුත්ත සඳහා 561, 562, 563 යන පාබල බලසේනාවන්හි බලසේනාධිපතිවරු, ඒකක  අණදෙන නිලධාරීන් ඇතුලු නිලධාරීන්, සෙසුනිලයින් සහ සිවිල් සේවක මහතුන් රැසක් සහභාගී වූහ.





තිස් වසක් පුරා පැවති යුද්ධය හමුවේ තම ජීවිත කැපකළ විශේෂ බලකා රෙජිමේන්තුවට අයත් සියලු විරුවන්ට පින් අනුමෝදන් කිරීමේ අරමුණින් ඉකුත් ජූලි මස 12 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනාවක් පැවැත්විණ. විශේෂ බලකා රෙජිමේන්තු කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් එම්ටීඅයි මහලේකම් ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාවට නිලධාරීහු සහ සෙසුනිලයින් විශාල පිරිසක් සහභාගී වූහ.

# විදෙස් නියෝජිතයින් සංචාර රැසක



ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ ස්විට්සර්ලන්ත තානාපතිනි ආචාර්ය Siri Walt ඉකුත් ජූලි මස 29 වන දින යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් කේජ්එන් රසික කුමාර එන්ඩීසී පීඑස්සී හමුවිය.

එහිදී, එම ආරක්ෂක සේනා මූලස්ථානය වෙතින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රජා මූලික ව්‍යාපෘති, ආරක්ෂක සහ පොදු කරුණු පිළිබඳව එතුමියව දැනුවත් කෙරිණි. මෙම අවස්ථාවට එම ආරක්ෂක සේනා මූලස්ථානයේ බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික නිලධාරි බ්‍රිගේඩියර් එම්පීකේඑල් අමරසිංහ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ල්ව්පී ආර්එස්පී එන්ඩීසී ද එක්විය.



ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක Lieutenant Colonel Matthew House ඉකුත් ජූලි මස 26 වන දින 22 වන පාබල සේනාංක මූලස්ථානයේදී එහි සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්ඩීඑල්එස් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී හමුවිය. එහිදී, දෙරටෙහි පවතින අන්‍යෝන්‍ය සබඳතාවන් තවදුරටත් ශක්තිමත් කරමින් ද්විපාර්ශ්වික වශයෙන් වැදගත් කරුණු රැසක් පිළිබඳව ඔවුහු අදහස් හුවමාරු කරගත්හ.





ප්‍රගුණ හා සැඟවුණු වෙඩිකරු පුහුණු පාසලේ දැනට ස්නයිපර් පාඨමාලාව හදාරන මාලදිවයින් ආරක්ෂක හමුදාවේ Sergeant Hussain Fasheen සහ Sergeant Aisham Ahmad ගේ පුහුණු ප්‍රගතිය සහ පරිපාලන පහසුකම් සොයාබැලීම සඳහා මාලදිවයින් ජනරජයේ ආරක්ෂක උපදේශක Colonel Hassan Amir ඉකුත් ජූලි මස 23 වන දින එම පුහුණු පාසල වෙත පැමිණියේය. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ වාර්ෂික පුහුණු වැඩසටහන යටතේ පවත්වනු ලබන මෙම පාඨමාලාව මඟින් දේශීය හා විදේශීය භටපිරිස් ඒකාබද්ධ කරමින් ස්නයිපර් උපක්‍රම සහ නිරවද්‍ය වෙඩි තැබීමේ හැකියාව වැඩි දියුණු කරනු ලබයි.

මෙම සංචාරය අතරතුරදී, පාඨමාලා අන්තර්ගතය, පුහුණු ශිල්පීය ක්‍රම සහ විදේශීය අභ්‍යාසලාභීන්ගේ කාර්ය සාධනය පිළිබඳව එම ජ්‍යෙෂ්ඨ නිලධාරීව දැනුවත් කෙරිණ. එහිදී, උපදේශකයන් සහ පාඨමාලාව හදාරන භටපිරිස් සමඟ සුහද පිළිසඳරක ද නිරතවූ හෙතෙම පුහුණු පාසලේ වෘත්තීයභාවය සහ දෙරට අතර ආරක්ෂක සහයෝගීතාව ශක්තිමත් කිරීමේදී ඔවුන්ගේ කාර්යභාරය ඇගයුමට ලක්කළේය.

# “යුද හමුදාවට අභිමානය කැන්දූ ඓතිහාසික මොහොතක්”





උසස්වීම් ලද ශ්‍රී ලංකා සංඥා බලකායේ මේජර් ජෙනරාල් ජීසීවී ප්‍රනාන්දු එන්ඩීසී වෙත නිල ලාංඡන පැළඳවීම ඉකුත් ජූනි මස 16 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී සිදු කෙරිණ. මෙම අවස්ථාව විශේෂිත වනුයේ එම නිල ලාංඡන පැළඳවීම ඔහුගේ පුතුන් දෙදෙනා වන කමාන්ඩෝ රෙජිමේන්තුවෙහි සේවයේ නියුතු කපිතාන් ජීඑස්වී ප්‍රනාන්දු සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සේවයේ නියුතු පියාසර නිලධාරී ජීඑන්ඩී ප්‍රනාන්දු විසින් සිදුකිරීමය. එය වූ කලී එම පියාට සේම පුතුන් දෙදෙනාට ද අමරණීය අවස්ථාවක් වූවා සේම සමස්ත යුද හමුදාවට ද අභිමානයකි. එසේම, පියාගේ උරය මත සන්නද්ධ හමුදාවන්හි සේවයේ නියුතු තම පුතුන් දෙදෙනකු අතින් මේජර් ජෙනරාල් නිලයේ ලාංඡන පැළඳවීම ශ්‍රී ලංකා යුද හමුදා ඉතිහාසයේ ප්‍රථම අවස්ථාව වූවා සේම ඇතැම්විට ලෝකයේ හමුදාවන් තුළ එවන් සිදුවීමක් වූ විරල අවස්ථාවක් ද විය හැක.

මෙහි ඇති තවත් විශේෂත්වයක් වනුයේ දීර්ඝ කාලයක් රට වෙනුවෙන් කැපවූ පියකු ලෙස ඔහු තම පුතුන් දෙදෙනාද තම අඩිපාරේ යවා දේශය සුරැකීමේ උදාර මෙහෙවරට දායක කරලීමය. මෙරට පමණක් නොව විදේශයන්හි පවා වෙනත් ඉහළ වෘත්තීන්හි නියැලීමට සුදුසුකම් තිබියදීත් ආරක්ෂක අංශයකටම එක්වීමට තරම් එම දරුවන් ද පෙළඹී ඇත්තේ මාතෘභූමිය පිළිබඳ උපන් හැඟීමෙන් යුතුවය. ඒ හරහා සමස්ත රණවිරු ප්‍රජාවට ද සිවිල් සමාජයට ද ඔවුන් පෙන්වා දී ඇත්තේ කදිම ආදර්ශයකි. යුගයන් ද්විත්වයක් නියෝජනය කරමින් සමාජයට පූර්වාදර්ශ දෙමින් කරන්නාවූ සේවය සෙසු යුද්ධ හමුදා සාමාජිකයින්ට මෙන්ම සමස්ත තරුණ ප්‍රජාවට ද අභිප්‍රේරණයකි. එම ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ නිල උසස්වීමට මෙන්ම සිය පුතුන් දෙදෙනා උපන් බිමට කැපව කරන්නාවූ මෙහෙවරට ද ඔවුන්ගේ ඉදිරි අනාගත අභිවෘද්ධියට ද “රණවිරුවා” මෙලෙස සුභපැතුම් එක්කරයි.

# මුලතිව් විරුවන් අනුස්මරණය කෙරේ



1996 මුලතිව් ප්‍රහාරය හමුවේ මව්බිම වෙනුවෙන් දිවිපිදූ වීරෝදාර රණවිරුවන් වෙත ගෞරවාචාර පුදකිරීම වෙනුවෙන් සංවිධානය කරනු ලැබූ 29 වන අනුස්මරණය ඉකුත් ජූලි මස 19 වන දින 1 විශේෂ බලකා රණවිරු ස්මාරකය අභියසදී පැවැත්විණි. විශේෂ බලකායේ රෙජිමේන්තු අධිපති ගේ මඟපෙන්වීමෙන් මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් එච්එම්ජේඩබ්ලිව් බණ්ඩාර ආර්එස්පී යූඑස්පී එන්පීඑස් පීඑස්සී සහ 1 විශේෂ බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඩීඩී මාසිංහ ආර්ඩබ්ලිව්පී යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම උත්සවයේදී මව්බිමේ ඒකීයභාවය උදෙසා 1996 ජූලි මස 19 දින තම ජීවිත පූජා කළ කර්නල් ඒඑෆ් ලෆීර් පීඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරින් දෙදෙනකු සහ සෙසුනිලයන් 36 දෙනකු වෙනුවෙන් උපහාර පුදකෙරිණි.

මෙම අවස්ථාවට සමගාමීව, 1 විශේෂ බලකාය වෙතින් මාතලේ, මඩවල උල්පත පිහිටි වර්ණකුලසූරිය වැඩිහිටි නිවාසයේ නේවාසික ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග කිරීමක් ද අනතුරුව ඔවුන් වෙනුවෙන් ප්‍රණීත දිවා භෝජන සංග්‍රහයක් ද පිරිනැමිණි. පසුව, එම දිවංගත රණවිරුවන් වෙත පිං අනුමෝදන් කරමින් ඒකක පරිශ්‍රයේදී ධර්ම දේශනාවක් ද පැවැත්විණ.





# දිඹුලාගල, ආරණ්‍ය සේනාසනයේ සංචාරයක





නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජේඑස්බීඩබ්ලිව් පල්ලෙකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පිහිටි ඓතිහාසික හා ආගමික වැදගත්කමකින් යුත් දිඹුලාගල, ආරණ්‍ය සේනාසනයේ ඉකුත් ජූලි මස 09 වන දින සංචාරයක නිරත විය. එහිදී, දිඹුලාගල ආරණ්‍ය සේනාසනයේ විහාරාධිපති අතිපූජ්‍ය දිඹුලාගල රාහුලාලංකාර නායක හිමිපාණන් බැහැදැක ආශිර්වාද ලබාගැනීමෙන් අනතුරුව විහාරස්ථාන පරිශ්‍රයේ සංචාරයක නිරත වෙමින් එම පුදබිමේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා යුද්ධ හමුදා භටපිරිස් විසින් සිදුකරනු ලබන ඉදිකිරීම් කටයුතු පිළිබඳව ද ඔහු විසින් නිරීක්ෂණය කරන ලදී.

# දිවියක් රැකගත් විරුවන් පිරිසක්





2025 මැයි මස 23 වන දින 513 වන පාබල බලසේනාංක මූලස්ථානයේ ඉදිරි සැරහුම් මධ්‍යස්ථානයෙහි අපි රාජකාරී කරමින් සිටියෙමු. එදින සවස 4 වූවා පමණකි. "ජයතිලකට කරන්ට් එක වැදුනා" යැයි කෑ ගසමින් රෙජිමේන්තු පොලිස් අංශ කොනොනි ඉදිරි සැරසුම් මධ්‍යස්ථානය වෙත දිව එන්නට විය. තවත් මොහොතක්වත් අපතේ යවන්නට ඉඩක් නොවීය. අප වහා රෝගියාට ප්‍රථමාධාර ලබාදීට යුහුසුළුව කටයුතු කළහ.

> "යුද සමයේදී මෙන්ම පශ්චාත් යුද සමයේදීද වෛද්‍ය සෙබළුන් කිසිවිට තම මෙහෙවර අතපසු නොකළහ. විපතේදී අනෙකාට නොවලහා උපකාර කිරීම තම වෛද්‍ය භූමිකාවේම කොටසක් බැව් අවබෝධයෙන් දත් ඔවුහු අදට ද තම සගයින්ට පැමිණෙන විපත්වලදී තැන නොතැන තරාතිරම නොබලා පෙරට පැමිණ උපකාර කරනුයේ සැබෑ රණවිරු ගුණය කියාපාමිනි. මෙවර "රණවිරුවා" හි මෙම සටහන වෙන්වෙනුයේ තම සහෝදර සෙබළකුගේ දිවි බේරාගැනීමට කැපවූ වෛද්‍ය බලකා සෙබළ කැළකට උපහාර පිණිසය"

හදිසි අවස්ථා සඳහා ප්‍රථමාධාර ලබාදීමට සූදානම් කරන ලද ප්‍රථමාධාර පෙට්ටිය ද රැගෙන ඒ වනවිටත්, ඉදිරි සැරසුම් මධ්‍යස්ථානය තුළ රාජකාරී යෙදී සිටි මා සෙ/652342 ලාන්ස් කෝප්‍රල් කරුණාරත්න එච්එම්එම්ආර් සහ සෙ/655021 ලාන්ස් කෝප්‍රල් රත්නසිරි ආර්ජීජ්එස් යන අය අනතුර සිදුවූ ස්ථානය වෙත වහා දිවගියහ. අනතුරුව රෝගියා ආරක්ෂිත ස්ථානයකට ගත් අප රෝගියාගේ ජෛව ලක්ෂණ පරීක්ෂා කර බලන්නට වූහ. එහිදී, ඔහුගේ නාඩි වැඩ නැති නිසා සී.සී.ආර් ලබාදීම ආරම්භ කළ අතර රෝගියාට කැනියුලා එකක් ද දමාගන්නා ලදී. මේ අතර අප සී.පී.ආර් ක්‍රියාවලිය දිගටම සිදුකරද්දී ලාන්ස් කෝප්‍රල් රත්නසිරි රෝගියා රැගෙන යාමට බොලේරෝ රථයක් රැගෙන ආවේ ඒ තුළට මෙට්‍රස් එකක් ද දමාගනිමිනි.

ඉන් පසුව රෝගියා තෙලිපලෙල රෝහල වෙත රැගෙන යනතුරුම නොනවත්වා සී.පී.ආර් ලබාදෙමින්ම එහි හදිසි අනතුරු ඒකකය වෙත රෝගියා ඇතුළත් කරන ලදී. එහිදීද, වැදගත්ම දේ වූයේ අප රෝගියා ඇතුළත් කරන අවස්ථාව වනවිට වෛද්‍ය හා හෙද කාර්ය මණ්ඩලය රෝගියා භාරගැනීමට සූදානම්ව ඇඳ වටේට එකතු වී සිටීමයි. අප රෝගියා ඔවුන් වෙත භාරදීමත් සමඟ ඔවුන් ද සී.පී.ආර් ක්‍රියාවලිය ඉතා සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමෙන් පසු රාත්‍රී 8.30ට පමණ රෝගියාට සිහිය එන ලදී. එම අවස්ථාවේදී වෛද්‍ය කාර්ය මණ්ඩලය මෙන්ම අප ද සහෝදර රණවිරුවකුගේ ජීවය පණ ගැන්වීමට ලැබීම පිළිබඳ පසුවූයේ අසීමිත සතුටකිනි. එලෙස ඔහුගේ දිවි රැකගැනීමට හැකිව තිබුණේ ප්‍රථමාධාර නියම අයුරින් ලබාදී තිබූ නිසා බැව් අප වෙත පැසීමට තරම් වෛද්‍ය කාර්ය මණ්ඩලය ද නිහතමානී විය.

**- (සෙ/651754 සැරයන් පුෂ්ප කුමාර ජීඩබ්ලිව්අයිජී)**



# කපිතාන් සාලිය අලදෙණිය විරුවාගේ ගුණ සැමරේ



1990 ජූලි මස 11 වන දින කොකාවිල් කඳවුරේදී දිවිපිදූ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ කපිතාන් සාලිය අලදෙණිය පීඩබ්ලිව්වී ඇතුළු යුද්ධ හමුදා සාමාජිකයන්ගේ ගුණ සැමරුම් උත්සවය ඉකුත් ජූලි මස 11 වන දින කොකාවිල් රණවිරු ස්මාරකය අසළදී පැවැත්විණි. වීරෝදාර සෙන්පතියකු ලෙස යුදබිම තුළ අවසන් හුස්ම පොද හෙළන තෙක්ම තම හටපිරිස් මෙහෙයවමින් ඔවුන් සමඟ සතුරාට කිසිදු බියකින් තොරව මුහුණදීම හේතුවෙන් කපිතාන් සාලිය අලදෙණිය ශ්‍රී ලංකා ඉතිහාසය තුළ ඉහළම හමුදා ගෞරවය වන "පරම වීර විභූෂණ" (PWV) සම්මානයෙන් පිදුම් ලැබූ ප්‍රථම රණවිරුවා බවට පත්විය.

පූර්ණ හමුදා ගෞරවාචාර මධ්‍යයේ පැවති මෙම උත්සවයේදී දිවංගත වීරෝදාර රණවිරුවන් අනුස්මරණය කරමින් ඔවුන් වෙනුවෙන් පුෂ්පෝපහාර පිරිනැමිණ. මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිතයා ලෙස 59 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීආර්එන් හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී සහභාගී වූ අතර ඊට දිවංගත රණවිරුවන්ගේ පවුල්වල ඥාතීහු ද සහභාගි වූහ.



# පුපුරණ ද්‍රව්‍ය නිෂ්ක්‍රීය කිරීමේ පුහුණු උපකරණ කට්ටල පරිත්‍යාගයක්



ද්විපාර්ශ්වික ආරක්ෂක සහයෝගීතාවය තවදුරටත් වැඩිදියුණු කරමින් ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති කාර්යාලය වෙතින් ඉකුත් ජූනි මස 30 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉංජිනේරු පුහුණු පාසලෙහි ඉල්ලීමකට ප්‍රතිචාර දක්වමින් පුපුරණ ද්‍රව්‍ය නිෂ්ක්‍රීය කිරීමේ පුහුණු උපකරණ කට්ටලයක් එම පුහුණු පාසල වෙත පරිත්‍යාග කෙරිණ. නවීන පුහුණු උපකරණ භාවිතා කිරීමේ හැකියාව ඇතිකිරීම, විෂය මාලාවේ ක්‍රියාන්විත සූදානම වැඩිදියුණු කිරීම මෙහි අපේක්ෂාවයි. මෙම උපකරණ කට්ටලය ඵලදායීව බෙදාදීම සහතික කරමින්, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉංජිනේරු සේනාංකය සහ ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු කාර්යාලය සමඟ ඒකාබද්ධව උපදේශනයන් ද පැවැත්වීය. එක්සත් ජනපද ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරින් සිව්දෙනකු ද ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉංජිනේරු පුහුණු පාසලේ සේනාවිධායක කර්නල් ජේජ්සීඑස් ජාගොඩ පීඑස්සී ද මෙම අවස්ථාවට සහභාගී වූහ.

එසේම, මෙම වැඩසටහනට සමගාමීව එක්සත් ජනපද දූත පිරිස, එක්සත් ජනපද හමුදා පැසිෆික් විධානය සමඟ සහයෝග යෙන් යුතුව 2025 ජූලි මස 21 සිට 25 දින දක්වා ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉංජිනේරු පුහුණු පාසලේදී උපායමාර්ගික සංග්‍රාමික පුහුණු පාඨමාලාවක් ප්‍රථම වරට සාර්ථකව පවත්වන ලදී. සංග්‍රාමික අවස්ථාවන්හිදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉංජිනේරු බලකා සාමාජිකයන්ගේ වෛද්‍ය සූදානම සහ පැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා වන තවත් ප්‍රධාන පියවරක් වශයෙන් මෙම පාඨමාලාව පැවැත්විණි. ඒ අනුව, පුපුරණ ද්‍රව්‍ය නිෂ්ක්‍රීය කිරීමේ විෂය මාලාවේ පළමු අදියර යටතේ පවත්වනු ලැබූ මෙම පුහුණු වැඩසටහනේ මූලික අංගයක් ලෙස, උපායමාර්ගික සංග්‍රාමික පුහුණු පාඨමාලාව තුළින් අධිපීඩන ක්‍රියාන්විත පරිසරයන් තුළදී ක්ෂණික වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම සඳහා අවශ්‍ය කුසලතාවන් ඉංජිනේරු බලකා සාමාජිකයන් වෙත ලබාදෙනු ලැබීය.

# 1996 මුලතිව් ප්‍රහාරයට 29 වසක් සපිරේ

1996 ජූලි මස 18 වන දින මුලතිව් කඳවුරට එල්ලවූ ත්‍රස්තවාදී ප්‍රහාරයේදී අභීතව සටන් වැද තම දිවි පුදකළ විරුවන් සැමරීමේ අභිමානවත් උත්සවයක් 2025 ජූලි මස 17 වන දින මුලතිව් හි පිහිටි රණවිරු ස්මාරකය අභියසදී පැවැත්විණ. 59 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීආර්එන් හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවති එම සැමරුමට තවත් නිලධාරීන් සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.









1996 ජූලි මස 18 වන දින සිදුවූ මුලතිව් ප්‍රහාරය වූ කලී ගෙවුණු තිස්වසක යුද ඉතිහාසය තුළ ත්‍රස්තවාදීන් හමුවේ අප ලැබූ දරුණුතම පසුබෑමකි. එහිදී, විනාශ වූ හමුදා ජීවිත සංඛ්‍යාව 1,400කට ආසන්න වූ අතර, අහිමි වූ හමුදා දේපල ද අතිවිශාලය. නමුත්, එම සටනේදී සතුරා කොතරම් බලවත් වුවද අවසන් මොහොත තෙක් නොබියව ඔවුනට මුහුණදුන් විරුවන් සේම ජීවිත බේරාගෙන පැමිණීමට සමත් වූ පිරිසක් ද සිටි බව බොහෝ දෙනකු නොදනී.

කාලයේ වැලිතලාවෙන් වැසී ගිය යුදබිම තුළ සිදුවූ ඉහත සිදුවීමට 2025 ජූලි මස 18 වන දිනට පුරා වසර 29ක් සපිරුණි. "රණවිරුවා" හි මේ පිට එදවස මුලතිව් හි දිවිපිදූ ඒ අභීත විරුවන්ට උපහාර පිණිසය.



# ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ වැඩසටහනක්

යුද්ධයේදී මියගිය, ආබාධිත තත්ත්වයට පත්වූ හා විශ්‍රාමික රණවිරුවන්ගේ දරුවන් මෙන්ම දැනට සේවයේ යෙදී සිටින රණවිරුවන්ගේ හා යුද්ධ හමුදාවේ රාජකාරී කරනු ලබන සිවිල් සේවක මහත්ම, මහත්මීන්ගේ දූවා දරුවන් වෙනුවෙන් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ වැඩසටහනක් පසුගිය ජූලි මස 31 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණි. මේ යටතේ 2024 වර්ෂයේ අ:පො:ස (උ/පෙළ) විභාගය සඳහා පෙනී සිට විශිෂ්ට සාමාර්ථ ('A' සාමාර්ථ 03ක්) ලබාගත් දූ දරුවන් 68 දෙනකු සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කෙරිණ.

එම අවස්ථාව සඳහා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සීටීඑෆ් එන්ඩීයූ පීඑස්සී අයිජී සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිනි ස්වේන්ද්‍රිනි දිසානායක මහත්මිය සහභාගී වූහ. මෙහිදී යුද්ධ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙතින් රු: 6,800,000.00ක මුදලක් දරුවන් 68 දෙනකු සඳහා රු:100,000.00ක් දක්වා ඉහළ නංවන ලද ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සිදුකෙරිණ.







## වැලිසර රෝහලට දැඩි සත්කාර ඒකක ඇඳන් පරිත්‍යාගයක්



වැලිසර, ශ්වසන රෝග පිළිබඳ ජාතික රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන්ගේ ප්‍රයෝජනය වෙනුවෙන් පරිත්‍යාග වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබීය. මේ යටතේ රුපියල් මිලියන 9කට අධික වටිනාකමකින් යුත් දැඩිසත්කාර ඒකක ඇඳන් තුනක් පරිත්‍යාග කිරීම ඉකුත් ජූලි මස 09 වන දින යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මඟින් සිදුකෙරිණ. ආරක්ෂක අමාත්‍යාංශයේ සේවා වනිතා ඒකකයේ සභාපතිනි වෛද්‍ය රසිකා පෙරේරා මහත්මියගේ සම්බන්ධීකරණයෙන් යුතුව පැවති මෙම වැඩසටහන යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වේන්ද්‍රිනි දිසානායක මහත්මියගේ මඟපෙන්වීම මත ක්‍රියාත්මක කෙරිණ.

# සේවා වනිතා ඒකකයේ හටපිරිස් වෙනුවෙන් දිවා භෝජන සංග්‍රහයක්





යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වෙන්ද්‍රිනි දිසානායක මහත්මියගේ මඟපෙන්වීම මත යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයට අනුබද්ධ සුභසාධන ආයතනවල සේවය කරන යුද්ධ හමුදා හටපිරිස් වෙනුවෙන් සංවිධානය කෙරුණු දිවා භෝජන සංග්‍රහයක් ඉකුත් ජූලි මස 04 වන දින මුල්ලේරියාව, සන්ෆ්ලවර් ගම්මානයේදී පැවැත්විණ.

මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සීටීඑෆ් එන්ඩීයූ පීඑස්සී අයිජී සහභාගි වූ අතර, එහිදී යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය සමඟින් යුද්ධ හමුදාධිපතිතුමන් හටපිරිස් සමඟ සුහද කතාබහක නිරත විය. සුහද පිළිසඳරකින් පසුව යුද්ධ හමුදාධිපතිතුමන් විසින් හටපිරිස් ආමන්ත්‍රණය කරමින්, යුද්ධ හමුදාවේ සුභසාධන මෙහෙයුම් සඳහා ඔවුන් කැපවීමෙන් සිදුකරනු ලබන සේවය අගය කරන ලදී. අනතුරුව මෙම වැඩසටහන කැලිප්සෝ සංගීත සංදර්ශනයකින් වර්ණවත් විය. මෙම වැඩසටහනේ තවත් අංගයක් ලෙස, එලායන්ස් ෆිනෑන්ස් ආයතනයෙහි අනුග්‍රාහක දායකත්වය ඇතිව හටපිරිස් වෙත අඹ පැළ බෙදාදීමක් ද සිදුකෙරිණ.





# යුද්ධ හමුදා සේවා වනිතාවෙන් රිජ්වේ ආර්යා ළමා රෝහලට ඇඳන් පරිත්‍යාගයක්



යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මගින් ක්‍රියාත්මක කරනු ලබන සුභසාධන සත්කාරවල තවත් අදියරක් ලෙස බොරැල්ල රිජ්වේ ආර්යා ළමා රෝහලේ හදිසි ප්‍රතිකාර ඒකකයේ ප්‍රයෝජනය සඳහා වෛද්‍යාධාර ලබාදීමේ වැඩසටහනක් ඉකුත් ජූලි මස 26 වන දින එම රෝහල් පරිශ්‍රයේ පැවැත්විණ. මෙම අවස්ථාවට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ කර්නල් (සම්බන්ධීකරණ) කර්නල් එම්එම්ආර් චන්ද්‍රසේකර, ආරක්ෂක අමාත්‍යාංශය නියෝජනය කරමින් නිලධාරිනියක් සහ ළමා රෝහලේ විශේෂඥ වෛද්‍ය උපදේශක අනූෂා ශ්‍රියාසිංහ, විශේෂඥ වෛද්‍ය එච්ඩබ්ලිව්ජ් ශානිකා ප්‍රියංගනී මහත්මීන් ඇතුළු රෝහල් කාර්ය මණ්ඩලයේ පිරිසක් සහභාගී වූහ. රිජ්වේ ආර්යා ළමා රෝහල වෙත මහත් අඩුපාඩුවක්ව පැවති රුපියල් මිලියන 09ක් පමණ වටිනා දැඩි සත්කාර ඒකක ඇඳන් 03ක් එම ඒකකයේ ප්‍රතිකාර ගනු ලබන දූවා දරුවන්ගේ ප්‍රයෝජනය සඳහා එහිදී පරිත්‍යාග කෙරිණ.

# පාසල් උපකරණ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක්





යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය විසින් දිඹුලාගල ශ්‍රී මහා කාශ්‍යප දහම් පාසල, දිඹුලාගල පිරිවෙන සහ දිඹුලාගල කාශ්‍යප මහා විද්‍යාලයෙහි ඉගෙනුම ලබන සාමණේර භික්ෂූන් වහන්සේලා සහ සිසු සිසුවියන් 176 දෙනකු සඳහා පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජූලි මස 20 වන දින දිඹුලාගල, රජමහා විහාරස්ථානයේදී පවත්වන ලදී. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඇස්පී සීටීඑෆ් එන්ඩීයූ පීඑස්සී අයිජී සහභාගි විය. එහිදී, එක් සිසුවකුට රුපියල් 7,500.00ක් පමණ වටිනාකමකින් යුත් පාසල් උපකරණ නිලඇඳුම් හා වවුචර්පත් පිරිනැමිණ. මීට අමතරව, යුද්ධ හමුදාධිපති විසින් එම අධ්‍යයන ආයතනයන්හි ගුරු භවතුන් 23 දෙනකු වෙනුවෙන් ද පරිත්‍යාගයන් සිදුකරන ලදී.






# බහුවිධ වෛද්‍ය සායනයක්






යුද්ධයෙන් ආබාධිත තත්වයට පත්ව කෘත්‍රිම අත් පා හා ශල්‍ය උපකරණ පළඳින රණවිරුවන් මෙන්ම විශ්‍රාමික, ක්‍රියාන්විත හේතූන් මත මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන් වෙනුවෙන් පවත්වනු ලබන බහුවිධ වෛද්‍ය සායනයක් මධ්‍යම පළාත ආවරණය වන පරිදි ඉකුත් ජූලි මස 30 වන දින දියතලාව ස්වේච්ඡා බලසේනා පුහුණු පාසල් පරිශ්‍රයේදී පැවැත්විණ. මේ සඳහා සාමාජිකයින් 2000ක් පමණ සහභාගී වූහ.

එහිදී, රණක්ෂිතයට පත් රණවිරුවන්ගේ සුභසාධන කටයුතු ඉහළ නැංවීම සඳහා අත්වැල්දෙමින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ පූර්ණ දායකත්වයෙන් අක්ෂි සායනයක් ද පවත්වන ලද අතර, එහිදී ඇස් කණ්ණාඩි 350ක් හා රෝද පුටු 20ක් ද පරිත්‍යාග කරන ලදී. තවද, එහි සියලු දෙනා වෙත දිවා ආහාරය පිරිනැමීමට ද යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සම්බන්ධීකරණයෙන් කටයුතු කෙරිණ.

# රෝද පුටු පරිත්‍යාගයක්





යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වෙන්ද්‍රිනි දිසානායක මහත්මියගේ මඟපෙන්වීම මත එම ඒකකය විසින් ඉකුත් ජූලි මස 17 වන දින රෝද පුටු පරිත්‍යාගයක් සිදුකරන ලදී. යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් එන්ඩීයූ පීඑස්සී අයිජී ගේ ප්‍රධානත්වයෙන් යුද්ධ හමුදා සේවා වනිතා කාර්යාල පරිශ්‍රයේ පැවති මෙම වැඩසටහන මඟින් 2009 මාර්තු මස 28 දින පුදුකුඩිඉරිප්පු ප්‍රදේශයේ දී රණක්ෂිතයට පත්ව දෙපා අහිමි වූ 8 බළඇණිය ගජබා රෙජිමේන්තුවේ විශ්‍රාමික කොමිෂන් නොලත් නිලධාරියෙකුට සහ 2000 සැප්තැම්බර් මස 17 දින යාපනය, සරසාලෙයි ප්‍රදේශයේදී මෝටාර් ප්‍රහාරයකින් දකුණු ඇස අහිමිව ශරීරයේ වම්පස කොටස අංශභාග තත්ත්වයට පත්වූ 9 බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරියකුට ප්‍රතිලාභ හිමිවිය. එහිදී, රුපියල් 700,000.00 බැගින් වටිනාකමින් යුත් රෝද පුටු දෙකක් පරිත්‍යාග කරන ලද අතර, එසේම, යුද්ධ හමුදා මූලස්ථානයේ කාර්යාල කාර්ය සහයකයකුගේ භාර්යාවගේ පියාට සහ හෘද රෝග යකින් පෙළෙන යුද සේවා ලේකම් ශාඛාවේ සිවිල් සේවක මහතකුගේ මවක් වෙනුවෙන් ද මෙහිදී රෝද පුටු පරිත්‍යාග කෙරිණ.

# විශ්‍රාම දිවියට පා තබන පෙරපාසල් ගුරුවරියන්ගේ සේවය ඇගයේ

දිවයින පුරා පිහිටි විරු කැකුළු පෙර පාසල් සහ දිවා සුරැකුම් මධ්‍යස්ථානයන්හි සේවයේ නියුතු නුදුරේදී විශ්‍රාම දිවියට පා තබන පෙර පාසල් ගුරුවරියන් අටදෙනකු වෙත උපහාර පිදීමේ උත්සවයක් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය විසින් ඉකුත් ජූලි මස 17 වන දින එම ඒකක කාර්යාල පරිශ්‍රයේදී පවත්වන ලදී. මෙම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වෙන්ද්‍රිනී දිසානායක මහත්මිය සහභාගි වූවාය.

එහිදී, කුඩා ළමුන්ගේ දැනුම වැඩිදියුණු කරමින් ඔවුන් හැඩගැස්වීම සඳහා එම ගුරුවරියන් වසර ගණනාවක් පුරාවට දැක්වූ දායකත්වය සහ කැපවීම වෙනුවෙන් සේවා වනිතා සභාපතිනිය සිය හෘදයාංගම කෘතඥතාව පළකළාය.



## ලේ දන්දීමේ වැඩසටහනක්



3 ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ සහ ඒ අවට රාජකාරී කරනු ලබන රණවිරුවන් 80කගේ සහභාගීත්වයෙන් සංවිධානය කෙරුණු ලේ දන්දීමේ වැඩසටහනක් ඉකුත් ජූලි මස 16 වන දින එම සේවා වනිතා ශාඛාවේ ප්‍රධානත්වයෙන් කඳවුරු පරිශ්‍රයේදී පැවැත්විණ.

## මූල්‍ය පරිත්‍යාගයක්



මහරගම අපේක්ෂා රෝහලෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන 10 ශ්‍රී ලංකා සංඥා බලකායට අයත් එෆ්12067 භෝජනාගාර සේවක එල්එම් චමිල මහතාගේ බිරිඳ වෙත රුපියල් 10,000ක මුදලක් ඉකුත් ජූලි මස 10 වන දින එම සේවා වනිතා සාමාජිකාවන්ගේ ප්‍රධානත්වයෙන් පිරිනැමිණ.

## සංවත්සරය සමරමින්



2 රෙජිමේන්තුව විශේෂ බලකාය එහි සේවා වනිතා ශාඛාව සමඟ එක්ව ජනකපුර ප්‍රාථමික විදුහලේ සිසුන් හට පාසල් ලිපි ද්‍රව්‍ය හා පෝෂ්‍යදායී දිවා ආහාර වේලක් පිරිනැමීමේ වැඩසටහනක් දියත් කළේය. එම බලකායේ 31 වන සංවත්සරය නිමිත්තෙන් මෙම සත්කාරය සිදුකෙරිණ.

## දානමය වැඩසටහනක්



මියගිය සහ ආබාධිත රණවිරුවන් සිහිපත් කරමින් අම්බලන්ගොඩ වරුසවිතාන වැඩිහිටි නිවාසය වෙත දහවල් දානය පිළිගැන්වීමේ වැඩසටහනක් සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා සාමාජිකා දිල්හානි ප්‍රියලාල් මහත්මියගේ ප්‍රධානත්වයෙන් සහ එම ශාඛාවේ සංවිධානයෙන් පසුගියදා සිදුකෙරිණ.

## හිසට සෙවණක්



ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛා නිවාස ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ ඉදිකරන ලද නව නිවසක් ඉකුත් ජූලි මස 16 දින 6 බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරියකු වෙත පවරා දෙනු ලැබීය. එම ශාඛාවේ සභාපතිනි දර්ශනී යහම්පත් මහත්මියගේ ප්‍රධානත්වයෙන් සිදුකළ එම නිවාස ව්‍යාපෘතිය සඳහා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ මූල්‍ය අනුග්‍රහය සහ 19 බළඇණිය පාබල හමුදා හටපිරිස්හි ශ්‍රම දායකත්වය හිමිවූහ.

## දිරිය දරුවන්ට අත්වැලක්



7 (ස්වේච්ඡා) ඉංජිනේරු සේවා රෙජිමේන්තුව යටතේ සේවයේ නියුතු යුද්ධ හමුදා සාමාජිකයන්ගේ සහ සිවිල් සේවක මහත්වරුවන්ගේ දූවා දරුවන් 22 දෙනකු වෙනුවෙන් ත්‍යාග වවුචර්පත් බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජූලි මස 05 වන දින එම ඒකක පරිශ්‍රයේදී පැවැත්විණ. මෙම අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි අනුපමා රත්නායක මහත්මිය සහභාගි වූවාය.

# සිවිල් සේවක මහතකු හට නව නිවසක්





ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාව මඟින් 12 වන ගැමුණු හේවා බලකායට අයත් සිවිල් සේවක බීජ් සිරිකුමාර යන අය වෙනුවෙන් ඉදිකළ නව නිවසක් ඉකුත් ජූලි මස 19 වන දින පරිත්‍යාග කරන ලදී. ගැමුණු හේවා බලකා බලකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීජේකේ විමලරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහ එම බලකා සේවා වනිතා ශාඛා සභාපතිනි දිල්රුක්ෂි විමලරත්න මහත්මිය මෙම අවස්ථාවට ප්‍රධානත්වය දැරූහ.

# රෙජිමේන්තු සේවා වනිතා නව සභාපතිනියන්



සේවා බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස අජන්තා ද සිල්වා මහත්මිය පසුගිය ජූනි මස 02 වන දින සිට පත්ව ඇත.




ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස ශිරානි විජේකෝන් මහත්මිය ඉකුත් ජූලි මස 09 වන දින සිට පත්ව ඇත.



යුද්ධ හමුදා පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස ඉරේෂි ප්‍රනාන්දු මහත්මිය ඉකුත් ජූලි මස 19 වන දින සිට පත්ව ඇත.



ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනි ලෙස ජී. අනුෂානි කුලතුංග මහත්මිය ඉකුත් ජූලි මස 02 වන දින සිට පත්ව ඇත.




1981 ඔක්තෝබර් මස 15 වන දින ත්‍රස්තවාදීන් විසින් සිදුකරන ලද වෙඩි තැබීමකින් ඉතිහාසයේ ප්‍රථම වරට යුද හමුදා සෙබළකු මියගියේය. යාපනය " කන්කසන්තුරේ" පාරේ ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි සැලක් ආසන්නයේ සිදුවූ එම වෙඩි තැබීමෙන් ඉංජිනේරු සේවා බලකායට අයත් සෙ/63480 ලාන්ස් කෝප්‍රල් හේවාවසම් එම්පීඩබ්ලිව් එසේ මියගිය ප්‍රථම සෙබළාය. එසේම, එම සිදුවීමෙන්ම තුවාලලත් යුද හමුදා පුරෝගාමී බලකායට අයත් සෙ/8232 ලාන්ස් කෝප්‍රල් තිසේරා එම්එම්ඩී යන සෙබළා රෝහල් ගතකිරීමෙන් අනතුරුව පසුදින ජීවිතක්ෂයට පත්විය. මීට වසර 44කට එපිටදී ත්‍රස්තවාදී ප්‍රහාරයක් හේතුවෙන් ප්‍රථමයෙන් මියගිය ඉහත සෙබළු දෙදෙනා පිළිබඳ ඉතා සීමිත තොරතුරක් යුද හමුදාව තුළ සටහන්ව ඇතත් ඒ පිළිබඳ වැඩි යමක් කිසිවකුත් නොදනී. කෙසේ නමුත්, එම සිදුවීම ත්‍රස්තවාදය හා සම්බන්ධව සලකා බැලීමේදී සන්ධිස්ථානයක් ලෙස සැලකිය හැකිය. එතැන් පටන් යුද හමුදාවට එරෙහිව ඇරඹුන ත්‍රස්තවාදීන්ගේ එම හුදකලා ඝාතන ක්‍රියාවලිය පසුකාලීනව ක්‍රමිකව වර්ධනය වී අඛණ්ඩ යුද්ධයක් බවට පත්ව දශක තුනක් තිස්සේ ඇදී ගොස් 2009 මැයි 19 වන දින අවසන් වූයේ 27000කට ආසන්න රණවිරු පිරිසකට දිවි අහිමි කරවමිනි.

ඉහත ප්‍රථමයෙන් මියගිය සෙබළා සේම ත්‍රස්තවාදය හමුවේ අවසානයට දිවිපිදූ  සෙබළකු ද වේ නම් ඔහු ද ඉතිහාසයට එක් විය යුතුවා සේම එම සිදුවීම ද යුද හමුදාවේ සන්ධිස්ථානයක් ලෙස සැලකිය හැක. එහෙත්, එලෙස මියගිය අවසන් සෙබළා කවුරුන්ද ඔහු මියගියේ කවදා කොතැනකදී ද යන්න මෙතෙක් කිසි තැනක නිරාවරණය වී නොතිබිණ. ත්‍රස්තවාදී ප්‍රහාරයකින් මියගිය එම ප්‍රථම සෙබළු දෙදෙනා සේම යුද භූමියේදීම අවසන් වරට ත්‍රස්ත ප්‍රහාරයකින් මියගිය අවසන් සෙබළු දෙදෙනාද පාදක කොට ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ කතුවරයා විසින් "අවසන් සටනේ මියගිය අවසන් සෙබළා" නමින් මෙම කෘතිය පාඨකයින් වෙත තිළිණ කොට ඇත්තේ දෙවසරක් තිස්සේ ඔහු ඒ වෙනුවෙන් කළ ගැඹුරු ගවේෂණයක ප්‍රතිඵලයකිනි.


ත්‍රස්තවාදී ප්‍රහාරයක් හේතුවෙන් යුදබිමේදී ප්‍රථමයෙන් මියගිය සෙබළා
කෝප්‍රල් හේවාවසම්


ත්‍රස්තවාදී ප්‍රහාරයක් හේතුවෙන් යුදබිමේදී දෙවැනියට මියගිය සෙබළා
කෝප්‍රල් තිසේරා


ත්‍රස්තවාදී ප්‍රහාරයක් හේතුවෙන් යුදබිමේදී අවසානයට පෙර මියගිය සෙබළා
කෝප්‍රල් රජිත කහවිට


ත්‍රස්තවාදී ප්‍රහාරයක් හේතුවෙන් යුදබිමේදී අවසානයට මියගිය සෙබළා
සැරයන් ජයසේකර


ත්‍රස්ත ප්‍රහාරයක් හේතුවෙන් තම ස්වාමියා අහිමිව ඉතිහාසයේ "ප්‍රථමවරට" වැන්දඹුවක් වූ කෝප්‍රල් තිසේරාගේ බිරිඳ ඩාලිං නෝනා


ත්‍රස්ත ප්‍රහාරයක් හේතුවෙන් තම ස්වාමියා අහිමිව "අවසන්වරට" වැන්දඹුවක් වූ කෝප්‍රල් ජයසේකරගේ බිරිඳ සුගන්ධිකා


බ්‍රි l ඒඑස් සේමපාල
එදා


බ්‍රි l ඒඑස් සේමපාල
අද

මීට 44 වසරකට එපිටදී ඉතිහාසයේ ප්‍රථමවරට ත්‍රස්තවාදී ප්‍රහාරයක් හේතුවෙන් යුද්ධ හමුදා සාමාජිකයින් දෙදෙනකු මියගිය අවස්ථාව සියැසින් දුටු අදට ද ජීවමාන සාක්ෂිකරු බ්‍රි l ඒඑස් සේමපාල



# “විඳවීම විඳීමක්” ලෙස තෝරාගත් ඔහු

“එයා මහ අපිළිවෙළ මනුස්සයෙක්. හැමදාම ඇන්දෙ පරණ ඇඳුම්. අපේ ගෙදර හිටපු කැතම කෙනා එයා. ගමනක් යන්න ගියත් සෙරෙප්පු දෙකක් දාන්න කිව්වට කවදාවත් දැම්මෙ නෑ. අපිත් එක්ක වන්දනා ගමනක් යන්න එන්නෙ නෑ. අඩුම ගානෙ පෝයකට පන්සලටවත් යන්න එයා අපිට චුට්ටක්වත් ආදරේ නෑ”

“ජීවිතය යනු විඳීම මිස විඳවීම නොව” එහෙත් හිත පතුලෙන් “විඳවීම විඳීමක්” ලෙස තෝරාගත් අපූරු චරිතයක් මටත් හිටියා. ඒත් ඒ අපූරු චරිතය මට තේරුම්ගන්න බැරිවුනා. සමහර වෙලාවට එයා නිසා කේන්ති ගියා. අවාසනාවට එයා මාව දාල ගියා “ඒ තමයි තාත්තා” මේ මතක දිගහැරුම “තාත්තා” නම් ඒ අපූරු චරිතය පිළිබඳවයි.

වර්තමාන සමාජයේ ජීවත්වන අතළොස්සක් දරුවන් විසින් තාත්තා නම් ඒ අපූරු චරිතයට නිගා කරන, නින්දා කරන අවස්ථා ඉඳහිට වාර්ථා වේ. අති ධාවනකාරී සමාජ රටාව තුල එදා පැවති සාරධර්මයන් කෙමෙන් වියැකෙන බව අමුතුවෙන් කිවයුතු නොවේ. වැදූ මව හැදූ පියා පාරට, මහලු නිවාසයකට හෝ බලු කූඩුවකට සීමාකරන සිදුවීම් පවා ඇතැම් තැනක අසන්නට ලැබෙන්නේ එලෙස ගුණධර්ම, සාරධර්ම පිරිහීම නිසා වන්නට ඇත.

ඇතැම්විට ලංකාවේ පවතින අධ්‍යාපන රටාව ද ඉහත තත්වයන්ට හේතුවක් වන්නට පුළුවන. විශේෂයෙන්ම එදවස පැවති දහම් අධ්‍යාපනය නිසාම දරුවන්ගේ සිත්තුළ දෙමාපියන් පිළිබඳ ඇතිවූයේ ධනාත්මක සිතිවිලි පමණක්ම බව පසක්කළ යුතුයි. එකල පාසල් අධ්‍යාපන ලද දරුවන් එයින් තම දැනුම වර්ධනය කරගත් අතර, අමතර පන්ති සඳහා යොමුවූයේ සතියේ දිනවල සවස හෝ සෙනසුරාදා දිනයේදී පමණකි. දෙමාපියන් ඉරිදා දින තම දරුවන් අනිවාර්යයෙන් දහම් අධ්‍යාපනය සඳහා යොමුකළ අතර, ඒ තුළින් ඔවුන් බලාපොරොත්තු වූයේ දරුවන්ගේ සමාජ සාරධර්ම වර්ධනය කිරීමයි. එහෙත් අද වනවිට එම අධ්‍යාපන ක්‍රමය සම්පූර්ණයෙන් වෙනස්ව පවතින අතර එයට ප්‍රධානතම හේතුව වී ඇත්තේ ඉරිදා දින ද දරුවන් අමතර පන්ති සඳහා යොමුකිරීමයි.

අම්මා මෙන්ම විට දරුවන් සතුටින් තැබීමට කැපවීම් කළේ, දුක් වින්දේ තාත්තානම් ඒ අපූරු චරිතයයි. පුතෙකුට තාත්තාගේ වටිනාකම, තාත්තා විඳි දුක, දැනෙන්නට නම් තමා පියෙකු විය යුතුමයි. තාත්තා කියන්නේම තමාට නැතත් දරුවන් පිළිවෙලට පිරිසිදුව ඉන්න දිහා බලාගෙන සිත පත්ලෙන් සතුටුවෙන උත්තරීතර චරිතයකි.

**දෑසින් බොහෝ දේ කියන, හිතින් බොහෝ බර උසුලන, හදවතින් ආදරය කරන, සිහිනෙන් දරුවන් සිඹින, තාත්තා නිහඬ දිය උල්පතකි කිසිදා නොසිඳෙන.**

ඔව් ඒ කතාව ඇත්තක්. දරුවකුට හයක් හතරක් නොතේරෙන කාලෙ තාත්තා විඳි දුක්ඛ දෝමනස්සයන් ඔවුන් උස්මහත් වූ කලට නොදැක්කා වෙන්න ඇති. ඒ ගැන සිතන්නට තරම්වත් කටුක ජීවිතයක් දරුවන්ට උරුමකර නොදෙන්නට ඒ අපූරු චරිතය වගබලාගන්න ඇති. සමහර විට තාත්තා එහෙම කළේ නැතිබැරිකම පෙන්වන්නට නොව දරුවන්ට ඇති ආදරය සෙනෙහස නිසාම ඔවුන්ගේ අඩුපාඩුකම් පමණක් සම්පූර්ණ කිරීම ඒ හදවතේ කොතැනක හෝ සැඟව තිබීම නිසා වෙන්න ඇති. අද සමාජයට තේමා වූ “ඔයයි මමයි දුවයි පුතයි... පුංචි පවුල රත්තරං” තේමාව එදා ජීවත් වූ දෙමාපියන් කිසිදා සිතුවේ නැත. එදා සිටි දෙමාපියන් සිතුවේ පොල් සම්බෝලයි බතුයි කාල හරි දරුවෙක් හැදුවොත් අනාගතය ලස්සන වෙයි යනුවෙන්ය.

නමුත් වර්තමාන සමාජය තුළ එම අහිංසක සිතුවිල්ලට පවා නිගා කරන දරුවන් නැතුවාම නොව. පිදුරු සෙවිලිකළ වහලයකට සීමාවූ කුස්සිය, ලෑලි වටකර තැනූ පුංචි කාමරය, කුඩා ඉස්තෝප්පුවකට එම ජීවිත සීමා වුවද එදා පවුලක දරුවන් 6ක් 7ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් නම් අනිවාර්යයෙන් සිටි බව දනිමි. ඒ කෙසේ වුවද තම දරුවන් සියලු දෙනාටම එකහා සමානව ඕනෑ එපාකම් සොයාබැලීමට ඔවුහු කටයුතු කළහ. එකල අතලොස්සක් හැරෙන්නට බොහෝ ගැමියන්ගේ එකම රැකියාව වූයේ ගොවිතැනය. සමහර විටෙක හැඳුනුම්පතෙහි ද රැකියාව ලෙස සඳහන් වූයේ ගොවිතැනයි.

ඒ හැරෙන්නට ඔවුනට පුංචි හෝ මුදලක් අත මිටමොලවා ගැනීමට කරන්නට තිබූ එකම රස්සාව වූයේ කුලී වැඩ පමණකි. ඒ අතර අනෙකුත් සියලුම අවශ්‍යතාවන් සපුරා ගන්නා ලද්දේ පෙර කී කුලී රස්සාවෙන් පමණකි. ඉන් හොයාගත් සොච්චමෙන් දරුවන්ගේ ඕනෑ එපාකම් පමණක් සිදුකරන්නට පෙළඹුන තාත්තානම් ඒ අපූරු චරිතය පරණ ඇඳුම් ඇන්දේ දරුවන්ට අලුත් ඇඳුම් ලබා දී ඔවුන්ගේ සතුට දැකීම සඳහාම පමණක් නොවේද?

"තාත්තගෙන් ගුටිකාපු නිසා පොලිසියෙන් ගුටි කෑවෙ නෑ!"

සමස්තයක් ලෙස ඔහු තම දරුවන්ට ද ආදරණීය පියෙක් විය. නමුත්, දරුවන්ගේ දඟකාරකම් හෝ නොමනා ක්‍රියා වෙනුවෙන් නම් ඔහුගෙන් කිසිදු සමාවක් හිමි නොවීය. ඔහුගේ තරවටුවේ තරම දන්නා නිසාම වැරදි නොකරන්නට වගබලා ගැනීම තුළින් ද දරුවන් ඉගනගත්තේ පාඩමකි.

ඇතැම් විටෙක තාත්තා හවසට ගෙදර එන වේලාවට දරුවන් කොතැනක හෝ මුල්ලක සැඟවූ අවස්ථා ද තිබූ අතර එයින් ද කියවුනේ තාත්තාට ඇති බිය හා ගරුත්වය බව නිසැකය.

තාත්තා යනු දියණියකගේ පළමු ප්‍රේමය සේම පුතෙකුගේ වීරයා බව යළි යළිත් පසක් කළ යුතු නැත. එදවස තාත්තා තම පවුල වෙනුවෙන් කල වැඩ කන්දරාවෙන් අල්ප මාත්‍රයක්වත් අපට කරගත නොහැකි බව සත්‍යයකි. හේනේ කුඹුරේ වැඩ හැරෙන්නට දරුවන්ගේ ඕනෑ එපාකම් සපුරාලීම වෙනුවෙන් කුමක්හෝ දැනේ රස්සාවකට යොමුවීමට ඔහු දැරූ වෑයම සුලුපටු නොවීය. විටෙක තාත්තා අතට ගන්නා බත්පත පවා තම දරුවන්ට කවා සතුටු වන වාර අනන්තය. පුතෙකුට තාත්තා විඳ දුක සිහිකෙරුමට හොඳම පාඩම පිය පදවිය බවට සැක නැත. අවාසනාවට ඒ අතීත මතකයන් මෙසේ මසිත දවද්දී මගේ තාත්තාද දෑස් පියාගෙන දස වසරකට ආසන්නයි.

තාත්තා ඉන්න ගොඩක් අයට තාත්තා ගැන අගයක් නෑ, වටිනාකමක් නෑ, දුක කියන දේ තේරුම්ගන්න බෑ, ඒත් තාත්තා නැති කෙනෙක්ගෙන් තාත්තා ගැන අහපන්. ඌට අඩන්න කඳුළුත් මදිවෙයි. ඒ තරම් වටිනවා "තාත්තා".



**සැරයන් අබේසිංහ ආර්පීකේජීඑස්සී**

11 ශ්‍රීලංජාආබමු
ජනමාධ්‍ය හා මවිමෙඅම

# Big Five Personality දැනගමු

පෞරුෂය අප සිතන, දැනෙන සහ හැසිරෙන ආකාරය හැඩගස්වන අතර, අපගේ වෘත්තීන්හි සිට අපගේ සබඳතා දක්වා සියල්ලට බලපෑම් කරයි. සෑම පුද්ගලයෙකුටම ඔවුන්ටම ආවේණික පෞරුෂත්වයක් තිබේ. මෙම පෞරුෂය මැනීමේ ක්‍රමවේද අතුරින් Big Five ආකෘතිය මිනිසාගේ හැඩගස්වන පුළුල් මානයන් පහක් විස්තර කරයි. මෙම ගති ලක්ෂණ මනෝවිද්‍යාඥයින්ට සහ පර්යේෂකයන්ට මිනිසුන් ඔවුන්ගේ සිතුවිලි, හැඟීම් සහ හැසිරීම් වලින් වෙනස් වන ආකාරය තේරුම් ගැනීමට උපකාරී වේ. ගති ලක්ෂණ පහ නම්:

මූලික ලක්ෂණ පහ

## 1. Openness to Experience

විවෘතභාවයෙන් යුතුවූවන්: මෙම පුද්ගලයින් පරිකල්පනීයයන් ය, කුතුහලයෙන් යුතු මොවුන් හා නව අදහස් සඳහා සෑමවිටම විවෘත ය. ඔවුන් නිර්මාණශීලී වීමට නැඹුරු වන අතර නව අත්දැකීම් හඹායෑමට ප්‍රිය කරයි.

## 2. Conscientiousness

මේ පුද්ගලයින් සංවිධානාත්මක ක්‍රියා ඇත්තන් ය. විනයගරුක සහ ඉලක්කගත ක්‍රියාවලින් අනුගමනය කරන ඔවුන් විශ්වාසදායකයන් ය. ඉදිරි සැලසුම් යුතුවූවන්ය.

## 3. Extraversion

මෙවැනි පෞරුෂත්වයන් යුතුවූවන් සමාජ තුළ කැපී පෙනෙන අයවලුන්ය. අන්අයගේ අවධානයට ලක්වීමට කැමැත්තන් ය. සමාජශීලින්ය.

## 4. Agreeableness

මෙම පුද්ගලයින් දයානුකම්පිතයින් ය, එමෙන් ම ඔවුන් විශ්වාසවන්ත සේම සහයෝගීමත් අයවලුන් ය. ඔවුන් සමගිය අගය කරයි, ගැටුම් වළක්වා ගනී, සහ බොහෝ විට කරුණාවන්ත සහ සංවේදී ලෙස සැලකේ.

## 5. Neuroticism

මෙම පෞරුෂත්වයන් යුතුවූවන් දැඩි චිත්තවේගීය අස්ථාවරත්වයන්, කාංසා සහ මනෝභාවයන් වෙනස්වීම් අත්විදිමට ප්‍රවණතාවයකින් යුතුවූවන් ය. ඔවුන් ආතතිමය අවස්ථාවන්හි අන් අයට වඩා සංවේදී විය හැකි අතර පහසුවෙන්ම කනස්සල්ලට ගොදුරු විය හැකිය.

මේ පිළිබඳව සවිස්තරාත්මකව අප ඉදිරි කලාපයන් හි සාකච්ජා කරමු.

**▪ රාධිකා සීඑල්**
*Ambassodor of Education (Spelizes in Translation) Sworn Translator, language Facilitator, Justice of Peare (WI)*




## ආරම්භය රසයි අවසානය දුකයි

# ඔන්ලයින් මාරයා වසයි

මචං... නියම ඇප් එකක් තියෙනවා මං ළඟ. ඒකට පොඩි ගාණක් දාලා ලොකු ගාණක් අතට ගන්න පුළුවන්. මමත් ගත්තා. උඹටත් මේක හදල දෙන්නද සෙල්ලම් කරන්න? මේ ලිපිය කියවන ඕනෙම කෙනෙක්ට මේ මොකක් ගැනද කියන්නේ කියලා හිතාගන්න පුළුවන් නේද? සමහරු මේක දැනටමත් කරනවා ඇති. තවත් කෙනෙක් කරන්න බලාපොරොත්තුවෙන් ඇති. එහෙමත් නැත්නම් මේක කරලා අන්තෙටම හිදිලත් ඇති. කොහොම උනත් මේ ලිපිය දකින, කියවන එක් පුද්ගලයෙක් හෝ මේ උගුලෙන් ගැලවේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

ඉස්සර වගේම අද වනවිටත් අපේ හමුදාවේ සහෝදර සොල්දාදුවෝ විවිධ දේවල්වට ඇබ්බැහිවීමේ සහ නැඹුරුවීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබුණා. මුල් කාලේ තිබුණේ අරක්කු, සිගරට් භාවිතයට පෙළඹීමක්, ඊට පස්සේ පියවරෙන් පියවර විවිධ මත්ද්‍රව්‍යවලට, නීතිවිරෝධී ක්‍රියාවන් සඳහා යොමුවීම මෙන්ම පාතාල ක්‍රියාකාරකම් සඳහා සම්බන්ධවීමේ වැඩි ප්‍රවණතාවයක් දකින්නට ලැබුණා. නමුත්, වර්තමානය විට ඒ සියල්ල අභිබවමින් එක් කරුණක් ගැන යුද්ධ හමුදාව තුළ මෙන්ම සිවිල් සමාජය තුළ කතාබහට ලක්වුණා. ඒ තමයි අන්තර්ජාල සූදුව කියන මාතෘකාව.

ඔන්සලයින් සූදුව, ඔන්ලයින් ගේම්, ජංගම කැසිනෝ යන විවිධ අනුවර්ථ නම්වලින් හඳුන්වන මෙම ක්‍රීඩාව වර්තමානය වන විට සමාජය තුළ බෙහෙවින් ප්‍රචලිත වී තිබෙනවා. අතපය, මනස වෙහෙසන්නේ නැතිව හරි ලස්සනට සල්ලි හොයන්න පුළුවන් ක්‍රමයක් නිසා බහුතරයක් මේ සූදු ක්‍රිඩාවට යොමු වී තිබීම විශේෂ කරුණක්. ඒ වගේම මේ ඔන්ලයින් ණය පහසුකම් ලබාදෙන විවිධ සමාගම් රැසක් පවත්වාගෙන යන බවට කරුණු සොයාගෙන තියෙනවා.

### ඔන්ලයින් සූදු වර්ග කීයක් තියෙනවද? ඒ මොනවාද?

1. කැසිනෝ සූදු (Online Casinos) : Roulette, Blackjack, Poker, Slot Machines වැනි සූදු ක්‍රීඩා.

2. ක්‍රීඩාවන් මත ඔට්ටු දැමීම (Sports Betting) : ක්‍රිකට්, පාපන්දු, තුරඟ තරඟ සහ තවත් ක්‍රීඩා ක්‍රියාකාරකම් ආශ්‍රිතව මූල්‍යමය ඔට්ටු ඇල්ලීම.

3. Live Casino Games : සජීවී බිම් මත, නොහොත් රාත්‍රී සමාජ ශාලා තුළ ක්‍රීඩාකරුවන් සමඟ මුහුණට මුහුණ සූදු ක්‍රීඩා කිරීම.

4. Lottery සහ Bingo: වාසනාව මත පදනම් වූ ව්‍යාපාරික ක්‍රීඩා.

5. Virtual Sports : පරිගණකයෙන් සිදුකරන ක්‍රීඩා සිදුවීම් මත ඔට්ටු ඇල්ලීම.

### යම් කෙනෙකු ඔන්ලයින් සූදුවක් ප්‍රථමයෙන් හඳුනාගන්නේ කොහොමද?

1. මුහුණුපොත්වල පළකරනු ලබන ආකර්ෂණීය දැන්වීම් මඟින්.

2. මිතුරෙකු මාර්ගයෙන්.

3. විවිධ රූපවාහිනී ක්‍රීඩා නාලිකා ඔස්සේ පලකරනු ලබන දැන්වීම් මඟින්.

4. දුරකථනයට අහඹු ලෙස පැමිණෙන කෙටි පණිවිඩ මඟින්.






විවිධ ක්‍රීඩා ඇසුරෙන් නිර්මාණය වූ ඔන්ලයින් ක්‍රීඩා සබැඳිව පළ වූ දැන්වීම්

**ඒ ආකාරයට Online ඇප් එකකට යොමු වූ පුද්ගලයාට අත්වන ඉරණම කුමක්ද? මෙන්න උදාහරණයක් වශයෙන් මා පෙන්වා දෙන්නම්.**

කසුන් නම් 25 හැවිරිදි තරුණ සෙබළා අන්තර්ජාලයෙන් අමතර ආදායමක් උපයා ගැනීමට උත්සාහ කළා. එක දවසක් ඔහුට ෆේස් බුක් App එකක් දිස්වුණා. සරල වැඩ, ඉක්මන් මුදල්. Task එකක් කරලා රුපියල් 500.00ක් හොයන්න. ඉතිං ඔහු Whatsapp Group එකට සම්බන්ධ වුණා. ඊට ආකර්ෂණය වැඩි කරමින් Mr. රවී Task Manager කියන පුද්ගලයා මෙලෙස පැවසුවා. Task එකක් කරන්න. රුපියල් 500.00ක් දිනන්න. වැඩි Task, වැඩි මුදල්. කසුන්ට මෙය සැකසහිත උනත් ඔහු උත්සාහ කළා. මුලදී රුපියල් 500.00 සහ 2000.00 වැනි ගණන් ලැබුණා. ඔහුට ලැබුන Task එක උනේ අන්තර්ජාලයෙන් භාණ්ඩ විකුණන්න. ඊට පස්සේ විශේෂ අවස්ථාවක් කියලා මැසේජ් එකක් ආවා. VIP Membership Task එකකට රුපියල් 5000.00ක් යි. පෙර ගෙවීම් රුපියල් 10000.00 ක් තැන්පතු ලෙස තබන්න. කසුන් මුදල් තැන්පත් කළා. මෙවර කසුන් VIP Membership එකට උසස්වීම් ලැබුවා. ඉන් පසු ඔහුට ලැබුණු පළමු Task එක සම්පූර්ණ කළා. එවිට ඔහුගේ ගිණුමට Profit එක සමග රුපියල් 15000.00ක් බැර වුණා. කසුන්ගේ විශ්වාසය තවත් වැඩි උණා. ඉන්පසු මුදල් ලබාගැනීමට නම් ඊලඟ Task එක සම්පූර්ණ කරන ලෙස දැනුම් දුන්නා. ඒ සඳහා මුදල් මදි වූ විට ඔහු නැවත රුපියල් 10000.00ක මුදලක් තැන්පත් කර ඊළඟ සම්පූර්ණ කළා. එවිට ඔහුගේ ගිණුමේ මුළු මුදල ලෙස රුපියල් 30,000.00ක් දිස්වුණා. ඔහු එම මුදල් යොදවා ඊළඟ Task එක සම්පූර්ණ කරන්න උත්සාහ කළ නමුත්, ඒ සඳහා මුදල් ප්‍රමාණවත් උනේ නැහැ. ඔහු නැවත රුපියල් 20,000.00ක් තැන්පත් කළා. හැබැයි ටික වෙලාවකින් whatsapp Group එක අතුරුදහන් උනා. Mr රවීව කාටවත් සම්බන්ධ කරගන්න බැහැ. අනිත් සියලුදෙනාමත් Block. කසුන් රැවටිලා. තණ්හාවට වැඩි මුදලක් හොයන්න ගිහින් අතේ තිබ්බ හැම සතේම අහිමි කරගත්තා. මෙන්න මේකයි Online සූදුවේ අවසන් ප්‍රතිඵලය.

**මේ සියලු හේතූන් ඇතිවීමත් සමඟ සොල්දාදුවාගේ දිවි පැවැත්මට ළඟාවිය හැකි අයහපත් අතුරු ප්‍රතිඵලයන් මොනවාද?**

1. ඔන්ලයින් සූදුව වෙනුවෙන් කාලය වැයකළ සෙබළාට රාජකාරී කාලසීමාවත්, විවේකී කාලසීමාවත් අහිමි වේ.

2. මුදල් අඟහිඟකම්, ණය ගැටලු හමුවේ ජීවන වියදම් පවත්වාගෙන යාමේදී ගැටලු ඇතිවේ.

3. දෙමව්පියන්, බිරිඳ සහ දරුවන් ද සමාජය ඉදිරියේ ණයකරුවන් වීම සහ ඔවුන් වෙනුවෙන් ඉටුකළ යුතු යුතුකම් හා වගකීම් අතපසුවීම සිදුවේ.

4. ණයකරුවෙකු වීම හේතුවෙන් සමාජය ඉදිරියේ දෝෂාරෝපනයට, අවමානයට සහ සමච්චලයට ලක්වේ.

5. මුදල් අඟහිඟකම හේතුවෙන් විවිධ වංචනික ක්‍රියාවන් සඳහා යොමුවීම හා ඒ හේතුවෙන් නීතියේ රැහැනට හසුවීම.

6. සමාජයෙන් කොන්වීම සහ විශ්වාසය අහිමිවී යාම.

7. මේ සියලුම කරුණු හමුවේ කායික මෙන්ම මානසික වශයෙන් ඇදවැටීම හේතුවෙන් සියදිවි නසාගැනීමට පෙළඹීම.

## Online සූදුවෙන් බේරෙන්නේ කොහොමද?

1. Online සූදුවලට පිවිසෙන ඔබේ ජංගම දුරකථනයෙහි ඇති වෙබ් අඩවි සහ සමූහයන් (Group) අවහිර (Block) කරන්න.

2. Online සූදු ක්‍රීඩාවන්හි නිරතවන මිතුරන්ගෙන් ඈත්වන්න.

3. වැටුප් කළමනාකරණය තුළින් නිරවුල් ජීවන රටාවක් හැඩගස්වා ගන්න.

4. ඔබේ රැකියාවට අමතරව ස්වයං රැකියාවලට යොමුවන්න.


5. Online සූදුවට ඇබ්බැහිවීම වළක්වා ගැනීමට ඔබේ මිතුරන්ගේන් හෝ පවුලේ සමීපතයින්ගේ උපදෙස් ලබාගන්න.

6. නැතහොත් මනෝ වෛද්‍යවරයෙකුගේ උපදෙස් ලබාගන්න.

7. Online සූදුවට ඇබ්බැහි වී සිටින ඔබේ මිතුරන් හට එහි ඇති අම්හිරි බව පසක් කරමින් ඔවුන් එයින් මුදවා ගැනීමට කටයුතු කරන්න.

ඔන්ලයින් සූදුවට ඇබ්බැහි වීම යනු මත්ලෝලීභාවය වගේම ක්‍රියාවලියක්. මේ සූදුවට ඇබ්බැහිවූවන්ට මුදල් විශාල ප්‍රමාණයක් අහිමි වුවත්, තමන්ට අහිමි වූ දෙය ආපසු ලබාගැනීමේ චේතනාවෙන් තව තවත් එම සූදුවේ නියැලීමේ ආශාවෙන් පසුවෙනවා. ඉතිං තවත් ඇයි ඔබ දැන දැන අමාරුවේ වැටෙන්නේ. රණවිරු ඔබ වෙනුවෙන් ඔබට හිමිවන මාසික වැටුප අන්තර්ජාල වංචාකාරයින් වෙනුවෙන් පරිත්‍යාග කරන්නේ ඇයි? මේ ලිපිය කියවන ඔබ තවත් පරක්කු නැහැ. Online සූදුවට තිත තියන්න ඔබටත් පුළුවන්. ඔන්ලයින් ඇප් සහිත සියලුම දේවල් ඔබේ ජංගම දුරකථනයෙන් සදහටම අයින්කරලා දාන්න. එතකොට වෙනදාටත් වඩා පුදුම සැහැල්ලුවක් ඔබේ මනසටත්, පසුම්බියටත් දැනේවි.


■ කෝප්‍රල්
කුමාරසිංහ එම්ජීඒඑම්
11 ඉංජේරෙ
ජනමාධ්‍ය හා මව්මෙ අම



# අහෝ දුකකි පිරමීඩ උගුලකි

අද මුදල් ඉපයීමට ලෙහෙසිම ක්‍රමයක් ලෙස මවාපාන නමුත් අපිට මුදල් ඉපයීමට ඉතා අමාරු, අපගේ හුදු වාසිය වෙනුවෙන් අහිංසක මිනිසුන් දහස් ගණනක් අමාරුවේ දැමීමට සිදුවන, අවසානයේ තමන්ට හිමි සියල්ලමත් අහිමි වී හිරබත් කෑමටද සිදුවන ව්‍යාපාරයක් තමයි මේ පිරමීඩ ව්‍යාපාර. මේවා එක් අයකුගෙන් පටන්ගෙන පහළට පිරමීඩයක් ලෙස විවිධ මට්ටම් වලට පුද්ගල පුරුක් අමුණා ගෙන ඔවුන්ගෙන් සම්බන්ධක ගාස්තු හෝ භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට සැලැස්වීම මඟින් හෝ මුදල් එකතු කරන ආයතන ලෙස ක්‍රියාත්මක වෙනවා. ඔබේ හොඳම මිතුරා හෝ ළඟ හිතවතෙක් තමයි ඔබව මුලින්ම මේ කරදරේ පටලවන්නේ. මොකද එම තැනැත්තා මුලින්ම මේ බොරුවට අහුවෙලා ඉන්නේ.

මේ පිරමීඩ ක්‍රියාත්මක වන්නේ ආයෝජන හෝ ව්‍යාපාර යෝජනා ක්‍රම ලෙස. ශ්‍රී ලංකා මහ බැංකුව පෙන්වා දෙන ආකාරයට, මෙහිදී ප්‍රතිලාභ ලබන ක්‍රම දෙකක් තියෙනවා.

1. මෙම යෝජනා ක්‍රමයේ සාමාජික සංඛ්‍යාව වැඩිවීම මත,

මෙහිදී කරන්නේ මම සම්බන්ධ වූවා නම් මම තව දෙදෙනකු හෝ කිහිප දෙනෙකු මේකට සම්බන්ධ කිරීම හා ඉන්පසු මා සම්බන්ධ කළ අය තවත් සාමාජිකයන් සම්බන්ධ කිරීමයි.

2. යෝජනා ක්‍රමයේ අරමුදල් ප්‍රමාණය එනම් සම්බන්ධ වන පුද්ගලයින් ගෙවන මුදල් ප්‍රමාණය වැඩිවීම මත හෝ බොහෝ දුරට තීරණය වන්නා වූ ක්‍රමයක් මත.


## කොහොමද මේවා ක්‍රියාත්මක වෙන්නේ?

මේ ව්‍යාපාර විවිධ ස්වරූප වලින් ක්‍රියාත්මක වෙනවා. සමාජ සේවා ආයතන ලෙස, භාණ්ඩ හා සේවා අලෙවි කරන ආයතන ලෙස හෝ කෙලින්ම මුදල් ආයෝජනය කරන ව්‍යාපාර ලෙස පෙනී සිටිනවා. කෙසේ ක්‍රියාත්මක වූවත් මේවා සියල්ල නීති විරෝධී ව්‍යාපාර. ඒ නිසා මේවාට සම්බන්ධ වන අපිත් නීති විරෝධී ක්‍රියාවකට සම්බන්ධ වෙනවා.

## මොනවද මේ ආයතන?

ලංකාව තුළ මෙම පිරමීඩ ක්‍රම ගොඩාක් ක්‍රියාත්මක වුණා. සමහක් පිරමීඩ ව්‍යාපාර මේ වන විටත් නීතියේ රැහැනට හසුවී හමාරයි. නමුත් මේ වන විට නීති වලින් කපටි ලෙස රිංගා යමින් මෙම ජාවාරමේ නිරත වන ආයතන පවතිනවා. මෙම ආයතනවලට සාමාජිකයින් බඳවාගන්නා ආකාරය පිළිබඳව කෙටි විස්තරයක් බලමු. මේ සාමාජිකයින් මුලින්ම මේ ආයතනයට මූලිකව මුදලක් ලබාදී භාණ්ඩයක් හෝ සේවාවක් ලබාගන්න ඕනි (රු.10,000ක් වටිනා භාණ්ඩයකට රු.60,000කට අධික මුදලක් ගෙවමින්). මේ භාණ්ඩ හෝ සේවා තවත් පුද්ගලයින් දෙදෙනෙකුට විකිණීම මඟින් තමා වැය කල මුදල ඉපයීමට උත්සාහ ගන්නවා. මේ හරහා බොහෝ පිරිසක් මේ භාණ්ඩ හෝ සේවා මිලදී ගන්න පොළඹවා ගැනීම මත පිරමීඩාකාර ක්‍රමය ගොඩනඟා ගන්නවා.

තමාගෙන් වැයවූ මුදල උපයාගැනීම සඳහා බොරු සුරංගනා ලෝකවල් මවාපාමින් තමන්ගේ හොඳම යාලුවාව විතරක් නෙමෙයි තමන්ගේ දෙමාපියන්ව නෑදෑයින්ව උනත් මෙම පිරමීඩයේ පුරුක් පිරවීම සඳහා ඔවුන් විසින් ඉතා ආත්මාර්ථකාමී ලෙස භාවිතා කරනවා. නමුත් මාස කිහිපයක් ගත වූවාම තමයි ඔබට අවබෝධ වන්නේ තමන්ගේ මුදලුත්, ශ්‍රමයත්, කාලයත් හිතවතුනුත්




> **තමාගෙන් වැයවූ මුදල උපයාගැනීම සඳහා බොරු සුරංගනා ලෝකවල් මවාපාමින් තමන්ගේ හොඳම යාලුවාව විතරක් නෙමෙයි තමන්ගේ දෙමාපියන්ව නෑදෑයින්ව උනත් මෙම පිරමීඩයේ පුරුක් පිරවීම සඳහා ඔබ විසින් ඉතා වංචාකාරී ආකාරයෙන් භාවිතා කරනවා. නමුත් මාස කිහිපයක් ගත වූවාම තමයි ඔබට අවබෝධ වන්නේ තමන්ගේ මුදලුත්, ශ්‍රමයත්, කාලයත් හිතවතුනුත් මෙම පිරමීඩ ජාවාරම මඟින් තමන්ට අහිමි කරලා අවසානයි කියලා. නමුත් ඒ වන විට ඔබ ප්‍රමාද වැඩියි.**

මෙම පිරමීඩ ජාවාරම මඟින් තමන්ට අහිමි කරලා අවසානයි කියලා. නමුත් ඒ වන විට ඔබ ප්‍රමාද වැඩියි.

මේ ආයතන මුලින්ම කරන්නේ මෙවන් පුද්ගලයන් කිහිප දෙනකු එකතු කරගෙන වැඩමුළු සහ දේශන පැවැත්වීමයි. මේ දැනුම්වත් කිරීමේ දේශන හරහා අපිට කිසිම අවශ්‍යතාවයක් නැති කිසි වැදගැම්මකට නැති භාණ්ඩයක් තමයි විකුණන්නේ. ඒකත් වෙළඳපලේ මිලට වඩා වැඩි මිලක තමයි විකුණන්නේ. මේ විදිහට භාණ්ඩ විකිණීමේ දාමයේ අවසානය කුමක්ද? ඔබ දන්නවාද? මේ විදිහට පහළට සාමාජිකයෝ බඳවාගැනීම කරගෙන යනවිට අපේ ලංකාවෙ ජනගහනය වන කෝටි දෙක ස්තර නැත්තම් තට්ටු පනහක් (50) විතර යද්දී ඉවර වෙනවා.

## Brain Wash - මොළ සේදීම

මෙම ආයතනයේ මූලිකම වෙළෙඳ උපක්‍රමය තමයි සාමාජිකයින්ගේ මොළ සේදීම නොහොත් Brain Wash කිරීම. මේ සඳහා විවිධ වැඩමුළු පවත්වමින් විශාල මුදලක් මෙම ආයතනය වැය කරනවා. එක්දින වැඩමුළු මෙන්ම දින කිහිපයක වැඩමුළුද මොවුන් විසින් පවත්වනවා. මෙම වැඩමුළු වලින් එළියට පැමිණෙන්නේ මුදල් ඉපයීම වෙනුවෙන් එනම් පිරමීඩයේ තම පුරුක් සම්පූර්ණ කර ගැනීම වෙනුවෙන් ඕනෑම ආකාරයේ ක්‍රියාවක් කිරීමට පෙළඹෙන පුද්ගලයෙකි.

## බොරු කීම සහ සුරංගනා ලෝක මවා පෙන්වීම

මෙම ආයතන වල වැඩමුළු වලට සහභාගී වූ අයගේ ප්‍රධානම ලක්ෂණයක් තමයි යථාර්තයෙන් තොර බොරු කීම හා සුරංගනා ලෝක මවා පෙන්වීම. ඔවුන් විසින් ඉතාමත්ම වංචාසහගත ලෙස තමාගේ ළඟම යාලුවන්ව, නෑදෑයින්ව මෙන්ම හිතවතුන්ව විවිධ බොරු කතා කියමින් සුරංගනා ලෝක වල  අතරමන් කරවනවා. ඔවුන් ප්‍රකාශ කරනුයේ මුදල් ඉපයිය හැකි හොඳම පහසුම ක්‍රමය මෙය බවයි. එමෙන්ම Ferrari car එකක් මිලදී ගැනීමේදී ආයතනය මඟින් 50%ක මුදක් ලබාදෙන බවයි. ඉතින් මුදලට ගිජු මිනිසුන් පහසුවෙන්ම මෙම ආයතනයේ ගොදුරක් බවට පත් වනවා. ආයතනයට නව සාමාජිකයින් බඳවා ගැනීම සඳහා ගමන් කිරීමට ඉන්ධන දහනය අඩු CT 100 මෝටර් බයිසිකලයක් මිලදී ගන්න යැයි කියන මොවුන් පිරමීඩයේ ඉහළ සාමාජිකයින් විසින් Ferrari වැනි මෝටර් රථ මිලදී ගන්නා බවට සාමාජිකයින් තුළ විශ්වාසයක් ඇති කරවා මෙම ජාවාරම පිළිබඳව විශාල ඇල්මක් හා උමතුවක් ඇති කරවනවා. මෙම උදාහරණයෙන් ඔබට තේරුම් ගන්න පුළුවන් මෙම ආයතන මතුපිටින් පෙන්වන දේ සැබෑ ලෙසම ක්‍රියාත්මක නොවන බව. මෙම ආයතන වල සාමාජිකයින් වංචාවෙන් ජීවත් වන පිරිසකි.

## ආදායම් ලබන්නේ කවුද?

මේ බොහෝමයක් ආයතන ලංකාවේ ආයතන නොවේ. මේවා පිටරට මහා පරිමාණ ව්‍යාපාරිකයින්ගේ මෙහෙයවීමෙන් ක්‍රියාත්මක වෙන්නේ. මේ ඔබ ගෙවන මුදලින් ප්‍රතිලාභ ලබන්නේ මේ ජාලයේ ඉහළම ඉන්නා පිරිස පමණයි. ඔබට ලැබෙන්නේ මුලාව පමණයි. මේ නීති විරෝධී ව්‍යාපාරවල නිරත වීම නිසා දඬුවම් ලබන පිරිස් ගැන ඔබ අහලා ඇති. ගෝල්ඩන් කී වැනි ආයතන වල පුද්ගලයින් මෙවැනි නීති විරෝධී ව්‍යාපාර වල යෙදී මේ වන විට නීතියෙන් වරදකරුවන් වී සිටින අයයි.

එම නිසා ඔබ දැනටමත් මෙම ජාවාරමට හසුවූ අයෙක් නම් ළඟම තිබෙන පොලීසියට පැමිණිලි කරන්න. යම් පුද්ගලයෙක් ඔබව මෙම ජාවාරමට සම්බන්ධ කර ගැනීමට පොළඹවනවා නම් ඔබට ඒ මොහොතේම පැමිණිල්ලක් යොමු කරන්නට පුළුවන්. ඔබ රවටලා අපේ මුදල් පිටරට පටවන මෙවන් ව්‍යාපාර පිළිබඳව මහ බැංකුව වැනි රජයේ ආයතන දැනුවත් කරන්න

ඔබ බුද්ධිමත් වන්න. මෙවන් වංචාවන්ට අසුවී මුලාවේ නොවැටෙන්න.



**ලුතිනන්**
**ඒබීඅයි**
**ලක්ෂිත**



> 1968 දී එවකට සිංගප්පූරුවෙහි අගමැති ලී ක්වාන් යූ විසින් දියත් කරන ලද Keep Singapore Clean ව්‍යාපාරය විසින් එරටෙහි පැවති බරපතල අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පැවති ගැටලු දූෂණ හා අපිරිසිදු ජීවන තත්වයන්ට සාර්ථක විසදුමක් ලැබිණ. එම ජයග්‍රහණය කරා ගමන්කිරීමේදී ඔවුන් හට මහජන දැනුම්වත්කිරීම් රජය විසින් පමුණුවන ලද දැඩි නීතිරීතින් පැනවීමට ද කාර්යක්ෂම අපද්‍රව්‍ය බැහැරකිරීමේ පද්ධති හඳුන්වාදීමට ද සිදුවිය. අන්තර් පුද්ගල සබඳතා වැඩිදියුණු කරමින් ස්වයං අභිවෘද්ධිය ළඟාකොට රජයට තිරසාර බව ළඟා කරගැනීමට ද හැකිවිය. එහි අවසන් ප්‍රතිඵලය ලෙස මෙම උත්සාහයෙන් සිංගප්පූරුව ලෝකයේ පිරිසිදුම රටවලින් එකක් බවට පරිවර්තනය විය.

CLEAN SRI LANKA
SOCIALLY . ENVIRONMENTALLY . ETHICALLY

# යුද්ධ හමුදාවේ දායකත්වය

ඒ අනුව පිරිසිදු පරිසරයක් සහ සදාචාර සම්පන්න සමාජයක් ඇතිකිරීම සඳහා දීපව්‍යාප්තව ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් අප රටෙහි ජනාධිපතිතුමන්ගේ සංකල්පයකට අනුව Clean Sri Lanka ජාතික ව්‍යාපෘතිය 2025 ජනවාරි මස 01 දින ආරම්භ කෙරුණේ ඉහත පරිද්දෙන් වූ සිංගප්පූරුවේ ක්‍රියාත්මක අතර ප්‍රතිපත්ති ආදර්ශයට ගනිමිනි. ඒ සඳහා සෘජුව දායකත්වයක් ලබාදීමට සමස්ත යුද්ධ හමුදාව එකලෙස කැපවී සිටිනුයේ ඒ වෙනුවෙන් ප්‍රායෝගික දායකත්වය ලබාදෙමිනි. ඒ




සඳහා වත්මන් යුද්ධ හමුදාධිපතිගේ මඟපෙන්වීම මත දීපව්‍යාප්තව සිදුකෙරෙන ක්‍රියාකාරකම් හරහා ජනතාවට දැනෙන තරමට ප්‍රතිලාභ මේ වනවිටත් හිමිව ඇත.

➢ පාසල් ප්‍රතිසංස්කරණ වැඩසටහන් යටතේ පාසල් 500ක ප්‍රතිසංස්කරණ කටයුතු සාර්ථකව අවසන් කොට ඇත.

මේ වනවිටත් අධ්‍යාපනික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ රට පුරා අධ්‍යාපන කටයුතුවල නිරත පාසල් සිසු සිසුවියන් වෙනුවෙන් අන්තර් අධ්‍යාපන වටපිටාවක් නිර්මාණය කිරීමේ අරමුණින් මෙම දැවැන්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරිණ. එහිදී, අබලන්ව පැවති මේස සහ පුටු 5500කට අධික ප්‍රමාණයක් අලුත්වැඩියා කිරීම, දිරාපත්ව පැවති වහලවල් නැවත සකස්කිරීම, පින්තාරු කිරීම සහ පාසල් ගොඩනැගිලි 300කට ආසන්න ප්‍රමාණයක් ඉදිකිරීමට ද කටයුතු කොට ඇත.

➢ අනුරාධපුර දුම්රිය ස්ථානය පිරිසිදු කිරීම.

4 ජාතික ආරක්ෂක බලමුළුව, 2 ඉංජිනේරු සේවා රෙජිමේන්තුව සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ශ්‍රම දායකත්වය ද ඇතිව අනුරාධපුර දුම්රිය ස්ථානය ප්‍රතිසංස්කරණය කිරීමේ සහ පිරිසිදු කිරීමේ වැඩසටහනක් 2025 මාර්තු මස 26 සිට 30 වන දින දක්වා පැවැත්විණ.

➢ නිල්වලා ගංඉවුර ප්‍රතිසංස්කරණය කිරීම.

2025 මාර්තු මස 13 දින ආරම්භ කෙරුණු Save Nilwala ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් අකුරැස්ස ප්‍රදේශයේ නිල්වලා ගං ඉවුරු පිරිසිදු කිරීම ද විශේෂය. යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් ප්‍රකාරව මෙහි දෙවන අදියර යටතේ නිල්වලා ගං ඉවුර මාසයක කාලසීමාවක් පිරිසිදු කිරීමේ වැඩසටහනක් ඉකුත් අප්‍රේල් මස 01 වන දින සිට මැයි මස 01 වන දින දක්වා පැවැත්වීමට ද කටයුතු කරන ලදී. දෛනිකව යුද්ධ හමුදා කණ්ඩායම් විසින් සිදු කරනු ලැබූ මෙම පිරිසිදු කිරීමේ කටයුතු නිසාවෙන් 2025 අප්‍රේල් මස 07 දින වනවිට එම ගඟ දෙපස ගං ඉවුරේ මීටර 850ක පමණ ප්‍රමාණයක් පිරිසිදු කරගැනීමට හැකි වී තිබිණ.

➢ තිරියාය වෙරළ සංස්කරණය වෙනුවෙන් යුද්ධ හමුදාවේ දායකත්වය ලබාදීම.

ශ්‍රී ලංකාවේ ස්වභාවික පරිසරය ආරක්ෂා කරගැනීම වෙනුවෙන් දරණ අඛණ්ඩ උත්සහයක් වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙතින් තිරියාය වෙරළ තීරය තුළ කැසුරිනා පැළ 2000ක් රෝපණය කිරීමේ දැවැන්ත ව්‍යාපෘතියක් දියත් කිරීම ඒ අතර විශේෂය. මෙහි ප්‍රථම අදියර 2025 මැයි මස 04 වන දින ඇරඹි අතර, එහිදී වෙරළ ඛාදනය හා පාරිසරික හානියකට බෙහෙවින් ගොදුරුවිය හැකි කලාපයක් ලෙස හඳුනාගෙන ඇති තිරියාය වෙරළබඩ තීරය තුළ කැසුරිනා පැළ 500 ක් රෝපණය කෙරිණ. එමගින් එම ප්‍රදේශය තුළ පවතින වැලි සහිත පස ඛාදනය වීම වැළැක්වීම සහ ගොඩබිම දෙසට හමා එන දැඩි සුළඟට බාධකයක් ලෙස ක්‍රියා කිරීමට හැකියාව ඇතිකිරීම තුළින් වෙරළ තීරය ආරක්ෂා කරගැනීමට මෙන්ම ප්‍රදේශයේ ජෛව විවිධත්වය ද රැකගැනීමට මෙහිදී හැකිවනු ඇත.

➢ දීපව්‍යාප්ත දෙදින පිරිසිදු කිරීමේ වැඩසටහන.

සාමාජීය, සාරධර්ම හා පාරිසරික යන තේමාවන් ඔස්සේ මෙහෙයවමින් යුද්ධ





හමුදා හටපිරිස් හි භෞතික පවිත්‍රතාවය හා ක්‍රමවත් බව මෙන්ම ධනාත්මක චින්තනය වර්ධනය කිරීමේ අරමුණින් මෙය සංවිධානය කරන ලදී. ඒ අනුව කසල කළමනාකරණය, අප ජල කළමනාකරණය හා රෝග වාහක මැසි මදුරු මර්ධනය සඳහා අවශ්‍ය ඉදිකිරීම් හා නවීකරණ කටයුතු යුද්ධ හමුදා හටපිරිස් විසින් සිදුකරණ ලදී. තවද, වඩාත් ක්‍රමානුකූල රාජ්‍ය සේවයක් සඳහා 5´S´ සංකල්පයට අනුව කඳවුරු පරිශ්‍රයක් පැවතිය යුතු ආකාරය මනා අවබෝධයක් හටපිරිස් වෙත ලබාදීම ද මෙහි අරමුණකි.

- **බණ්ඩාරවෙල පූනාගම ප්‍රදේශයේ අවතැන්වූවන් වෙනුවෙන් නව නිවාස ඉදිකිරීම.**

මීට වසර දෙකකට පෙර, බණ්ඩාරවෙල, පූනාගල ප්‍රදේශයේ ඇතිවූ නායයෑමක් හේතුවෙන් අවතැන් වූ පවුල් 50ක් සඳහා නව නිවාස ඉදිකරදීමේ ව්‍යාපෘතිය සඳහා ද ශ්‍රී ලංකා යුද්ධ හමුදා දායකත්වය ලබාදෙමින් සමාජ සවිබලගැන්වීම සහ සමාජ යහපැවැත්ම වෙනුවෙන් ක්‍රියා කිරීම. වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක කරනු ලබන මෙම ව්‍යාපෘතියෙහි නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ හටපිරිස් හි ශ්‍රම දායකත්වයද ලබාදෙනු ලබයි. මේ වනවිට ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය 2025 නොවැම්බර් මස අග වනවිට අවසන් කිරීමට නියමිතව ඇත.

- **දීපව්‍යාප්ත වෙරළ තීරය පිරිසිදු කිරීමේ වැඩසටහන.**

"පිරිසිදු වෙරළ තීරයක් - ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක්" යන තේමාව යටතේ ක්‍රියාත්මක වූ මෙම මඟින් ශ්‍රී ලංකාවේ පළාත් 5ක් තුළ පිහිටි දිස්ත්‍රික්ක 14ක තෝරාගත් වෙරළ තීරයන් 253ක් ආවරණය කරමින් පිරිසිදු කිරීමේ කටයුතු සිදුකරන ලදී. මීට සහය සඳහා ආරක්‍ෂක අංශ සාමාජිකයින් මෙන්ම පරිසර හිතකාමී දෙස් විදෙස් 20,000කට අධික පිරිසක් ද සහභාගී වී ඇති අතර, යුද්ධ හමුදා සාමාජිකයන් දස දහසකට අධික පිරිසක් ද සහභාගී වී ඇත. එමඟින් දිවයින වටා වෙරළ තීරය ආවරණය වන පරිදි වෙල්ලම්කුලම්, යාපනය, චුන්ඩිකුලම්, කෝකිලායි, කුමන, කුඩාවැල්ල, පුත්තලම දක්වා දිවයින වටා පිහිටි කිලෝමීටර් 1340ක වෙරළ තීරයක් පිරිසිදු කරමින් මුහුදට බැහැරවීමට ගිය ප්ලාස්ටික් බෝතල් කිලෝග්‍රෑම් 29,844ක්, අධි ඝනත්ව පොලිතීන් කිලෝග්‍රෑම් 6641ක්, ප්ලාස්ටික් ඇසුරුම් කිලෝග්‍රෑම් 3992ක් ලෝහ කෑන් කිලෝග්‍රෑම් 2735ක්, වීදුරු කිලෝග්‍රෑම් 1767ක්, රබර් කිලෝග්‍රෑම් 9057ක්, වෛද්‍ය අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් 147ක්, ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් 300ක් හා වෙනත් අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් 30,014ක් ලෙස ආසන්න වශයෙන් ටොන් 100ක පමණ කුණුකසල ප්‍රමාණයක් විධිමත් අයුරින් වර්ගීකරණය කර කසල බැහැර කරන අංගන වෙත යොමුකර ඇත.



ජනාධිපති ලේකම් කාර්යාලයේ සෘජු දායකත්වයෙන් පැවති මෙම වැඩසටහනේ සමාරම්භය යුද්ධ හමුදාධිපතිගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජූලි මස 29 වන දින උදෑසන මට්ටක්කුලිය කාකදූපතේ දී පැවැත්විය.

ඒ අනුව ජනාධිපතිතුමන්ගේ උපදෙස් අනුව යුද්ධ හමුදාධිපතිගේ මඟපෙන්වීම මත ක්‍රියාත්මක වනු ලබන "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" වෙනුවෙන් "දිනා දී මව්බිම තනා මඟ සුරකින" විරුවන්ගේ තවත් එක් මෙහෙවරකි.








▪ කපිතාන්
**ජමිලා හවන්ති**
1 ශ්‍රීලයුකාබ

# ජීවිතය දිනන්නට නම්,



ජීවිතය දිනන්නට ජීවිතය ජීවත් කරවිය යුතුය. ඒ සඳහා කායික හා මානසික යෝග්‍යතාවය ඉහළ වැදගත්කමක් ගනියි. සමබර ආහාර වේලක් ගැනීම, ශරීර සුවතා අභ්‍යාස, යෝග ව්‍යායාම ආදියේ යෙදීම තුළින් කායික යෝග්‍යතාවය ලබාගත හැකි නමුත්, මානසික ස්ථාවරත්වය ඇතිකර ගැනීම ගැටලුවක් වී ඇත.

මනුෂ්‍යත්වය, සංවේදීත්වය පදනම් කොට සරල දිවි පැවැත්මක් තුළින් ජීවිතය දිනීමේ මානසිකත්වය ගොඩනගා ගත යුතුය. අපිට හිමි, එනමුත් බහුතරය විඳවන මේ ජීවිතය දිනන්නේ කෙසේද? එය තරඟකාරී සමාජ ක්‍රමය හමුවේ පහසු වන්නේද?

තම පුද්ගලික ජීවිතය හා අනෙකාගේ ජීවිතය සංසන්දනය නොකිරීමට වගබලා ගැනීම වැදගත් කාරණාවකි. සාර්ථකත්වය, අසාර්ථකත්වය පුද්ගලිකව වපුරන ලද තරමේ ප්‍රතිඵලයක් විනා එය වෙනත් අයෙකු මත රඳා පවතින දෙයක් නොවේ. ඔබේ ජීවිතයේ ලද අත්දැකීම් තුළින් ඔබ වර්තමානයේ කිනම් ස්ථානයක සිටියද එය පුද්ගලිකව ලද ජයග්‍රහණයක් සහ සාර්ථකත්වයක් වෙයි. එබැවින් ජීවිතය දිනාගැනීමට නම් සුභවාදී දෘෂ්ටි කෝණයෙන් සියල්ල දෙස බැලි යුතු අතර, අසුභවාදීත්වය බැහැර කළ යුතුය.

වත්පොහොසත්කම්, තනතුරු ආදී හුදෙක් තාවකාලික දිනීමක් නොව සුවඳවත් ගුණාංග තුළින් සුපෝෂිත මනුෂ්‍යයා ජීවිතය දිනූ පුද්ගලයකු වේ. එකිනෙකාට උපකාර කිරීම, සමාව දීම, සවන්දීම, කාරුණිකත්වය තුළින් මිනිසා සදාතනික දිනූ තැනැත්තකු වෙයි.

සියල්ල වෙසන් වන නැතිවන තාවකාලික ලෝක ස්වභාවය තුළ ජීවිතය දෙස ආපසු හැරී බලනවිට දිනූ ජීවිතය යනුවෙන් ඉතිරිව ඇත්තේ සුවඳවත් මනුදම් ගුණ පමණි.

යථාර්තවාදී දෘෂ්ටියෙන් ජීවිතය දෙස බලන විට තරඟකාරීත්වය නැමැති සුළි සුළඟින් කලම්භනය වූ මනෝභාවයන්ගේ තාවකාලික තෘප්තිය නොව මනුෂ්‍යත්වය නමැති ගුණ මුහුදින් සුපෝෂිත වූ ජීවිතය දිනා ඇති බව සත්‍ය ලෙස සැදෑ සමයේ ප්‍රත්‍යක්ෂ වනු නොඅනුමානය.


වැටීම් නැගිටීම්, නින්දා අපහාස, හමුවීම් වෙන්වීම් දෙස නිහඬව බලා සිටින්න. කඳුළු සුසුම් තුළින් වේදනාව සමනය කර කාලයේ මිනුමට සියල්ල ඉඩදී බලා සිටින්න. වැටි වැටී නැගිටින අඬ අඬා සිනාසෙන ජීවිතය අවබෝධයෙන් ගතකරන්න. එය ජීවිතයේ ඇති සැබෑ දිනීම වේ.

කෙටි කාලයක් තුළ රඟන රඟ මඩලෙන් යම් දිනෙක නික්මෙන අප ආගම, ජාතිය කුමක් වූවත් සදාතනික සත්‍ය නම් සියල්ල තාවකාලික බව පමණකි. එබැවින් ජීවිතය දිනීම, පැරදුම වෙන කිසිවකු නොව ඔබම බුද්ධිමත්ව තීරණය කළ යුතුය.

**කපිතාන්**
**ඩබ්ලිව්ජී යදීෂා විනෝදනී**
**අභිමංසල,**
**කඹුරුපිටිය**




# තුරු මත රැඳි සිප් සෙවණක අසිරිය



## සිංහ රෙජිමේන්තු ප්‍රජාකේද්‍රීය පුස්තකාලය

දැනුමින් සන්නද්ධ පුද්ගලයින් සිටින රටක් නිතැතින්ම දියුණුවේ. ඇමරිකාව වැනි රටවල් අද ලොව අංක 01 බවට පත්ව ඇත්තේ සෑම ආකාරයෙන්ම ඔවුන් ලබා ඇති දැනුම පාදක කොට ගෙනය. ලොව දැනුම පිපාසයෙන් පෙළෙන යුගයක අප ද ජාතියක් ලෙස රටක් ලෙස එකී දැනුම සෙවීමේ තරඟයට අවතීරණ විය යුතුය. නව පරපුර ඒ සඳහා පෙළඹවීම යොමු කිරීම වගකිව යුතු සැමගේම වගකීමකි. යුද හමුදා ක්ෂේත්‍රය තුළ ද දැනුමින් පරිපූර්ණ සෙබළුන් බිහිකිරීම අද වනවිට අනිවාර්ය අවශ්‍යතාවක් බවට පත්ව ඇත. විශේෂයෙන් පශ්චාත් යුද සමයේ යුද හමුදාව වෘත්තීය හමුදාවක් කිරීමට නම් එහි සෑම තරාතිරමකම සාමාජිකයින් තුළ නව ලොව හා බද්ද වෙන පොහොසත් දැනුමක් ඇති කළ යුතුය. ඒ සඳහා කෙටිකාලීන හා දිගුකාලීන ක්‍රියාමාර්ගවලට එළඹිය යුතුය. මෙම අරමුණ මුදුන්පත් කරලීමට නම් යුද හමුදා සාමාජිකයින් හට නව ලොව දැනුම සොයා යා හැකි මංපෙත් විවරකරදීම අත්‍යවශ්‍ය. සිංහ රෙජිමේන්තුව මීට වසර 15කට පෙර එකී මාහැඟි කාර්යයට අතපොවන්නේ යුද හමුදාවේ සෙසු අංශ ආයතනවලටද පූර්වාදර්ශයක් සපයමිනි. එනම්, එහි ඉදි කොට ඇති "සිංහ ප්‍රජාකේන්ද්‍රීය පුස්තකාලය"යි.

අඹේපුස්ස සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානය වූ කලී තවත් එක් යුද හමුදා කඳවුරක් පමණක් නොවේ. රණවිරු දෑත් එකමුතුවෙන් නිමවුණු සුන්දර පරිසරයක අපූරුව කියාපාන එහි ඊටම ආවේණික භෞතික වටපිටාවත් ක්‍රමවත් පරිපාලන රටාවත් සෙසු හමුදා කඳවුරුවලින් වෙනස්ව පෙන්වයි. එකී සොබා සෞන්දර්ය ඉහවහා ගිය තෝතැන්නක එවකට සිංහ රෙජිමේන්තු අධිපතිව සිටි මේජර් ජෙනරාල් බොනිෆස් පෙරේරා ගේ සිතෙහි ඇඳෙන සංකල්පයක් "සිංහ ප්‍රජාකේද්‍රීය පුස්තකාලය" ලෙස ප්‍රායෝගික යථාර්ථයක් බවට පත්වන්නේ ඒ අයුරිනි. මේ සඳහා ශිල්පීය තාක්ෂණ දායකත්වය සැපයූ මොරටු විශ්ව විද්‍යාලයේ ආචාර්යවරයකු වන මිලින්ද පතිරාජ හා ගගන රත්නායක යන විශිෂ්ට ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ සුසංයෝගය කදිමට ගැලපුණි. ඊට අමතරව සියයකට අධික සිංහ රෙජිමේන්තු සෙබළුන්ගෙන් 24 පැය පුරා ලද අඛණ්ඩ ශ්‍රම දායකත්වය ද මෙම විශිෂ්ට නිමැවුමේ රහසයි. "කියවීම පුර්ණ මිනිසකු තනයි" යන කියමන තවදුරටත් අරුත් ගන්වමින් සාම්ප්‍රදායිකව පුස්තකාලයකින් ඉටුකෙරෙන මෙහෙවරෙන් ඔබ්බට මේ හරහා සේවය සැපයේ. ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සාමාජිකයින් විසින් නිර්මිත පරිසර හිතකාමී ශිල්පීය ක්‍රම සහ










නවීන ගෘහ නිර්මාණ කුසලතා භාවිතා කරමින් ඉදිකරන ලද මෙම ප්‍රජා පදනමේ පුස්තකාලය වර්ෂ 2015 සැප්තැම්බර් මස 01 වන දින ස්විට්සර්ලන්තයේ හොල්සිම් පදනම විසින් සංවිධානය කරන ලද 4 වන ජාත්‍යන්තර පරිසර හිතකාමී ඉදිකිරීම් තරඟාවලියේදී රිදී පදක්කම දිනාගැනීමට සමත්වීම එහි අගය තවදුරටත් වැඩිකරලීය.

රටවල් 152කින් තරඟකරුවන් 6000ක් ඔවුන්ගේ නවෝත්පාදන ව්‍යාපෘති සමඟ මෙම තරඟාවලියට තරඟ වැදී තිබූ අතර, එහිදී ඇමෙරිකා එක්සත් ජනපදය පවා අභිබවා ශ්‍රී ලංකාව දෙවැනි ස්ථානය ලබාගත් අතර, කොලොම්බියාව ප්‍රථම ස්ථානය හිමිකරගන්නා ලදී. ලක් ඉතිහාසයට ආඩම්බරයක් එක්කර දුන් මෙම අවස්ථාව ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු ඉතිහාසයට ජාත්‍යන්තරමය වශයෙන් පිළිගැනුමක් එක්කර දුනි. කොළඹ Robust ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ වැඩමුළුවේ දී මෙම පුස්තකාලයේ නිර්මාණ ශිල්පීන් දෙපළ ද එහිදී සම්මානයට පාත්‍ර විය.

අඹේපුස්සෙහි ඇති මෙම පුස්තකාලයේ විශේෂත්වයක් නම් ශාක පිළිබඳ තොරතුරු ඇතුලත් පර්යේෂණ කුටියයි. දිවයිනේ විවිධ පාරිසරික තත්වයන් යටතේ වැඩෙන ශාක කොටස්වල පැතිකඩ උද්භිත විද්‍යාත්මක විශ්ලේෂණයක් ද සමගින් එහි සංරක්ෂණය කොට ඇත. එසේම, කෘමීන් පිළිබඳ, පක්ෂීන් පිළිබඳ, සර්පයින් පිළිබඳ මෙන්ම විවිධ බීජ වර්ග පිළිබඳව ද පුළුල් අවබෝධයක් ලබාගත හැකි ලෙස වෙන වෙනම කුටි ස්ථාපනය කොට ඇත්තේ පාසල් දරුදැරියන්ට මෙන්ම වැඩිහිටියන්ට පවා ප්‍රායෝගික දැනුමක් ලබාගත හැකි වන පරිද්දෙනි. ඇරඹුමේදී සිංහ රෙජිමේන්තු සාමාජිකයින් සඳහා වෙන්වූ මෙම පුස්තකාලය පසුව ඔවුන්ගේ දුවා දරුවන් සඳහා ද ඉඩ ලබාදෙන්නට තීරණය විය. කල්යත්ම එහි ඇතිවූ ක්‍රමික වර්ධනය හේතුවෙන් එකී සේවාව තවදුරටත් පුළුල් කොට අඹේපුස්ස ප්‍රදේශයේ සිවිල් පුද්ගලයින් හා පාසල් දුවාදරුවන් සඳහා ද ඉඩ ලබාදෙන ලදී. ඉනුදු නොනැවතී අද වනවිට මෙම පුස්තකාලය ජාත්‍යන්තර කලයේ ඇගයුමට

"රටවල් 152කින් තරඟකරුවන් 6000ක් ඔවුන්ගේ නවෝත්පාදන ව්‍යාපෘති සමඟ මෙම තරඟාවලියට තරඟ වැදී තිබූ අතර, එහිදී ඇමෙරිකා එක්සත් ජනපදය පවා අභිබවා ශ්‍රී ලංකාව දෙවැනි ස්ථානය ලබාගත් අතර, කොලොම්බියාව ප්‍රථම ස්ථානය හිමිකරගන්නා ලදී. ලක් ඉතිහාසයට ආඩම්බරයක් එක්කර දුන් මෙම අවස්ථාව ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු ඉතිහාසයට ජාත්‍යන්තරමය වශයෙන් පිළිගැනුමක් අත්කර දුනි."

ලක්වීමත් සමගම සියලුම යුද හමුදා අංශ සඳහා ද අනෙකුත් ප්‍රදේශවල පාසල් හා විශ්ව විද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ද විවරව ඇත්තේ දැනුම සොයා එන සැම අයකු තුළම නැවුම් අත්දැකීමක් ද එක්කරමිනි.

තුරු වදුලක පහසත් කඳු සිසිලත් එක්කාසුකොට දැනුම ගෙනෙන උල්පතක් බඳුවූ මෙම සිංහ රෙජිමේන්තු පරිසර හිතකාමී සෙබළ ප්‍රජාකේන්ද්‍රීය පුස්තකාලය ජාතියට සම්පතක් වෙමින් අද වනවිට ජාත්‍යන්තරය ජයගෙන හමාරය. හෙට ලොව දිනන්නට දැනුමින් සන්නද්ධ වූ පුතුන් අවැසි යුගයක සිංහ රෙජිමේන්තු පරිශ්‍රයේ තැනුණු මේ පරිසර හිතකාමී පුස්තකාලය එකී බුද්ධිමතුන් බිහිකරන තිඹිරි ගෙයක් වනු නොඅනුමානය. සැම තත්පරයකදීම ගුණාත්මක හා හරවත් යමක් පාඨකයින්ටත් ප්‍රේක්ෂකයින්ටත් ලබාදෙමින් නව තාක්ෂණය හා නව අදහස් සමගින් ලෝකය සමග බද්ද වෙන මෙම පරිසර හිතකාමී පුස්තකාලය සැමදා අලුත් වෙමින් පෙරටම ගමන් කරනු ඇත.

■ **ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ**




ඔබ බොහෝ විට තවත් අයෙක් සම්පූර්ණයෙන්ම විශ්වාස කිරීමට පෙර කිහිප වතාවක්ම එකී පුද්ගලයා පිළිබඳව විවිධ දෘෂ්ටි කෝණයන්ගෙන් කිරා මැන බැලීම පුරුද්දක් වශයෙන් සිදු කරනු ලබනවා. මෙහි සැලකිය යුතු වැරැද්දක් නොතිබුණද, ඔබ තවත් අයෙක් විශ්වාස කිරීමට දීර්ඝ කාලයක් ගන්නේ ද? නැතිනම් විශ්වාස කිරීමට බියක් දක්වන්නේ ද? ඔබේ පිළිතුර "ඔව්" නම් ඒ බය නැති කරගෙන ජීවිතේ ලස්සන කරගමු....

අපි හැමෝම ජීවිතයේ කුමන හරි මොහොතක "විශ්වාස කරන්න බයයි" කියලා හිතපු වෙලාවල් ඇති. යාළුවෙක්ට, සහකරුවෙක්ට, පවුලේ කෙනෙක්ට නැතිනම් රැකියා ස්ථානයේ කෙනෙක් සම්බන්ධයෙන් වුණත් විශ්වාසය තියන එක සමහර වෙලාවට යම්තාක් දුරකට ලොකු අභියෝගයක්. එසේ වන්නේ ඇයි දැයි සොයා බැලීමේදී අතීතයේ අපි යම් කෙනෙක් හෝ දෙයක් තදින් විශ්වාස කරලා රිදිලා බිඳිලා පෑරුණු කෙනෙක් නම්, ඒ බය, කළකිරීම ආයෙ ආයෙමත් මතුවෙන්න තියෙන ඉඩ ප්‍රස්තා ඉතා වැඩියි. ඒත් විශ්වාසය නැතිව ඔබට මට සතුටින්, සාමකාමීව ජීවත් වෙන්න අමාරුයි.

ඇයි අපි තවත් පුද්ගලයෙක් හෝ යම් දෙයක් කෙරෙහි විශ්වාසය තියන්න බය? අපි අද මේ ගැන ටිකක් කතා කරමු.

# ගුණාත්මක විශ්වාසයක් ගොඩනගමු

විශ්වාස කරන්න බය වෙන්න බලපාන ප්‍රධාන හේතු කාරණා කිහිපයක් පිළිබඳව සලකා බලමු.

## අතීතයේ විඳි කටුක අත්දැකීම් කෙරෙහි ඇති බිය

සමාජීය ජීවියෙකු ලෙස කටයුතු කිරීමේදී අතීතයේ අපි විශ්වාස කළ පුද්ගලයෙකුගෙන් අපිට ලොකු වේදනාවක් හෝ රැවටීමක් හේතුවෙන් හිත දැඩි ලෙස බිඳී තියෙනවා විය හැකියි. ඒ දරුණු වේදනාව, කළකිරීම, අපේක්ෂා භංගත්වය වැනි ඍණාත්මක සිතුවිලිවලට මුහුණ දෙන්න ඔබ තුළ තිබෙන බය තමයි ප්‍රධාන හේතුව. එයා ආයෙත් මාව රිදවයි ද? මට ආයෙත් තනියම ජීවත් වෙන්න වෙයි ද? මාව තවත් අසරණ වෙයි ද? මාව ආයෙත් කලින් හිටපු තත්ත්වයටම පත් වෙයි ද? කියලා හිතෙන්න ගන්නවා. ඒ හැඟීම් එක්ක විශ්වාසය යනු හුදෙක් වචනයක්ම පමණක් වෙනවා.

## වෙනස් වීමට ඇති අකමැත්ත

අලුතින් පුද්ගලයෙක් සමඟ විශ්වාසය ගොඩනඟනවා කියන්නෙම යම්කිසි වෙනස්කමකට මුහුණ දෙන්න අවස්ථාවක් උදා වෙනවා කියන එක. විවිධ හැලහැප්පීම් මධ්‍යයේ ජීවිතයේ ඉදිරි පියවර පැහැදිලි නොවන අවස්ථාවක ඒ වෙනස්කම් වලට ඇති අකමැත්ත නැවත අලුත් විශ්වාසයක් ගොඩනැඟීමට බාධාවක් වෙන්න පුළුවන්.

## දුර්වලතා කෙරෙහි ඇති බිය

පුද්ගලයන් වශයෙන් ගත් විට ඔබ මා එක හා සමාන ගති පැවතුම් වලින් යුක්ත අය නොවේ. අපගේ ශක්තීන් හා දුර්වලතාවන් එකිනෙකාගෙන් වෙනස්. අපි යමක් දෙස බලන දෘෂ්ටිකෝණය වෙනස්. අපගේ අත්දැකීම් එකිනෙකාට සුවිශේෂීයි. ඉතින් එවැනි පසුබිමක අපේ දුර්වලතා පෙන්වීමට ඇති බිය විශ්වාසය කෙරෙහි ප්‍රබලව බලපෑම් කරනවා. කෙනෙක්ව විශ්වාස කරනකොට අපි අපේ දුර්වලතා, අපේ බලාපොරොත්තු, අපේ හැඟීම්, අපේ චිත්තවේග

කිසිදු පැකිලීමකින් තොරව අනෙක් පුද්ගලයාට පෙන්වනවා. ඒ වෙලාවට අපිට හානියක් වෙයි කියලා අපි බය වෙනවා.

## පාලනයෙන් තොරවීම

කෙනෙක්ව විශ්වාස කරල බැඳීමක් ඇතිකර ගන්නවා කියන්නෙම අපි අපේ පාලනය අත්හරිනවා කියන එක. මේ ඇති කරගන්න විශ්වාසයෙන් අනාගතයේ මට මොනවා වෙයි ද දන්නේ නැහැ කියන අවිනිශ්චිතතාවට අපි බයයි. අපි කරන කියන දේ නැතිනම් අපේ හැසිරීම සම්බන්ධයෙන් වගකීමක් සහ වගවීමක් සහිතව ජීවත් වීමට අපි වග බලා ගත යුතුයි. වගකීම් විරහිතව ජීවත් වීම ගුණාත්මක පුද්ගලයෙකුගේ ගති ලක්ෂණයක් නොවේ.

## සමාජයේ බලපෑම්

"කිසිම කෙනෙක් විශ්වාස කරන්න එපා", "හැමෝම ඔයාව රවට්ටන්න බලාගෙන ඉන්නේ" ඒ වගේ අදහස් අප ජීවත් වන සමාජයේ බහුලයි වගේම ප්‍රචලිතයි. මේ වගේ දේවල් අහන එකෙන් අපිව මානසිකව පීඩනයට පත් වෙන්න පුළුවන්. එතුළින් විශ්වාසවන්ත සබඳතාවක් ගොඩනැඟීමට ඇති ඉඩකඩ ඉතාම අවම මට්ටමක පවතිනවා.

විශ්වාස කරන්න තියෙන බය නැති කරගෙන ජීවිතය සාමකාමී කර ගන්න පුළුවන් ද? අපි ඒ ගැන ටිකක් කතා කරමු.

## ඉතා කුඩා පියවරක් තබමු

එකපාරටම හැම පුද්ගලයෙක්ම සම්පූර්ණයෙන්ම විශ්වාස කරන්න යන්න එපා. මුලින්ම පුංචි පුංචි දේවල් වලින් පටන් ගන්න උත්සාහ කරන්න. එක් එක් අයගේ විශ්වාසවන්තභාවය නිහඬව තේරුම් ගන්න උත්සාහ කරන්න. විශ්වාසය ටිකෙන් ටික ගොඩනැගෙන්න ඉඩ දෙන්න.

## විශ්වාසය දෙපාර්ශ්වයටම පවත්වා ගන්න උත්සාහ කරමු

විශ්වාසය කියන්නේ දෙපැත්තටම තියෙන්න ඕන දෙයක්. ඔබ කෙනෙක්ව විශ්වාස කරනවා වගේම ඒ පුද්ගලයාටත් ඔබව විශ්වාස කරන්න පුළුවන් වෙන්න ඕනේ. ඒ විශ්වාසය ගොඩනගන්න දෙපාර්ශවයෙන්ම අවංකවම උත්සාහ කරන්න ඕනේ.

## බුද්ධිය සහ හැඟීම් සමාන්තරව පවත්වා ගනිමු

යම් පුද්ගලයෙක්ව විශ්වාස කරනවා ද නැද්ද කියලා තීරණය කරද්දී ඔබේ බුද්ධිය සහ ඔබේ හදවත කියන දේට සවන් දෙන්න. යම් කෙනෙක් කියන දේ ගැන පමණක් විශ්වාස නොකර ඔවුන්ගේ ක්‍රියාවන් ගැනත් අවධානය යොමු කරන්න. මිනිස්සු විවිධ හේතු නිසා වෙනස් වෙනවා. මිනිස්සු විවිධ හේතු නිසා විශ්වාසය කඩ කරනවා සමහර විට සාධාරණව සහ අසාධාරණව වගේම සමහර විට තමන්ගෙ වාසියට. ඒ නිසා යම් පුද්ගලයෙක්ව විශ්වාස කරනවා ද නැද්ද යන්න තීරණය කරද්දී ඔබේ බුද්ධිය සහ ඔබේ හදවත කියන දේට සවන් දෙන්න.



> ඔබට යම් දෙයක් ගැන විශ්වාසයක් නැත්නම් ඒ ගැන විවෘතව කතා කරන්න. සැක දුරු කර ගන්න. ජීවිතයේ සමහර දේවල් වලදී පොඩි අවධානමක් ගන්න වෙනවා. විශ්වාසය තැබීමත් අන්න ඒ වගේමයි. හැමෝම එක වගේ නැහැ කියලා මතක තියාගන්න. අතීතයේ කවුරුහරි ඔබව රිදෙව්වා කියලා හැමෝම එහෙම කරයි කියලා හිතන්න එපා.

## ගුණාත්මක ලෙස සන්නිවේදනය කරමු

විශ්වාසය ගොඩනැඟීමේ දී විවෘත සන්නිවේදනය ඉතා වැදගත්. ඔබට යම් දෙයක් ගැන විශ්වාසයක් නැත්නම් ඒ ගැන විවෘතව කතා කරන්න. සැක දුරු කර ගන්න. ජීවිතයේ සමහර දේවල් වලදී පොඩි අවධානමක් ගන්න වෙනවා. විශ්වාසය තැබීමත් අන්න ඒ වගේමයි. හැමෝම එක වගේ නැහැ කියලා මතක තියාගන්න. අතීතයේ කවුරුහරි ඔබව රිදෙව්වා කියලා හැමෝම එහෙම කරයි කියලා හිතන්න එපා.

## සීමා මායිම් සකසා ගමු

කෙනෙක්ව විශ්වාස කරද්දීත් ඔබේ සීමා මායිම් මොනවාද කියලා තේරුම් අරගෙන ඒවා පවත්වා ගන්න. ඕනෑවට වඩා ඉක්මනින් හැමදේම එළියට දාන්න හදිසි වෙන්න එපා.

## මානසික සුවයට මුල් තැන දෙමු

විශ්වාසය කියන්නේ අපේ ජීවිතයට හරිම ලොකු ශක්තියක්. ඒකෙන් අපිට හොඳ ගුණාත්මක සම්බන්ධතා ගොඩනගා ගන්නත්, සතුටින් සාමකාමීව ජීවත් වෙන්නත් පුළුවන්.



▪ දිල්මි ශානුකී

වාණිජවේදී (විශේෂ) උපාධිධාරී
පේරාදෙණිය විශ්ව විද්‍යාලය.

# නීතිවිරෝධී මත්ද්‍රව්‍ය වැළැක්වීමේදී

# පවුල සහ සමාජයේ භූමිකාව




වර්තමාන ශ්‍රී ලංකාව ශීඝ්‍රයෙන් දියුණුවනවාට වඩා වේගයෙන් මුළු මහත් සමාජ ක්‍රමයටම හානිදායක වන අයුරින් වයස් භේදයකින් තොරව අන්තරායකර මත්ද්‍රව්‍ය භාවිතය සමාජය වෙත ව්‍යාප්ත වී ඇත. එය ගැහැනු, පිරිමි, දුප්පත්, පොහොසත් මෙන්ම ග්‍රාමීයද, නගරය ද යන්න තැකීමක් නොකර විනාශකාරී ලෙසින් පැතිර ගොස් ඇත.

මත්ද්‍රව්‍ය ඇබ්බැහිවීම අද අපගේ සමාජය වෙත ගෙනෙන විශාලතම අභියෝගයන්ගෙන් එකකි. අපගේ ප්‍රජාවන්ගේ අනාගතය අගාධයට ලක්කරමින්, මේ මත්ද්‍රව්‍ය ලක්දිව අනෙක් ප්‍රදේශ මෙන් උතුරු සහ නැගෙනහිර පළාත්වල වේගයෙන් ව්‍යාප්තවෙමින් පවතී. මෙය කිසිසේත්ම පුද්ගලික ගැටලුවක් පමණක් නොව, මෙම උවදුර අපේ සමාජයම දුර්වල කරමින්, අපරාධ, සෞඛ්‍ය ගැටළු සහ පවුල් බිඳවැටීම් ඇති කරයි.

ආරක්ෂක අංශවල වාර්තා අනුව, ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් සිදුවන අත්අඩංගුවීම් විශාල වශයෙන් ඉහළ ගොස් ඇත. ජාතික අන්තරාදායක මත්ද්‍රව්‍ය පාලන මණ්ඩලය අනුව, 2018 දී 1,622 ක් අත්අඩංගුවට ගනු ලැබුවද, 2019 දී එය 1,753 ක් දක්වා ඉහළ ගිය බව පෙන්වයි. පළාතේ ප්‍රජා නායකයින් පවසන්නේ 2009 පෙර මත්ද්‍රව්‍ය ගැටළුව නොතිබුණද, යුද්ධයෙන් පසු එය තරුණ පරපුර අතර ඉතාමත් ප්‍රචලිත වී ඇති බවයි. මත්ද්‍රව්‍ය භාවිතය සියලු වයස් කාණ්ඩවල පුද්ගලයින්ට විවිධාකාරයෙන් බලපෑම් එල්ල කරයි. මිතුරන්ගෙන් එල්ල වන පීඩනය, ආර්ථික අපහසුතා මානසික දුර්වලතා සහ දැනුම් හිඟය මෙයට ප්‍රධාන හේතු වේ.

පවුල්, ගුරුවරුන් සහ ප්‍රජා නායකයින් මත්ද්‍රව්‍යවලට එරෙහිව සටන් කිරීමට විශේෂ අවධානය යොමු කළ යුතුය. දරුවන් හා විවෘතව කතාබහ කිරීම, අවවාදය හා උපදෙස් දීම සහ ආදරයෙන් යුත් පවුල් පරිසරයක් සැලසීම වැදගත් වේ. පාසල්, ආගමික ආයතන සහ සමාජ සංවිධාන මත්ද්‍රව්‍යවල බලපෑම් පිළිබඳව තරුණ පරපුරට ඉගෙනීමට අවස්ථා සැලසිය යුතුය.

මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සඳහා පවුල් සහ සමාජය එකමුතුව ක්‍රියා කළ යුතුය. එක් පුද්ගලයකු මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම පවුලක් සහ සමාජයම දුර්වල කිරීමක් බවට පත්විය හැක. එමඟින් අනාගත පරපුර සුරක්ෂිත කිරීම සඳහා මෙය එක්ව සිදුකළ යුතු ක්‍රියාවලියකි. දරුවන්ට මනා අධ්‍යාපනයක් ලබාදීම මත්ද්‍රව්‍යවල අන්තිම ප්‍රතිපල සහ එය ජීවිතයට ඇති කරන අවාසි පිළිබඳව දරුවන් හට දැනුවත් කල යුතුය.

විවෘත හා විශ්වාසදායක සංවාදය ඇති කිරීම - මිතුරන්ගෙන් ලැබෙන අයහපත් බලපෑම්වලින් නිදහස් වීමටනම් දරුවන්ට මව සහ පියා සමඟ නිදහසේ කතා කළ හැකි පරිසරයක් ලබාදිය යුතුය.

දරුවන්ගේ හැසිරීම් නිරීක්ෂණය කිරීම අධ්‍යාපනික කාර්ය සාධනය පහළ යාම, නිතර තනිව සිටීම, මිතුරන් සමඟ වැඩිපුර කාලය ගත කිරීම පිළිබඳව මව්පියන් සැලකිලිමත් විය යුතුය.

විනෝද සහ ක්‍රීඩා ක්‍රියාකාරකම්වලට දරුවන් යොමු කිරීම ක්‍රීඩා, සංගීතය, චිත්‍ර අඳිම සහ වෙනත් නිර්මාණශීලී ක්‍රියාවලියන් තුළින් දරුවන්ගේ මනස යොමු කරවීම. සදාචාරය සහ ආගමික වටිනාකම් ඇගවීම - දරුවන්ට නීති, සදාචාරය සහ යහපත් ආදර්ශය පිළිබඳව නිවැරදි මාර්ගෝපදේශනයක් ලබාදීම වැදගත් වේ.

### මත්ද්‍රව්‍ය උවදුර වැළැක්වීමේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ භූමිකාව

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව රටේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල දෙමළ ප්‍රජාවන් අතර මත්ද්‍රව්‍ය අනිසි භාවිතයට එරෙහිව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. නීතිය ක්‍රියාත්මක කරන ආයතන සමඟ සමීප සහයෝගීතාවයෙන්, විශේෂයෙන් වෙරළබඩ සහ සෙසු ප්‍රදේශවල ක්‍රියාත්මක වන මත්ද්‍රව්‍ය ජාවාරම් ජාල විනාශ කිරීමට හමුදාව සහාය වේ. හමුදාව පාසල් සහ ගම්මානවල දැනුවත් කිරීමේ වැඩසටහන් ද පවත්වයි, මත්ද්‍රව්‍ය අනිසි භාවිතයේ අන්තරායන් පිළිබඳව තරුණයින් දැනුවත් කිරීම් සහ වෘත්තීය පුහුණුව සහ අධ්‍යාපනය වැනි ඵලදායී විකල්ප හමුදාව විසින් නිරතුරුව සපයනු ලබයි. ඊට අමතරව, මත්ද්‍රව්‍ය ප්‍රතිසාධන වැඩසටහන් සඳහා සහාය වීමෙන් සහ ප්‍රජා සහභාගීත්වය දිරිමත් කිරීමට යුද්ධ හමුදාව සහාය වේ. සාමූහික ප්‍රවේශයක් පෝෂණය කිරීමෙන්, දෙමළ ප්‍රජාවන්ට ආරක්ෂිත අනාගතයක් සහතික කරමින් මත්ද්‍රව්‍යවලින් තොර පරිසරයක් නිර්මාණය කිරීමට යුද්ධ හමුදාව වෙහෙස නොබලා කටයුතු කරයි.

සටහන - ලක්මිණි රාධිකා

# සෙබළ සිතුවිලි



## Clean Sri Lanka

තැන තැන කුණු කසළ
නොදමා අප අතර
එකතු කර නිසි ලෙසට
බැහැරකර පිළිවෙලට

පැරණි ලිපිගොනු අපේ
විසි නොකර හිතුමතේ
තෝරාගත හැකි ලෙසේ
කරනු ගබඩා නිසිලෙසේ

නැතිවිට තම අසුනේ
පිටව යයි නම් බැහැරේ
විදුලි පංකා බුබුලේ
නිවනු මගේ මිතුරේ

අප වෙත පැමිණෙනා
සේවය ලබාගන්නා
අයට ගරු කරලා
තම හිකට එකඟව
දෙන්න සේවය කාලය
අපතෙ නොයවා

හඳිසි ලිපි කටයුතු
විගස කර දෙන්නට
අතට මිල මුදල් ගෙන
වංචා නොකරනු තවත් කෙනකුට

හිතට ගෙන අප සැවොම
නිවැරදිව ජීවත්ව
සිටියොතින් ගොඩනැගෙයි
Clean Sri Lanka

සෙ/725354
ලා/කෝ අබේගුණවර්ධන වීඊ
මූලස්ථානය - 1 ශ්‍රීලයුකාබ
නො:30, කිංසි පාර
බොරැල්ල



## ආයෙත් ලැබෙනවා නම්...

මතකද අපි එකම පන්තියේ තැන් තැන්වල
එකම බත් එක ඔක්කොම බෙදාගෙන...
එකෙක් මූඩ් ගැහුවාම ඔක්කොම අප්සෙට්
වෙලා
හිටපු ගිටි එක...
හැමදේකටම වගේ
රණ්ඩු කර කර විහිලු කරගෙන
හැමදාමත් අපි එකට තියලා
කෑගහපු කාලය...
ඒත් දැන් අපි ලොකු ළමයිලු
ජොබ් කරන කස්ටියලු...
සතියකට එක පාරක් ඉරිදා උදේට
ගෙදර මිදුලේ අව්ව වැටිලා තියෙනව දකින
හෙන බිසී (busy) පොරවල්ලු...
අනේ ඉතින් අපි හැමෝටම ආයෙමත්
එකම එක පාරක්
එකට එකතුවෙලා දවස ගෙවන්න
රණ්ඩුවෙන්න
ආයෙත් සැරයක් ඉඩ ලැබෙනවානම්
වෙන කිසිම දෙයක් වැඩක් තියේද...

සෙ/338232
ලා/කෝ සංජීව ඩීජීඑස්
19 ශ්‍රීලපාහ



## එපා මට යස ඉසුරු...

මහ සුලඟට නොනැවෙන සේ
එළිය දෙන්න පහනක් වී
දිවි ඇතිතුරා මේ හදවතේ
දෙන්න සතුට නිති රන්දා
ඔබේ ආදර වදන් වලින්
මේ හදවත පුරවනු මැන
ආදර රැඟුමන් රඟමින්
සතුට දෙන්න මගේ නෙතට
මගේ ළඟින් පලානොයන්
සිතුම් පැතුම් ඉටුවන තුරු
එළිය දෙන්න මගෙ දිවියට
බැබලෙන්නට පහන් තරුව සේ

සෙ/ක්‍යු109268
ලා/කෝ ලියනගේ ඩීඑල්ඇයිඑස්
12 ශ්‍රීලංජාආබමු

## සිත නිවන අතීත මතක

දහතුන් වසක් ගෙවුනා අපෙ ආලයට
මතක් වුනා ඇරඹුව හැටි ජීවිතය
දරුවන් නිසාවත් අඩුනොවූ ආදරය
මෙලෙස ලියන්නෙමි කවි කර බිරිඳ වෙත

වෙසගේ සඳයි එදවස පායා තිබුනේ
ලස්සන නිසයි වැලි මලුවට ගොඩවූයේ
තනිකම නිසයි බෝ මළුවේ වාඩිවුනේ
බුදු හිමි රුව ළඟයි මා නැවතී සිටියේ

මතකද එදා දුරකථනෙන් කථාකලා
අංකය නොදැන ඔබ මාහට සැරවූවා
සිවුමැලි හඬට මාගේ සිත ඇදීගියා
සැරවූ නිසා මට ඩිංගක් බය හිතුනා

ඇයද එදා සිටියේ බෝ සෙවණ ළඟ
කිසිවක් කියන්නට සිතුනා නැවත ගෙන
දැහැන බිඳින්නට නොකැමති විය සිතට
එනිසයි එදා ඉවසූවේ වසන් කොට

සිතට දැනුනු සිතිවිල්ලක් උරණවුනා
ආල සිතක් මා හද තුල පහල උනා
නැවත වරක් අමතන්නට මට සිතුනා
පසුදින උදෑසන මා ඇය ඇමතුවා

පෙරදින සිතට කාවැද්දූ සිතිවිල්ල
ඇය හට පැවසුවා හිමිහිට මුමුණාම
පිළිතුරු නොදී සිටියා ඈ නොදොඩාම
මවගේ හඬත් ඇසුනා ඒ ළඟපාත

දින දෙකතුනක් සිටියා මා නිහඬ වෙලා
ඇයගේ හඬම රැව්දුන්නා දෙකන් පුරා
නැවතත් ඇමතුවෙමි ආලය නැතිද කියා
ඈ පැවසුවා සොයුරෙකු සේ ඉමුයි කියා

කාලය ගෙවුනි දින සති ලෙස ඉදිරියට
මා ඇමතුවා දිනයක් නෑරම ඇයට
නිරායාසයෙන් පෙරලුණි ආලයට
එදවස පටන් ඇරඹුණි අපෙ ආදරය

සෙ/11කිව්02319
සැරයන් අබේසිංහ ආර්පීකේජීඑස්සී
11 ශ්‍රීලංජාආබමු




(පසුගිය කලාපය හා සම්බන්ධවයි)

# බිරිඳ සමඟ බංකරයේ රැයක්

සාමාන්‍ය බංකර් රාජකාරීවලදී මුර වාරයක් ආවරණය කිරීම සඳහා එක් සෙබළකු බැගින් යොදවන නමුත්, ක්‍රියාන්විත අවදානම මත ඒ සඳහා වරකට දෙදෙනා බැගින් යොදවන්නට සිදුවන අවස්ථා ද යෙදේ. කෙසේ නමුත්, කලාතුරකින් තැනක එම අවදානම මඳක් පහවූ සැනින් එලෙස මුර රාජකාරී නිරත සෙබළුන් දෙදෙනාගෙන් අයෙක් අනෙකාට දන්වා රහසේම ඇස් පියාගන්නා අවස්ථා ද නැත්තේ නොවේ. ඒ අතර මුර පරික්ෂා කිරීම සඳහා කිසිවකු පැමිණෙන්නේ නම් වහාම ඔහුව ඇහැරවීමට ද අනෙකා වගබලා ගනී.

මුර පරික්ෂාව, නොඑසේනම් බංකර් පරික්ෂාව ක්‍රියාන්විතයන්හි ස්ථාපිතව තිබූ සෑම කඳවුරකම සිදුකළ අනිවාර්ය කටයුත්තකි. බංකර් රාජකාරී සඳහා වෙන්කළ පිරිස මෙන්ම එම බංකර් රාජකාරී පරික්ෂා කිරීමේ පිරිසක් ද සෑම කඳවුරකම එකල දිනපතා ලිඛිතවම පත්කරනු ලබයි. මේ සඳහා කඳවුරේ සිටින කනිෂ්ඨ නිලධාරීන් හා ජ්‍යෙෂ්ඨ කොනොනිවරු නම් කෙරේ. මීට අමතරව නම් නොකරන ලද ජ්‍යෙෂ්ඨයින් ද කඳවුර වටා ඇති බංකර් පරික්ෂා කිරීම සඳහා එක්වනුයේ පවතින ආරක්ෂක තත්ත්වය අනුවය. යුද බිමේ කඳවුරුවල තිබූ සෑම බංකරයකම පාහේ අත්පොතක් ද එල්ලා තිබූ අතර මුර පරීක්‍ෂාවේ යන අයවලුන් තමාට පැවරී තිබූ කාලසීමාවේ අදාළ බංකර් නිසි පරිදි පරීක්‍ෂා කළ බවට වේලාව සමඟ එහි සටහන් කළ යුතු විය. කඳවුරු භාර නිලධාරී හෝ වෙනත් වගකිවයුතු නිලධාරියකු විසින් එලෙස රාත්‍රියේ බංකර් පරීක්‍ෂා කළ යුතු වේලාවන් හා පුද්ගලයින් නම් කිරීම සිදුකරනු ලබන අතර, එහි අරමුණ වූයේ අවදානම් අවස්ථාවල රාත්‍රියේ සෙබළුන් අවදියෙන් හා උපරිම සූදානමින් තබා ගැනීමය.

එහෙත් ඇතැම් අවස්ථාවල එසේ බංකර් පරික්ෂාවට යාමට නියමිත සමහර ජ්‍යෙෂ්ඨ කොනොනිවරු හෝ කනිෂ්ඨ නිලධාරීන් අලසකමට එසේ නොගොස් පසුදින බංකර්වල තිබූ සටහන් පොත්වල කලින් වේලාවල් යොදා අත්සන් තබන අවස්ථා ද හොර රහසේ සිදුවේ. බොහෝවිට එවැනි සටකපට වැඩ සඳහා මුර පරීක්‍ෂාවේම

යෙදෙන සමීප අයකුගේ රහසිගත සහයෝගය ද ලැබේ. උදාහරණයක් ලෙස කිසියම් අයකු අලුයම 01 සහ 02 අතර කාලයේ බංකර් පරීක්ෂා කළ යුතු අවස්ථාවක ඔහු එහි නොයා ඊට පසු පැය (02 සහ 03) මුර පරීක්ෂාවට යාමට නියමිත අය තමාගේ සමීපතම හිතවතකු නම් ඔහු ලවා අදාළ සටහන් පොත්වල පසු දින අත්සන් තබන්නට ඉඩක් තබා ගැනීමට ක්‍රියා කිරීමය.

කෙසේ නමුත් එම කපටි ක්‍රියාව කඳවුරු භාර නිලධාරී හෝ වෙනත් වගකිවයුත්තකුට දැනගැනීමට ලැබුණු අවස්ථාවල ඔවුන්ද ඊට උපක්‍රමයක් යොදා එලෙස මුර පරීක්ෂාව මඟහරින පුද්ගලයා හසුකර ගැනීමට කටයුතු කරයි. එහිදී, සිදුකෙරුණේ එම මුර පරීක්ෂාව මඟහරින පුද්ගලයා කවුරු දැයි හඳුනාගත් පසු ඔහු මුර පරීක්ෂාවේ යෙදිය යුතු කාලයේ දී අදාළ බංකර්වල සියලු පොත් ඊට පෙර සටහන් තැබූ අයට පසු ඉඩක් ඉතිරි නොවන ලෙස අත්සන් කිරීමය. එහිදී, පසුදින අදාළ පුද්ගලයා සුපුරුදු ලෙසම එම පොත් අත්සන් කිරීමට යැමේදී ඔහුගේ අත්සන් යෙදීමට නියමිත තැන ඉඩක් ඉතුරු නොවන ලෙස අතරමැද්දෙන් කිසිවකු අත්සන් කර ඇති ආකාරය දැකීමත් සමග ඔහු කළ වංචාව කඳවුරුභාර නිලධාරී හෝ වෙනත් වගකිවයුත්තකුගේ අතට හසුවී ඇති බව තේරුම්ගනී. එහිදී, එම වගකීම් විරහිත වංචනික ක්‍රියාවට සම්බන්ධ වූ පුද්ගලයාට දඬුවම් ලෙස තම නිවාඩුව කැපකිරීමට හෝ කඳවුරෙන් පිටත අඛණ්ඩව රාජකාරීන් හි නිරතවීමට හෝ විනයානුකූල දඬුවමකට මුහුණදීමට පවා සිදුවේ.

යුද්ධය පැමිණි සමයේ කඳවුරක හෝ ආරක්ෂක වළල්ලේ රාත්‍රී මුර රාජකාරී කිරීමේ දී සෙබළුන් නිදාවැටීමට හේතු කාරණා රැසක් වේ. බොහෝවිට එය හිතාමතා වගකීම් පැහැර හැරීමේ වුවමනාවෙන් සිදුවන්නක් නොවේ. පෙර දිනවල දී දිගින් දිගටම නිදිවැරීම නිසා මෙන්ම දහවල් කාලයේ කායිකව අසීමිත ලෙස වෙහෙසීමට සිදුවීම ද එලෙස සෙබළුන් රාත්‍රී මුරයේ දී නිදාවැටීමට ප්‍රධානම හේතු වේ. එලෙස පෙර දිනවල නිදිවැරීමටද බලපාන හේතු ද රැසකි. දිගින් දිගටම කඳවුරට හෝ ආරක්ෂක වළල්ලට සතුරු තර්ජන එල්ලවිය හැකි බවට ඉහළ මූලස්ථාන මගින් නිරන්තරව දැනුම්දීම් සිදුකිරීමේ දී සෑම රාත්‍රියක්ම පාහේ භටපිරිස්වලට අවදියෙන් හා සූදානමින් සිටීමට සිදුවේ. හමුදා බුද්ධි තොරතුරු ඔස්සේ ද භූමියේ

---

**යුද පිටියේ දී අවිය හා බිරිඳ අතර ඇත්තේ අසීමිත බැඳීමකි. හමුදා පුහුණුවේ දී අවිය තම බිරිඳ සේ සුරැකිය යුතු බවට උගන්වයි. එසේම, බිරිඳ සේම අවිය ද තනි නොකිරීමටත්, අන්සතු නොකිරීමටත්, ආරක්ෂා කිරීමටත් වැඩිදුරටත් සිහි ගන්වයි. එනිසාම, ක්‍රියාන්විත පරිසරයේ යුද සෙබළෙක් රැයක් පහන්කරන ලද්දේ තම බිරිඳ සේම අවිය තුරුළුකර ගනිමිනි.**

---

සිදුවන වෙනස්කම් ද හමුවේ ත්‍රස්තවාදීන්ගෙන් ප්‍රහාර එල්ලවීමේ අවදානම ගුවන්විදුලි රහස් පණිවුඩ ඔස්සේ එහිදී කඳවුරුවලට දැනුම්දීම සිදුකරයි.

නමුත් එලෙස එල්ලවිය හැකි ත්‍රස්ත ප්‍රහාර පිළිබඳ නිතර නිතර දැනුම්දීම නිසාම ඇතැම්විට ඒ වෙනුවෙන් තබන බරතැබීම් අඩුවන අවස්ථා ද තිබිණ. එම පණිවුඩවල පැවති ඒකාකාරී බවද බොහෝවිට ඒ අයුරින්ම ත්‍රස්ත ප්‍රහාර සිදුනොවීම ද හේතුවෙන් යුද බිමේ එම තත්ත්වයන් සාමාන්‍යකරණය වී තිබිණ. නමුත්, මෙහි තිබූ විශේෂ කාරණය නම් ඇතැම් අවස්ථාවල පෙර දැනුම් දී තිබියදීත්, නිසි සූදානමක් නොමැතිවීම හේතුවෙන් ත්‍රස්ත ප්‍රහාර සිදුව හමුදාවට බොහෝ විනාශයන් සිදුවූ අවස්ථා ද තිබිණ. කෙසේ හෝ එකල ඉහළ මූලස්ථාන වෙතින් ත්‍රස්ත තර්ජන පිළිබඳ කඳවුරු දැනුවත් කිරීම "බය පැකට් බෙදීම" නොඑසේනම්, " බය බෙදීම" ලෙස පොදු ව්‍යවහාරයේ භටපිරිස් අතර භාවිතා විය.

ක්‍රියාන්විත බිමේ කඳවුරු ජීවිතයේ වඩා දුෂ්කරතා ගෙනදුන්නේ එම කඳවුරු අලුත්වැඩියා කිරීම් සිදුකිරීමේදීය. එහිදී බංකර් සෑදීම, යුද අගල් කැපීම, භටනිවාස සෑදීම, කඳවුර පිටත එළිපෙහෙළි කිරීම සෑම කඳවුරකම කිසිදා නිමනොවූ කටයුතුය. ආරක්ෂක වළල්ල පිළිසකර කිරීම ද ඒ අතර වේ. නිවාඩු වාරයක් ගෙවා මීළඟ නිවාඩු වාරය පැමිණෙන තෙක්ම කඳවුරු තුළ ඒකාකාරී ජීවිතය ඇතැම්විට වසර දෙක තුනක්, නොඑසේනම් වසර පහ හයක්, එසේත් නොමැතිනම් වසර දහයක් පහළොවක් තිස්සේම එකලෙස සිදුකිරීමට සෙබළුන්ට සිදුවිය. දිවාකල එම කටයුතු හේතුවෙන් සිදුවන අසීමිත වෙහෙස රාත්‍රියේ පෙර කියූ පරිදි සෙබළුන්ට නිදා වැටීමටද ප්‍රධාන හේතුවකි. කෙසේ හෝ බොහෝ කඳවුරුවල දිවා ආහාරයෙන් පසුව පැය කිහිපයක් නිදාගැනීමට ඉඩ සැලැස්වීම ද ඇතැම් කඳවුරුභාර නිලධාරීන් තම භටපිරිසට අනිවාර්ය කළ අවස්ථා ද තිබිණ. නමුත්, බොහෝ තැන්වල 24 පැය පුරා අධික ලෙස ක්‍රියාන්විත රාජකාරී පැවරී තිබීම නිසාම එවැනි ක්‍රියාමාර්ග ගැනීමට වුවමනාව පැවතිය ද ඒ සඳහා කිසිදු අවස්ථාවක් නොලැබුණ තැන් බොහෝය.

අධික වැසි සහිත කාලවල දී නිරන්තරව වැස්සට හා පින්නට නිරාවරණය වීම නිසා සෙබළු රෝගීවීම එකල සුලබ විය. එනිසා විශේෂයෙන්ම එම වකවානුවල අමතර රාත්‍රී තේ හා කොත්තමල්ලි වෙල් කිහිපයක්ම සෙබළුන්ට ලැබිණ. යුද සමයේ බංකර් රාජකාරීන්හි නිරත භටපිරිස් වෙත රාත්‍රී 10, 12, 02 ආදී කාලවල එලෙස කොත්තමල්ලී සලාකය යහමින් සැපයුණු අතර, සෙබළුන්ගේ අසනීප සුවවීම සේම අඳුර පහවනතෙක් හැකි උපරිමයෙන් ඔවුන් ඇහැරවා තබාගැනීම එහි අරමුණ විය.

යුද සමයේ බොහෝ සෙබළුන් අතම කුඩා පොකට් රේඩියෝවක් ද තිබිණ. එකල අද මෙන් ගුවන්විදුලි නාලිකා රැසක් නොතිබිණ. එබැවින් ඒ සැමට කැමති හෝ අකමැති පැවති නාලිකාවට සවන්දීමට සිදුවිය. ඒවා භටනිවාසයේ කොනක, බංකරයේ තැනක, නොඑසේනම් කඳවුරේ ශ්‍රමදාන කටයුතුවල දී අසල වූ ගසක හෝ එල්ලා කාටත් ඇසෙන්නට සැලැස්වීම සිරිතය. එසේම, එකල අසන්නන්ගේ ඉල්ලීම් සඳහා රණවිරුවන් නිරන්තරව පෝස්කාඩ්



යොමුකිරීම පුරුද්දක් ලෙස සිදුකළේය. එලෙස ගීත ඉල්ලන වැඩසටහන් සඳහා ඇතැම් රණවිරුවන් දිගින් දිගටම පෝස්ට් කාඩ් යොමුකිරීම නිසා ඔවුන් එම වැඩසටහන්වල යාවජීව සාමාජිකයින් බවට පත්ව බොහෝ දෙනකුට ඔවුන්ගේ නම් පවා මතක තිබිණ ("ගාමා ගාමිණී සුබසිංහ" එලෙස අදටද මතක නමකි). එසේම, රණවිරුවන්ට සුබපතා ආශීර්වාද කරන වැඩසටහන් ද එකල ශ්‍රී ලංකා ගුවන්විදුලිය ඔස්සේ නිරතුරු විකාශය විය. ඒවා රණවිරුවන්ගේ හදට කතාකරන ළෙංගතු වැඩසටහන් වීම නිසාම දහස් ගණන් රණවිරුවෝ ඒ වටා රොදබැඳගත්හ. එසේම හුදෙකලා, කර්කශ පරිසරයේ ජීවිත සමඟ සටනක නිරත රණවිරුවන්ට එමඟින් ලද සැනසීම හා අස්වැසිල්ල කියා නිමකළ නොහැකි තරම්ය.

යුද බිම තුළ කුමන දුෂ්කරතා, අපහසුතා අතරේ වුව අත්නොහැරි එකම දෙය පුද්ගලික අවියයි. (මෙය බොහෝවිට T-56 වර්ගයේ විය).

තැනකින් තැනකට ගමන් කරද්දීත්, කෑම කනවිටත්, දියනාන විටත්, වැසිකිලියට ගියත් එය අතපොවන මානයේ තබාගැනීම එකල අනිවාර්ය විය. සාමූහිකව ද, තනි තනිව ද ජීවිත රැකුනේම ඒ නිසාමය. එලෙස ගිනි අවිය තම සමීපතම සහකරු බවට පත්කර ගැනීමට ඕනෑම යුද භටයකුට හුරුකරවනුයේ සිය පුහුණු කාලයේ සිටය. අවිය අමතකවීම, නිසි පරිදි ශුද්ධ පවිත්‍ර නොකිරීම, නිවාඩු යනෙන අවස්ථාවල එය නිවැරදි ආකාරයට භාරදීම් කරගැනීම සිදුනොකිරීම, අනාරක්ෂිත පරිහරණය, ඊට නිසි ගෞරවය නොදැක්වීම ආදී විවිධ හේතු අරභයා දඬුවමක් නොවිඳි අයෙක් හමුදාවක නොමැත. මෙහි උච්චතම දඬුවම් හිමිවන අවස්ථාව වනුයේ ආධුනික වෙඩි තැබීම් සිදුකරද්දීය. එනිසාම පුද්ගලික අවිය ළඟතබා ගැනීම, බූට් පැළඳීම, හෙල්මට් දැමීම ආදිය අධි ක්‍රියාන්විත පෙදෙස්වල එකල අනිවාර්ය අවශ්‍යතාව වූ අතර, ඇතමෙකුට එය එකල වදයක් සේ පෙනුන ද විශ්‍රාම ලබන තෙක්ම යුද බිමෙහි යහතින් දිවි ගෙවීමට එම දැඩි කොන්දේසි සැමටම උපකාරී වූ බව අත්දැකීම් ඇත්තෝ දනිති.

යුද පිටියේ දී අවිය හා බිරිඳ අතර ඇත්තේ අසීමිත බැඳීමකි. හමුදා පුහුණුවේ දී අවිය තම බිරිඳ සේ සුරැකිය යුතු බවට උගන්වයි. එසේම, බිරිඳ සේම අවිය ද තනි නොකිරීමටත්, අන්සතු නොකිරීමටත්, ආරක්ෂා කිරීමටත් වැඩිදුරටත් උගන්වයි. එනිසාම, ක්‍රියාන්විත පරිසරයේ යුද සෙබළෙක් රැයක් පහන්කරන ලද්දේ තම බිරිඳ සේම අවිය තුරුළුකර ගනිමිනි. ඇඳක, ලී අට්ටාලයක, කැළෑවක හෝ ඕනෑම බිමක නිදාගත්ත ද තම අවිය පපුව මත හෝ අත ගෑවෙන තැනක තබාගැනීමට කිසිවකුත් කිසිවිටක අමතක නොකළේය. අවිය තම බිරිඳ මෙන් ළඟ තබාගත යුතු යැයි කියමනක් සැදී තිබුණේ ද ඒ නිසාමය. සමස්තයක් ලෙස අවිය හා බිරිඳ යන දෙකම පන සේ සුරැකි රණවිරුවෝ බහුතරයක් අතර අවිය පමණක් රැක බිරිඳ නොරැකි රණවිරුවන් ද, රණවිරු ස්වාමියා නොතැකූ බිරින්දෑවරු ද එකල යුද සමයේ නොසිටියා නොවේ.

(ඉතිරි කොටස ලබන කලාපයේ)




ලුතිනන් කර්නල්
සුජිත්
චමින්ද
එදිරිසිංහ




**මෙහි දිගහැරෙනුයේ කෙඩෙට් පාඨමාලා කාලයේ ඉපැරණි සුන්දර මතක අවුස්සන "කැඩ්ඩන්ගෙ කතා" ය. නිත්‍ය ස්වෙච්ඡා පිරිමි කාන්තා මේ සෑම කෙඩෙට් පාඨමාලාවකදීම ඔබ අත්විඳි නොඑසේනම් ඔබගේ දෑස් ඉදිරිපිට ආසන්නම සගයා අත්විඳි රසබර තොරතුරු අපවෙත ලියා එවන්න. මේ පිටුව ඒ වෙනුවෙනුයි.**

*මෙම කතාව 2011 වර්ෂයේ නිත්‍ය කෙඩෙට් නිලධාරී පාඨමාලාවකට සම්බන්ධ සිදුවීමකි.*

# සුනබයකු කළ හදියක්

කෙඩෙට් නිලධාරීන් 50කට අධික පිරිසක් සිටි අප පාඨමාලාවේ අපූරු මතකයන් රැසක් පිරුණු කාලවකවානුවකි. උදෑසන සරඹ පුහුණුව අප සිත් තුළ එකල ඇති කළේ, බියත් ඒ හා සමානවූ අලස හැඟීමකි. එයට ප්‍රධානම හේතුව වූයේ සරඹ පුහුණුව තුළ දැඩි විනයක් නිසි පුහුණුවත් දශමයක හෝ වැරැද්දක් නොවන අන්දමට සරඹ උපදේශකවරුන් විසින් නිරීක්ෂණය කරමින් පොඩි අතපසුවීමකට පවා දඬුවම් ලබාදීම තුළ ඇතිවන බිය නිසාමය. අප එදින උදෑසන ශාරීරික අභ්‍යාසවලින් පසුව උදේ ආහාර ද ගෙන නියමිත වේලාවටත් මිනිත්තු කිහිපයක් තිබියදී සරඹ භූමිය වෙත දිව ගියේ, එදින අලුයම අප සගයන් කිහිපදෙනකු සරඹ භූමිය අස්පස් කොට ඒ සියල්ල හොඳින් අවසන් කළ සතුටත් සමඟය. අප සියල්ල සරඹ භූමියට පිවිසෙන මාර්ගයේ සිට උපදේශකයින්ගේ උපදෙස් අනුව පුහුණුව සඳහා භූමියට පිවිසෙත්ම දුටු දසුනින් අප සිත් තිගැස්සීමකට ලක්විය. එනම්, සියල්ල පිරිසිදු කළ, සැකසූ සරඹ භූමියේ පිවිසෙන තැනම සුනබයකු මලපහ කර ගොස් තිබීමය. තවද, එය පැවතියේ එසේ මෙසේ ආකාරයට නොවය. කෙසේ වෙතත් එහි වගකීම අපහට පැවරුනේ නිසි ලෙස පිරිසිදු නොකිරීමේ, වැරැද්දත් සමඟය. සිදුවූයේ අපූරු දඬුවමකි. මුල් පෙළේ සිට එම මලපහ සියල්ල අතටගෙන අන්තිමයා තෙක් අතින් අත හුවමාරුකර ගනිමින් භූමියෙන් ඉවතට විසි කිරීමය. එහිදී, ඇතිවූ අප්‍රසන්න හැඟීම එම සිදුවීමෙන් වසර 14ක් ගෙවී අදද එලෙසින්ම පවතී.






*2012 වර්ෂයේ කෙඩෙට් පාඨමාලාවක් සම්බන්ධ සිදුවීමකි.*

# අපූරු වෙස්වලා ගැනීම

කෙඩෙට් පුහුණුවේ එක් අදියරයක් ලෙස යුද භූමියේදී වෙස් වලාගැනීම තරමක් විනෝදජනක පුහුණුවක් වන අතර, එහි ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට නරියා කන්දෙහි අදාළ ස්ථානයන්හි ස්ථානගතවන්නට මෙම පාඨමාලා සාමාජිකයින්ට සිදුවිය. සමහරක් කොළ අතු, වැල්, ආදිය පමණක් නොව අතට හසුවන ස්වභාවික දෑ සියල්ල සිය ශරීරයේ රඳවාගෙන සැඟව සිටීමට කටයුතු කරන අතර, මෙකී කෙඩෙට් නිලධාරියාත් ඔහුගේ යාබද සගයාත් ලෙහෙසි පහසුවෙන් සොයාගත නොහැකි තැනක සැඟවිය. කිසිදු කෙනකුගෙන් හාවක් හූවක් නැත. ඒ ඇසිල්ලට අවියද තුරුළුකරගත් කතානායකයාට ඇස් පියවුනේ දින කිහිපයකට පෙර සිට හරියාකාර නින්දක් නොලැබීම නිසාම විය.



කිසිදු බාධාවකින් තොරව නින්දගිය ඔහුට ඇහැරුණේ මලා මෙන් ගිය නින්දකින් පසුවය. නැඟිට බලනවිට කිසිදු සගයකු අසළකවත් නොවීය. හෝරාවක් පමණ ගතවී ඇති බව වැටහුණු මම කඩාබිඳගෙන ඉදිරියට යනවිට, සියලු දෙනා අභ්‍යාසය අවසන්කර පෝළිම් වී සිටි දුටු ඔහුට ඉහ මොළ රත්විය. "ආ මහත්තයා නින්ද සැපද?" යනුවෙන් පාඨමාලාවේ නිලධාරී සැරෙන් ඇසූ ප්‍රශ්නයට ඔහු නිරුත්තර විය. "කෙඩෙට් කෙනකුට ඔහොම පැයත් හමාරක් නිදාගෙන මදිනෙ. යනව අර වලට බැහැල තව ටික වෙලාවක් නිදාගන්නව" උපදේශකවරයා ඒ අසළ වූ සීතල දියපිරි වතුර වලක් පෙන්නුවේය. අදාළ කෙඩෙට් නිලධාරී ඊට බසින්නට වූයේ වෙව්ලමිනි.



## මුලතිව් ප්‍රහාරයට වසර 29 යි...

මූසල ලෙස බෑසගිය මළහිරු
අනෝරා වැහි එක්ක නිසොල්මන් රාත්‍රියේ
ඇසුණි වෙඩිමුර සතර දිසාවෙන්
එකාවන්ව එක පෙළට ගැසීපෙළ පෙරමුණට
නැසුමට සතුරු බල
ගෙන කරට කර එඩි බවක්
එදා ඒ යුධ බිමේ එකා පිට එකාවන්
වැටි වැටී එක පෙළට තෙත් කලා රුධිරයෙන්
විසුණු වූ සිරුරින් නැත කෙනෙක් ළංවුණේ
වරුසා වෙඩි මැද සතර අත මුර කපොලු
සතුරු ග්‍රහණයට වැද ප්‍රාණ ඇප කරුවෝ විය
යුධට වැදි විරු පිරිස
දෙමව්පිය දූ දරුවෝ ඉනේ ඉහඅත් බදා
දුවති හිස හැරුණ අත උණු කඳුළු වගුරමින්
අහෝ සමහරු නික්මුනා අගුලු කළ පෙට්ටියෙන්
ඇතුරුදන් ඇතුරුදන් ඇසෙන විට නන් දෙසින්
නොතේරෙයි මට තවත් හිතාගනු බැරි ලෙසට
ගත වුණා කාලයක් නොදුටුවෙමි හුරු රුවට
ලදිමි ඒ වෙනුවටම මරණයේ සහතිකය

ගංගා නිරෝෂනී



## සෙබළ බිරිඳකගේ හද හැස්ම...

රට රකින්නට අවි අරන් නුඹ
උනා යුද සෙබළකු ඉතින්
හමුවුනා මේ සසර හුරුවිට
බැඳුණා අපි හරි ආදරෙන්...

ඇතිනතත් ගෙන බොහෝ දුර
පියමැනන් ඇවිදින් දැන් ඉතින්
සැමියා යුද සෙබළකු විලස
රට රකී තවමත් අදරෙන්...

බොහෝ තැන්වල දැනුන
තනිකම
දරා ගත්තා සෙනහසින්
කඳුලු බිඳු ඔබටත් හොරෙන්
මගේ
නෙතින් වැටුනා සත්තකින්...

ඒත් රන්කඳ මයේ අත ගත්
සෙබළ හිත තුළ ඇති පෙමින්
ආදරෙන් මඟ බලන් ඉන්නේ
එන තුරා නිවසට ඉතින්...

එස්.යූ. තරංගි

# සෙබළ සිතුවිලි



## මව වෙත ලියමි...

***නිමිත්ත - 2025 ජූලි මස 17 වන දින කුරුණෑගල, මාවතගම වෙල්යායක අතහැර ගොස් තිබූ දිනක් වයසැති බිළිඳියක සොයා ගැනේ.***

ඇඳුර ගිහින් හිරු ටික ටික ළංවෙනවා
කිච් බිච් හඬ හතරවටින් රැව් දෙනවා
උණුහුම නැතිව ගත සිත දෙක සලිත උනා
අම්මා අහළ පහළක නැත මට දැණුනා

ආවා කෙනෙක් බැලුවා මං ඉන්න දෙස
දිව්වා යකෙක් දැක්කා සේ පසුපසට
තණ කොළ පොළව තෙත ගතියට
තියෙනකොට
උණුහුම වටිනවා අම්මගෙ මහමෙරක

ආවේ පොලිස් නිලධරයින් හනි හනික
ගත්තේ කෙනෙක් රෙදි කඩකට එක මිටට
දාලලු අනේ කිරි දරුවෙක් කුඹුරකට
ඇහැණා මටත් කොඳුරනවා හිටපු අය

කුඹුරක් මැද තනි කෙරුවේ ඇයි අම්මේ
දියණිය නොවෙද අතහැර මා මේ භවයේ
කහටක් හිතේ තරහක් නැත දුවගෙ හිතේ
හිතුනොත් එන්න ආදරයක් නැවත අනේ

සෙ/753797
කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඑච්එම්
ජනමාධ්‍ය හා මව්මෙ අම

## ත්‍රී මල්ෂා ලා...

තරුණ ළඳුන් ත්‍රී මල්ෂා ලා - වේරහැරදී හමුවුවයි
නම් එක පටබැඳුනද - තිදෙනා තුන් ආකාරයි
පෙළින්ළෙටපවසම්තතු-දැනුනෙපෙනුනෙඒලෙසටයි
දොසක්නැතුවවිඳින්නරස-අරමුණපබැඳුමපමණයි

මුලින්ම දුටු එක මල්ෂා - ටිකක් කළුයි හරි කෙට්ටුයි
සැමදෙන හා සුහද බවයි - සිනහවකින් මුව සරසයි
කඩිසර ගතිපැවතුම් ඇති - කෙල්ල හරිම අහිංසකයි
අන්තිමේදී ඉතුරු වුනේ - කවුද කියා ඔබට දැනෙයි

දෙවැනි මල්ෂා හමුවූයේ - ටික දවසක් ගිය පසුවයි
ගෞරවයට බිය වූ නෙත් - සඟවා මා දෙස බැලුවයි
ටිකක්මිටියිහුරුබුහුටියි-කෙල්ලතවමළඳබොළඳයි
හිටිය ගමන් යන්න ගිහින් - මා දන්නෙත් ගිය පසුවයි

උසයි සුදුයි කොණ්ඩෙ දිගයි - දුටුවන්ගේ මන පිනවයි
සිත්ගත්මගෙතෙවැනිමල්ෂා-පිරිපුන්ගතහරිමහැඩයි

හිමිදිරි මහ දවල් සවස - මුව හසරැල් නංවාලයි
මුතුවන් ඇගෙ දසන් දෙපෙළ - විඩාව සංසිඳුවාලයි
පසුකර ගිය සෑම තැනම - ආපසු හැරිලා බැලුවයි
ඇයත් ඉතිං යන්න ගියා - රඳවාලනු බැරි පාටයි

තෙයාකාර ත්‍රී මල්ෂා ලා - එකම වහළ යට දුටුවයි
තිදෙනාටම බායි කියා - මමත් යන්න යනවාමයි

කපිතාන් (උපා) ඩීඑම් සමරකෝන්
උපකරණ පාලන නිලධාරි
1 ශ්‍රීලයුවෙබ

## අම්මා සමුගත්තාය...

ඔබෙන් වෙන්වී එන්න
සමුගතිමු සිඹ නළල
ඔබ අපෙන් සමුගත්ත
දිනේ අපි විදෙස්වල

ඔබටවත් නොදැනීම
හුස්ම ටික යන්න ඇති
දුක් නොවිඳ මරණයක්
ඔබ පතා එන්න ඇති

උණුසුමට තිබූ දෑත්
සීතලට තියෙන්නැති
ඔබ ළඟට වී ඉන්න
අපට පින් නැතුව ඇති

දරා අප බර කුසේ
අපට දුන් ජීවිතේ
අම්මෙ අප උරහිසේ
ඔබව රැඳුනේ නැතේ

අන්තිමට දුටු විලස
ඔබව නිරතුරු පෙනේ
දැනෙයි අම්මා ළඟින්
ඉන්නවා පා සෙනේ

සෙ/ක්‍යු106061
ලාන්ස් කෝප්‍රල් කුමාර
ඩබ්ලිව්එම්ඒ
16 ශ්‍රීලංජාආබමු




## හතරේ පහරක්...

දරු ප්‍රසූතියට ආසන්නව පුද්ගලික රෝහලේ සිටින බිරිඳ ගැන විමසීමට ඔහු රෝහලට ටැලිපෝන් කළේය.

“කොහොමද ඩොක්ටර්”

“හරි හරි මේ දැන් හම්බවුණා”... යැයි දොස්තර රූපවාහිනියෙන් ක්‍රිකට් තරගය නරඹන ගමන් උත්තර දුන්නේය.



එවිටම ක්‍රීඩකයෙක් හතරේ පහරක් ගැසුවේය.

“හතරයි” ඔහු තම සතුට ප්‍රකාශ කළේය...

සැමියා සිහි නැතුව ඇදගෙන වැටුණේය...

## පන්සිල් කැඩීම...

තම ඉලන්දාරි පුත්‍රයාගේ නොමනා කල්ක්‍රියාව පිළිබඳ කලකිරුණු පියා ඔහු අමතා මෙසේ ඇසුවේය...

**පියා-** පුතේ... උඹ දන්නවද පන්සිල් පද පහක් තියෙනව කියලා...

**පුතා -** ඔව්



**පියා -** ඒකෙන් එකක් හරි කැඩුවොත් වෙන්නෙ මොනවද කියල උඹ දන්නවද?

**පුතා -** ඔව්

**පියා -** මොනවද වෙන්නේ...?

**පුතා -** තව හතරක් ඉතුරු වෙනවා...


# රණවිරුවා





**අධීක්ෂණය**

බ්‍රිගේඩියර්
ඩබ්ලිව්එස් ගමගේ ආර්එස්පී යූඑස්පී එන්ඩීසී
පීඑස්සී



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල්
එච්වීකේඩබ්ලිව් අබේවික්‍රම
යූඑස්පී අයිජී



**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ



**සහය සංස්කාරක**

කපිතාන්
එච්ජීජේ හවන්ති

**පරිගණක අකුරු සංයෝජනය,**
**කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 බනි II සේනාරත්න ජීසී - 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඒඑම් - 11 ඉසේරෙ

**ඔබේ නිර්මාණ, අදහස් හා යෝජනා එවිය යුතු ලිපිනය**

“රණවිරුවා”
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
අකුරේගොඩ පාර,
බත්තරමුල්ල.

**ඊමේල්**
dtemedia&psyops@army.lk
ranaviruwa@yahoo.com


**දුරකථන**
011 2993076

**යුහ දිගුව**
51445 / 51446 / 51447

**“රණවිරුවා” අන්තර්ජාලය ඔස්සේ කියවීමට**

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය

## ඔබේ නිර්මාණ අපට එවන්න

සමස්ත යුද්ධ හමුදාවම නියෝජනය කරන එකම සඟරාව වන “රණවිරුවා” වසර ගණනාවක පටන් අඛණ්ඩවම ඔබ අතට පත්කෙරේ. යුද්ධ හමුදාව තුළ සිදුකෙරෙන විශේෂිත සිදුවීම් මෙන්ම ක්‍රීඩා, සාහිත්‍යය, අධ්‍යාපනික, විදෙස් හා ඉතිහාස තොරතුරු වඩා විචිත්‍රවත් ලෙස හා හරවත්ව එළිදක්වන රණවිරුවා ඔබගේ දැනුම හා රසාස්වාදය පිණිස මාහැඟි පිටිවහලක් වී ඇති බැවි අප වෙත නිරතුරුව ලැබෙන ලිපි හා ඇමතුම් මගින් සනාථ වේ.

එහෙත් විවිධ අංශ අපව වෙත ලිපි සහ නිර්මාණ යොමුකළද යුද්ධ හමුදාවේ ඇතැම් ආයතන වෙතින් තොරතුරු ලැබෙනුයේ ඉතා අල්ප වශයෙනි. එනිසාම යුද්ධ හමුදාව තුළ සිදුකෙරෙන බොහෝ ක්‍රියාකාරකම් පිළිබඳව සෙසු අය දැනුවත් නොවන තත්ත්වයක් පවතී එබැවින් ඔබගේ ඒකකයේ, රෙජිමේන්තුවේ, බලසේනාවේ, පුහුණු පාසලේ හෝ කුමන ස්ථානයක වුවද සිදුවන විශේෂ වැදගත්කමින් යුත් තොරතුරු ඇත්නම් අපවෙත යොමු කරන්න. අප ඒවා අප්‍රමාදව රණවිරුවාහි පළකිරීමට කටයුතු යොදා ඇත. එසේම, රණවිරුවා යුද්ධ හමුදාවට පමණක් සීමා නොවන්නකි. බාහිර පාඨකයන්ගේ ලිපි, නිර්මාණ, ඡායාරූප හා කාලීන තොරතුරු වෙනුවෙන්ද එහි නිරතුරු ඉඩකඩ වෙන්කොට ඇති බව සතුටින් දැනුම් දෙන්නෙමු. මාසිකව නොමිලේ ඔබ අතට පත්වෙන රණවිරුවා සඟරාව මඟින් පාඨක ඔබගේ නිර්මාණශීලී හැකියාවන් වැඩිදියුණු කර ගනිමින් දැනුම හා තොරතුරු බෙදාහදා ගැනීමට එකතුවන්න.

– සංස්කාරක

# “විරු දෑතින් රන් වියමන්”

යක්කල “රණවිරු ඇපරල්” ආයතනය යනු යුද්ධ හමුදාවේ මැහුම් කරුවන්ගේ තෝතැන්නයි. අව් දැරූ දෑත්වලින් විසිතුරු මවන විරු කැළක් යුද්ධ හමුදාවට ද සමස්ත රටට ද එමඟින් ලබාදෙන නිෂ්පාදන දායකත්වය සුළුපටු නොවේ. ගතවූ දශක කිහිපය තිස්සේ යුද්ධ හමුදාවේ මැහුම් අවශ්‍යතා සපුරාලමින් එතෙක් පිටස්තර ආයතන වෙත ඇදීගිය විශාල මුදලක් ඉතිරි කොට හැඩකාර හමුදා සාමාජිකයින් බිහිකරලීමට ඔවුන් සමත්ව ඇත්තේ තම හැකියාවන්ට සීමා මායිම් නොමැති බැව් සිහිගන්වමිනි.

එදවස යුදබිමෙහි සටන් වැද ආබාධිත සහිත වූ රණවිරුවන් යළි නිෂ්පාදන ප්‍රවාහයට දායක කරගනිමින් වෘත්තීය මාර්ගෝපදේශ ලබාදෙමින් ඔවුනගේ පුද්ගලික ජීවිතයට ද සවියක් ලබාදීම රණවිරු ඇපරල් හි අරමුණයි. මෙවර “රණවිරුවා” හි පසුකවරය වෙන් වෙනුයේ හමුදාවේ ගෙත්තම්කරුවන් වූ එම “රණවිරු සන්නාලියන්” වෙනුවෙනි.









ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල.